# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්  www.budusarana.lk  email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ ඇසළ අමාවක පෝ ද, 2021 අගෝස්තු 08 ඉරිදා BUDUSARANA SUNDAY AUGUST 08, 2021


56 කාණ්ඩය, 07 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 20  මිල රු. 40.00




භාරද්වාජ බමුණා ප්‍රසාදයට පත්වීම







# බණ පොත හැඩ කළ

# අපේ පුරාණ පුස්කොළ පොත් සිතුවම් කලාව



**පුරාණ ලක්දිව සිතුවම් කලාව පිළිබඳව අවධානය යොමුකරන විට බොහෝවිට කතිකාවට ලක්ව ඇත්තේ ගල් ලෙන් හෝ මැටි වරිච්චි හෝ ගඩොල් බිත්ති මත ඇඳින ලද සිතුවම් පිළිබඳව පමණක් බව පෙනේ. එම නිසාවෙන් පුස්කොළ පොත් සිතුවම් කලාවක් පුරාණයේ පැවැතියේ ය යන්න පවා සාමාන්‍ය ජනතාව අතර ප්‍රචලිත ව නොමැත. අනුරාධපුර යුගය හා පොළොන්නරු යුගයන් තුළ දී පුස්කොළ පොත් මත සිතුවම් ඇඳි බවට පුරාවිද්‍යාත්මක හෝ සාහිත්‍ය මූලාශ්‍ර සාධක නොලැබේ. සංක්‍රාන්තික අවධියේදී කරන ලද පුස්කොළ පොත් කිහිපයක සාධක ලැබී ඇති අතර මහනුවර යුගයේදී ඇතිවූ ලේඛන ප්‍රබෝදයත් සමග මෙම කලාව වර්ධනය වී ඇති බව පෙනේ.**

පුස්කොළ පොත් සිතුවම් කලාව ප්‍රධාන කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකි අතර ඒවා නම් පුස්කොළ පොත් කම්බ සිතුවම් හා පුස්කොළ පිටපත් සිතුවම් ලෙස ය. දඹදෙණියේ දෙවැනි පරාක්‍රමබාහු රජුගේ කාලයේදි කරනු ලැබීයැයි සලකන චුල්ලවග්ගපාලි පුස්කොළ අත්පිටපතේ පොත් කම්බයේ බහුවර්ණික රූප සටහන් දක්නට ලැබේ. එසේම මෙම අවධියේ ම කරන ලද සාරත්ථදීපනී විනය ටීකා පුස්කොළ පොත් කම්බයේත් ඒකවර්ණ සිතුවම් දක්නට ලැබෙන බව සෝමතිලක මහතා පෙන්වා දෙයි. පුස්කොළ පොත් කඳම්බයන්හි සිතුවම් නිර්මාණ ක්‍රමයක් පැවැති අතර මේ පිළිබඳව අපූර්වතම විග්‍රහයක් ආරිය ලගමුව මහතා ඉදිරිපත් කර තිබේ. පොත්කම්බා විසිතුරු කිරීම සඳහා කැටයම් සහිත හෝ කැටයම් රහිත හෝ යන කම්බා වර්ග දෙකොටසේ ම ස්වභාවික වර්ණ භාවිතයෙන් හෝ ලක්ෂා භාවිතයෙන් සිතුවම් කිරීම විශේෂ ලක්ෂණයකි. කැටයම් සහිත කම්බාවල පිටත ස්ථරය සිතුවම් කරන ලද්දේ අල්ප වශයෙනි. එය ද සිතුවම් කිරීමක් නොව කැටයමට ගැලපෙන පරිදි එහි වර්ණ ගැන්වීමයි.

කැටයම් රහිත අන්දම ඉතා විසිතුරු ලෙස විවිධ මෝස්තරවලින් අලංකාර කර තිබේ. ඇත්දත්, ලෝහ හා පුස්කොළ යන ද්‍රව්‍යවලින් නිර්මාණය කළ කම්බා ද සිතුවම් කර ඇති අතර දැව කම්බා බහුතරය සිතුවම් කර ඇත. මෙම කම්බාවල සිතුවම් වැඩ පුස්කොළ පොත් නිර්මාණ ශිල්පීන් විසින්ම කරන ලද බව සිතිය හැකි අතර ලාක්ෂා ශිල්පීන් හා සිත්තරුන් විසින් ද කරන්නට ඇති බවට මත තිබේ. ඒ බව එස්.පී චාර්ල්ස් මහතා ද සඳහන් කර තිබේ.

පොත් කම්බාවල වර්ණ භාවිතයෙන් සිතුවම් ඇඳිමේදී විවිධ තෙලිකූරු භාවිත කර ඇති අතර ලාක්ෂා භාවිතයෙන් පොත් කම්බා අලංකාර කිරීමේ දී නියපොතු වැඩ නැමැති ශිල්ප ක්‍රමය අනුව අතින් සිදුකර ඇත.

පුස්කොළ පොත්කම්බා මත පමණක් නොව එහි අන්තර්ගත පුස්කොළවල ද සිතුවම් ඇඳිමේ තාක්ෂණය එකල සිත්තරුන් දැන සිට ඇති අතර පොත්කම්බාවල සිතුවම් සිත්තරුන් විසින් කරන්නට ඇතැයි අනුමාන කළහැකි වුව ද පුස්කොළ මත කරන ලද සිතුවම් එම පුස්කොළ ලියන ලද පිරිස්ම කරන්නට ඇතැයි ද සිතිය හැක. එහෙත් සිතුවම් ඇඳීම සඳහා අවශ්‍ය ඉඩකඩ තබා පුස්කොළ ලියන්නන් එය ලියා සිතුවම් ඇඳීම සිත්තරුන්ට පැවරුවා ද විය හැකි ය.

මෙම සිතුවම් නිර්මාණයේදීදියුණු තාක්ෂණික ක්‍රමවේදයන් භාවිත නොකළ ද එය ඉතාමත්ම සංකීර්ණ කාර්යයක් වූවාට සැක නැත. මෙරට පුස්කොළ පොත්වලින් අතළොස්සක් හැර සියල්ලම පාහේ වර්ණවත් සිතුවම්, මෝස්තර රටා සහ විවිධ කැටයම් වැඩ වලින් අලංකාර කළ පොත් කම්බාවලින් සමන්විත වේ. එහෙත් පුස්කොළ පොත් ප්‍රමාණයට සාපේක්ෂ ව පුස්කොළවල අඳින ලද රූප සටහන් හා චිත්‍ර ඉතා අල්ප බව පෙනේ. බිත්ති, සෙල්පුවරු, පෙතිකඩ, දැව, කැන්වස්, කඩදාසි වැනි පුළුල් පසුතලයක් සහිත ද්‍රව්‍ය මත අඳින ලද සිතුවම් වලදී ශිල්පියාට අවශ්‍ය පරිදි රූපවල ප්‍රමාණය නිශ්චය කරගත හැකි ය.

එහෙත් පුස්කොළවල සිතුවම් ඇඳිමේදී පසුතලය ඉතා සීමිත ය. එම සීමිත පසුබිම තුළ විශාල චිත්‍ර ඇඳිමේ නිදහසක් නොවීය. එබැවින් මේ රේඛා චිත්‍ර ඉතා කුඩා ප්‍රමාණයේ චිත්‍ර කලාවක් ලෙස හැඳින්විය හැකි ය. මේවා බොහෝදුරට ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍යයේ හෝ බෙංගාලයේ පාල රාජ වංශයේ පාලන යුගයේ (ක්‍රි.ව. 11 වන සියවසේ) "ලඝු චිත්‍ර" (එසබස්එමරු) කලා සම්ප්‍රදායට සමාන ය.

එසේම පසුබිම් සැකැස්ම මහනුවර යුගයේ චිත්‍ර කලා සම්ප්‍රදායට සමාන වේ. මෙම යුගයේ විහාර දේවාලවල බිතුසිතුවම් පටු තීරුවල අඛණ්ඩකථන ක්‍රමයට නැතහොත් රාමු ලෙස බෙදන ලද කුඩා පසුබිම් වල ඇඳ තිබේ. මෙම ක්‍රම දෙකම පුස්කොළ පොත්වල රේඛා චිත්‍ර සඳහා ද අනුගමනය කර ඇත.

මේ අනුව පැහැදිලි වන කරුණක් වන්නේ විහාර චිත්‍ර කලාව පුස්කොළ පොත් චිත්‍ර කලාවට බලපා ඇති බවයි. ඒ අනුව විහාර බිතුසිතුවම් නිර්මාණ තාක්ෂණය මෙන්ම පුස්කොළ රේඛා සිතුවම් නිර්මාණ තාක්ෂණය ද එකල සිත්තරුන් මනාව ග්‍රහණය කරගෙන තිබූ බවට අනුමාන කළ හැකිය. පුස්කොළ රේඛා චිත්‍ර ඇඳීම සඳහා භාවිතකර ඇත්තේ පන්හිඳ පමණී. ජ්‍යාමිතික මෝස්තර රටා සඳහා පමණක් කොම්පාසුව, කෝදුව හා කවකටුව භාවිතා කරන්නට ඇත. පන්හිඳ පමණක් භාවිතයෙන් චිත්‍රයක් ඇඳිම අති දුෂ්කර කාර්යයක් වන අතර එසේ අඳින ලද කිසිවක් නැවත මැකිය නොහැකි ය. එබැවින් පන්හිඳෙන් අඳින ඉරි කැබැල්ල පවා ඉතා සූක්ෂම ලෙසත් අලංකාරවත්ව ඇඳිය යුතුවේ. ඒ සඳහා මෙම සිතුවම් කලාව පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යයක් ද, කුසලතාවයක් ද, පුහුණුවක් හා දැනීමක් ද ශිල්පියාට තිබිය යුතු ය.


බොහෝ විට මෙම සිතුවම් තනි වර්ණයකින් සමන්විත වන නමුත් බොරලැස්ගමුවේ ධම්මදස්සී විහාරයේ සූවිසි විවරණය හා වෙස්සන්තර ජාතකය අඩංගු වී තිබෙන පුස්කොළ පොතේ උඩරට බිතු සිතුවම්වලට සමාන ලෙස රූප එක වර්ණයකින් ද පසුබිම වෙනත් වර්ණයකින් ද නිරූපණය කර ඇත.

මේ අනුව වර්ණ කිහිපයකින් චිත්‍රණය කරන ලද පුස්කොළ පොත් පැරැණි යුගයේ තිබෙන්නට ඇති බව අනුමාන කළ හැකි ය. එහිදී පළමුවෙන් චිත්‍ර ඇඳ ඒවා වර්ණ ගන්වා පසුව පසුබිම වර්ණ ගැන්වීමේ තාක්ෂණික ක්‍රමයක් ඒ සඳහා භාවිත කරන්නට ඇත. නමුත් බහුලව හමුවන්නේ ඒකවර්ණ පුස්කොළ සිතුවම් වන අතර මෙම සිතුවම් දැකගත හැක්කේ කළු මැදීමෙන් අනතුරුව ය. මේ අනුව පෙනීයන්නේ බහුලව සාධක නොලැබුණ ද සාමාන්‍ය ජන සමාජයේ ප්‍රචලිත නොමැතිවුව ද අපේ පුරාණ සිත්තරා ලේඛන කලාව තුළද තමන්ගේ සෞන්දර්ය ප්‍රකාශනය දිගහැර ඇති බවයි.

> **පන්හිඳ පමණක් භාවිතයෙන් චිත්‍රයක් ඇඳීම අති දුෂ්කර කාර්යයක් වන අතර එසේ අඳින ලද කිසිවක් නැවත මැකිය නොහැකි ය. එබැවින් පන්හිඳෙන් අඳින ඉරි කැබැල්ල පවා ඉතා සුක්ෂම ලෙසත් අලංකාරවත්ව ඇඳිය යුතුවේ.**

කේ. උදේනි අරුණසිරි

# මිනිස් ලොව උපන් පමණින් මනුෂ්‍යයෙක් වියහැකි ද?



අමරපුර කල්‍යාණිවංශ නිකායේ
මහාලේඛකාධිකාරී (වැබ.)
ගිංතොට ශ්‍රී ථූපාරාම
රාජමහා විහාරාධිපති
විද්‍යානිධි පණ්ඩිත
**අම්බලන්ගොඩ
සුමේධානන්ද හිමි**

නමෝතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**දුල්ලභො භික්ඛවෙ මනුස්සත්ත පටිලාභො
කිච්චො මනුස්ස පටිලාභො –
කිච්චං මච්චාන ජීවිතංති.**

මනුෂ්‍යයාගේ ස්භාවය තමයි මිනිසත්බව කියලා කියන්නේ.

කිච්චො මනුස්ස පටිලාභො කියන බුද්ධ වචනය දිහා විමසුම් නුවණින් නැවත නැවතත් බලනවිට අපිට පේනව, නිරය, තිරිසන්, ප්‍රේත, අසුර, අරූප, අසංඥතල, පිටසක්වල ආදීතැන්වල නොඉපිද, පංච ඉන්ද්‍රියන්ගේ විකලත්වයක් නැතිව, මිථ්‍යාදෘෂ්ටිය, අබුද්ධොත්පාද කාලය කියන අෂ්ට දුෂ්ටක්ෂණ කාලයෙන් මිදිලා, බුද්ධෝත්පාද කාලයකම අපට ඉපදෙන්නට ලැබීම කොච්චර වාසනාවක් ද කියල.

මිනිසත්කම ලැබීම ලෝකයේ අතිශය දුර්ලභ කරුණක් බවයි ධර්මයෙහි සඳහන් වෙන්නේ. එයිනුත් ඇස් කන් ආදී ඉන්ද්‍රියන්ගේ විකලත්වයක් නැති වාසනාවන්ත මිනිස් ශරීරයක් ලැබීමත් ඉතා දුෂ්කර දෙයක්.

බොහෝ අයට මිනිසත්කමේ අගය නොදැනෙන්නේ, නොපෙනෙන්නේ ලෝකයේ බොහෝ මිනිසුන් දකින්නට ලැබෙන නිසයි.

බුදු, පසේබුදු, මහරහත් බව ලබන්නට වුවත්, බඹ, සුර, මිනිස් සැප ලබන්නට වුවත්, උපකාරීවන කුසල් දහම් රැස්කර ගන්නට පුළුවන්කම ලැබෙන්නේ මනුෂ්‍ය ලෝකයේ ඉපදීමෙන් පමණයි.

නිරා දුකට පත්වෙලා, ඝොරතර වූ දුක් විඳින කාලයක හරි, තිරිසන් අපායේ ඉපදිලා අනන්ත හිරිහැරවලට ලක්වෙමින් දුක් විඳින කාලයක හරි අපි කාටවත් පින්දහම් රැස්කර ගන්නට පුළුවන් කමක් නෑ. ඒ විතරක් නෙමෙයි මිනිසත් ආත්මයක ඉපදුණත් අන්ධවෙලා උප්පත්තිය ලැබුවොත්, ගොළුබිහිරි වෙලා උත්පත්තිය ලැබුවොත්, මිථ්‍යාදෘෂ්ටික කුලයෙක උප්පත්තිය ලැබුවහොත් මේ කිසිම අවස්ථාවක පින්දහම් කරන්නට පුළුවන්කමක් නෑ.

බුදුදහම නොපවතින දේශයක, පිටසක්වලක උපන්නත් පින්දහම් කරන්නට පුළුවන්කමක් නෑ. එහෙනම් මොන වගේ කාලයක ද පින් දහම් කරන්න පුළුවන්, බුද්ධෝත්පාද කාලයක, ශ්‍රද්ධා ශීලාදී ගුණ දම් වඩන සත්පුරුෂයන් වාසය කරන රටක ඉපදුණොත් පමණයි අපිට පින්දහම් කරගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒකයි බුදුපියාණන් වහන්සේ මහා මංගල සූත්‍රයේ දී පතිරූප දේසවාසොච යනුවෙන් දේශනා කොට වදාළේ.

අපේ මාතෘකාව මනුෂ්‍යයා පිළිබඳවයි. අපි එහෙනම් කල්පනා කරලා බලමු හැමෝම නියම මනුෂ්‍යයෝ වෙනවද කියලා. මේ ලෝකයේ වසන මිනිස්සු කොටස් හතරකට අපිට බෙදා දක්වන්න පුළුවන්. ඒ මිනිස් නිරි සත්තු, මිනිස් ප්‍රේතයෝ, මිනිස් තිරිසන්නු, නියම මිනිස්සු යනුවෙන්. දැන් අපි බලමු මේ කොටස් හතරේ ක්‍රියාකාරීත්වය කොහොමද කියලා.

## මිනිස් නිරි සත්තු

මේ නමින් හඳුන්වන්නේ පෙර ජාතිවල දී ප්‍රාණඝාතාදී බොහෝ අකුසල කර්ම කළ




අයයි. ඒ අය බොහෝ අනන්ත කාලයක් තමන් කළ අකුසල් කර්මවල ඵල විපාක විඳලා, නැවත මිනිස් ආත්ම භාවයක උපන්නත් පෙර කළ පාප ක්‍රියාවල ඉතිරි හරිය ඒ ආත්ම භාවයේදී ඵල දෙනවා. ඒ කොහොමද? කුමක් හෝ වරදකට හසුවෙලා දුක් විඳිනවා. අත් පා අහිමි වෙනව. ඇස්, කන් අහිමි වෙනවා. එල්ලුම්ගස් නියම වෙනවා. රජයට වන්දි ගෙවන්න සිද්ධ වෙනවා. මේ වගේ මොනයම් හෝ දෙයකට හසුවෙනවා.

මේ ආත්මේ මොනතරම් හොඳට ජීවත් උනත් පෙර කළ පව් ඉස්මතු වෙලා ආවම ඒවායෙන් ගැලවෙන්නට, බේරෙන්නට පුළුවන්කමක් නෑ. බලන්න පින්වතුනි, පෙර කිව් විදියට අද සමහර මිනිස්සු දුක් විඳිනවද කියල. අන්න ඒ නිසයි එවැනි දුක් විඳින අයට කියන්නේ මිනිස් නිරි සත්තුය කියලා. ඒ මෙලොව පෙර කළ අකුසල් විඳවන නිසා. අපි බලමු ඊළඟ කාරණය .

## මිනිස් ප්‍රේතයෝ

බලන්න පින්වතුනි, මේ කිව්ව මිනිස් ප්‍රේතයෝ කොච්චරනම් අපිට දකින්න ලැබෙනවාද කියල. මිනිස් දිවියක් ලැබුවත් සා පිපාසා දුක ඉවසන්න බැරිව, සිඟාකමින් මොනවත් හොයා ගන්න දුක් විඳින මිනිස්සු අපි හැමෝම ඕනතරම් දැකලා තියෙනවනෙ. අඳින්න වස්ත්‍රයක් නැතිව, දැලි කුණු පෙරාගෙන, දකින අයට පිළිකුලක් ඇතිවන මිනිස්සු මොන තරම් මේ ලෝකයේ ජීවත් වෙනවද කියල බලන්න.

ඒ මිනිස්සුන්ට හරිහමන් ඉන්න තැනක් නෑ. සමහරවිට මුළු ජීවිත කාලයටම අහස තමයි පියස්ස, පොළොව තමයි යහන. මේවා දැකලවත් අපේ මිනිස්සු හැදෙන්නට උත්සාහ ගන්නට ඕන. එහෙම නොවුණහොත් ඉතින් තමන්ටත් මෙහෙම දුක් විඳින්නට සිදුවේවි කියල හොඳින් මතක තබා ගන්නටත් ඕන.

## මිනිස් තිරිසන්නු

මිනිස් තිරිසන්නු කියල සඳහන් කරන්නේ, මිනිස් ආත්ම භාවයක් ලැබුවට, කිසිම පිනක් දහමක්, අණක් ගුණක්, නැතිව ජීවත්වන අයටයි. ඒ මිනිස්සුන්ට එලොවක් මෙලොවක් ගැන හාන්කවිසියක් නෑ. කර්මය , කර්මඵලය පිළිබඳ විශ්වාසයක් නෑ. නොයෙක් විදිහේ අපරාධ, දූෂණ, වංචා, හොරමැරකම්, තක්කඩිකම් කරමින්, සමාජයට විවිධ අයුරින් හානි පමුණුවන අයටයි මිනිස් තිරිසන්නු කියන්නෙ.

## නියම මිනිස්සු

කවුද මේ නියම මිනිස්සු කියල සඳහන් කරන්නෙ. පෙර ආත්මභාවවලදී කරන ලද පින් දහම්වල බල මහිමයෙන්, හොඳ රූපයක්, සැලකිය යුතු ධනයක්, සුලබ වූ ආහාර පානත්, වස්ත්‍රාභරණත් ඇතිව, ප්‍රඥා සම්පත්තියෙන් යුක්ත හොඳ ජීවිත ගත කරන අයටයි නියම මිනිස්සු කියන්නේ. එහෙම නැත්නම් සත්පුරුෂ මිනිස්සු කියන්නෙ. කර්මය, කර්මඵලය පිළිබඳ විශ්වාසයකින් යුක්තවයි නියම මිනිස්සු කටයුතු කරන්නෙ.

ආගම දහම වෙනුවෙන් තමන්ගෙන් ඉටුවන්නට ඕනෑ යුතුකමක් වේ නම් එය හොයල බලල කරන අයටයි නියම මිනිස්සු කියන්නේ. ඒ අය තුළ මෙලොවක් ගැන, පරලොවක් ගැන විශ්වාසයක් තියෙනව. මැරෙණ බව තේරුම් අරගෙන කටයුතු කරනව. අන්න එවැනි අයයි, පින්වතුනි නියම මිනිස්සු.

මේ විදිහට කල්පනා කරල බැලුවම අපට හිතෙන්න පුළුවන් මිනිස්සු මෙහෙම විතරද බෙදා දක්වන්න පුළුවන් කියල. මීට වෙනස් විදිහකින්, මිනිස්සුන්ගේ ගති පැවතුම් අනුවත් ඔවුන් බෙදා දක්වන්න පුළුවන්.

සෑම මනුෂ්‍යයකුගෙම ජීවිතය සාර්ථක වන්නේ ධර්මයට අනුකූල වන පරිදි සකස් කරගත්තොත් විතරයි. අපි හැම ආත්ම භාවයකම මිනිසකුම වෙලා උප්පත්තිය ලබන්නෙ නෑ. ඒ පිළිබඳව විස්තරයක් හමුවෙනව අංගුත්තර නිකායෙ ජම්බුදීප පෙය්‍යාලවග්ගයේදී. මෙන්න මෙහෙම, "මිනිසුන් අතර උපදින සත්ත්වයෝ බොහොම අඩුයි. ඒත් මනුෂ්‍යයන්ගෙන් වෙන්වෙලා නරක ආත්මවල උපදින අය වැඩියි" ඊළඟට දේශනා කරනවා,

මිනිසුන් අතරින් මැරිලා මිනිස්නු අතර උපදින සත්ත්වයෝ අඩුයි. ඒත් මිනිසුන් අතරින් මැරිලා ගිහිල්ලා, නිරයෙහි, තිරිසන් යෝනියෙහි, ප්‍රේත යෝනියෙහි උපදින අය වැඩියි.


මේ ආදී වශයෙන් එහිදී වැඩි දුරටත් දේශනා කරනව, දෙවියන් අතර ඉපදිලා දෙවියන් අතරට නැවත යන අය අඩුයි. එහෙත් නරකයෙහි උපදින අය වැඩියි.

ඒ වගේම තමයි දෙවියන් අතරින් මැරිලා මිනිසුන් අතර උපදින අය අඩුයි. එහෙත් නරකයෙහි උපදින අය වැඩියි.

නිරයෙන් චුතවෙලා මිනිසුන් අතර උපදින අය අඩුයි. ඒත් නරකයෙහි, තිරිසන් ලෝකයෙහි ප්‍රේත විෂයයෙහි උපදින අය වැඩියි.

මෙහෙම බැලුවම අපට පේනව දෙවියන් අතර ඉපදුණත්, තිරිසන් ලෝකයක ඉපදුණත්, නිරයෙහි ඉපදුණත්, ප්‍රේත විෂයයෙහි ඉපදුණත්, මිනිස් ආත්මභාවයක් ලබාගන්න එක අමාරු බව. අපහසු බව. පව් වැඩ කළොත් තමන් ඉන්න තැනින් තව තවත් පහතට වැටෙනව මිස ගොඩ ඒමක් නෑ. ඒ නිසා පින්වතුනි තමන් ලද මේ ජීවිතයෙන් නියම ඵල ප්‍රයෝජන ගන්නට උත්සාහ කරන්න. මේ දේ කළොත් පිරිහෙනවා. මේ දේ කළොත් එහෙම වෙන්නෙ නෑ කියලා හොඳට හිතල, මතල කටයුතු කරන්න.

# සැට නමකට දන් දුන් මෙහෙකාරියක්



අග්ගමහා පණ්ඩිත
**පොල්වත්තේ බුද්ධදත්ත මහ නාහිමි**

**නාගදීපයෙහි දුර්භික්ෂයක් ඇති වූ කල්හි අඹුසැමි දෙදෙනෙක් ද දුව ද ජීවත් විය නොහැකිව දුව උකසට තබා කෙළෙඹියකුගෙන් කහවණු සතළිසක් ගත්හ. මාතුදේවිකා නාගී නමැති ඒ දුව නිසා මව්පිය දෙදෙන සුවසේ විසූහ.**

ඈ ඒ ගෙයි බැලමෙහ කරමින් සිටින කාලයෙහි ඒ ගමට සැටනමක් භික්ෂූහු පිඬු පිණිස ඇතුල් වූහ. ඒ වේලෙහි නාගිනිය පැන් ගෙන ඒම සඳහා වැවකට යන්නී, ගමේ ඇවිද කිසිවක් නොලැබ අවුත් පාත්‍ර පසුම්බිම දමා ඒ භික්ෂූන් සිටී. ඈ එහි අවුත් කරුණු විචාළ විට ඒ භික්ෂූහු ඇත්ත කීහ. ඒ දැරිය “රෑ වැඩ කිරීමට පොරොන්දු වී තවත් කහවණු සැටක් ගෙන මේ භික්ෂූන්ට දන් දෙන්නෙමි” යි සිතක් උපණි. එසේ සිතා කළය භික්ෂූන් වෙත තබා “මා හැරී එනකල් නැවතී සිටිය මැනවැ” යි කියා තමා වසන තැනට ගොස් “ස්වාමිවරුනි මට කහවණු සැටක් ණයට දුන මැනැවැ” යි කීහ.

ගෙහිමියා “තී අනුන්ගේ මෙහෙකාරියක් ව සිට ගෙන ටිකෙන් ටික ණය ගෙවන ගමන් තවත් ණය ගන්නේ කුමක් හෙයින්දැයි “ විචාළේ ය.

“ඔබ මේ ගැන නො සිතනු මැනවි. රාත්‍රි දාසියක් වී රෑ වැඩ කොට ඒ කහවණු සැට ගෙවන්නෙමි “ යි ඕ කීය. හෙතෙම ලියවිල්ලක් ලියා ඇට කහවණු සැටක් දුණි. ඕ “එක් එක් ගෙයකට කහවණුව බැගින් දී එක් එක් භික්ෂු නමට කහවණුව බැගින් වටිනා දානය සම්පාදනය කළ මැනැවයි” කියා ඒ භික්ෂූන් අසුන් හලකට පමුණුවා මේ සියලු ප්‍රවෘත්ති භික්ෂූන්හට කීය.


සංවේගයට පත් භික්ෂූහු ඒ පිණ්ඩපාතය පිළිගෙන පිටත ගොස් විලක් සමීපයට පැමිණ පාත්‍ර පැත්තකින් තබා භාවනා කරන්නට පටන් ගත්හ. “ඉදින් රහත්ඵලයට පැමිණිය හැකිනම්, අනුභව කරන්නෙමු. නොහැකි වී නම් අනුභව නොකරන්නෙමු”. යි අධිෂ්ඨාන කොට භාවනා වැඩූ ඒ භික්ෂූහු නොබෝ වේලාවක දී රහත්බවට පැමිණ ආහාර අනුභව කළහ. එදා රෑ හෙළදිව හැම දෙවියෝ සාධුකාර දුන්හ. ඇය මරණින් මතු සුගතියේ ඉපදුණි.

**ඉතා පැරණි සිංහල බණ කථා ග්‍රන්ථයෙනි**



# පෙරනිමිත්ත සැබෑ වෙයි

**සිරිත් පරිදි එක් නිවෙසකට පැමිණෙන හිමිනමක් දන් වැළඳීමේ අදහසින් ම එහි පැමිණ අස්නෙක වැඩ සිටියේ ය. එහෙත් එම නිවසේ සිටි ස්ත්‍රිය දන් දීමට එතරම් ශ්‍රද්ධාවක් නැත. “දානය පිළියෙළ කිරීමට අවශ්‍ය සහල් ආදී කිසිවක් ගෙදර හරියේ නැතැයි “ කියමින් සහල් ටිකක්වත් සපයා ගෙන ඒමට ළඟ නිවෙසකට යන බව අඟවා ගෙයින් පිටත් වූවා ය.**



**අත්තුඩාවේ සිරි රාහුල මහ නා හිමි**

මේ හිමියන් ද පහසුවෙන් රැවටිය නොහැකිය. ගෙය හිමි ස්ත්‍රිය ගෙයින් බැහැර ගිය පසු හිමියෝ ගේ ඇතුළට ගොස් වට පිට සොයා බැලූහ. දානය පිළියෙළ කිරීමට අවශ්‍ය සියලු උපකරණ එහි විය. උග් ගසක් දෙර මුල්ලේ විය. සැලියක සහල් ද, තවත් බඳුනක හකුරු ද, පැසෙක ලුණු මාලු පිටක් ද තිබුණේ ය.

මේ සියල්ල තිබෙන තැන් බලාගත් හිමියෝ ගබඩාවෙන් පිට වී කලින් වැඩ සිටි අසුනේ ම වාඩි වූවෝ ය. ටික වේලාවකින් කාන්තාව පෙරළා පැමිණියා ය.

“ස්වාමින්වහන්ස, අපට යමක් අවශ්‍ය වුවොත් කිසිම තැනකින් කිසිවක් ලබා ගත නොහැකියි” කීවා ය

“උපාසිකාවෙනි, අද දානයට කිසිවක් නොලැබෙන බව මා දුටු පෙර නිමිත්තෙන්ම සිතා ගතිමි”.

“ස්වාමින් වහන්ස, කුමක්ද? ඒ පෙර නිමිත්ත”.

“උපාසිකාවෙනි, මා මහ මගට බහින විට ම මහා නාගයෙක් පෙනය පුප්පාගෙන ඉදිරියට ඇදී ආයේ ය.

“ස්වාමීනි ලොකු නයෙක්ද?”

“ලොකුද කියලත් අහනවා. හරියටම කියනවා නම් දෙර මුල්ලේ තිබෙන උග් ගසටත් වඩා ලොකුයි. පෙනය අර තිබෙන ලුණු මාලු පිටටත් වඩා ලොකුයි. පෙනය පිප්පු විට පෙනුණු දත්ටික හැලියේ තිබුණ හාල් ඇට වාගෙයි. නයාගේ මුඛයෙන් නික්මුණු සෙම භාජනයේ තිබෙන ගිතෙල් වාගෙයි”.

“ඒ මුඩු මහණා රැවටීම පහසු කාර්යයක් නොවේ” යයි සිතමින් පළමු කොට උග්ගස කපා පිළිගන්වා බත උයා ගිතෙල් හකුරු සමඟ පිළිගැන්වූවා ය.

**අටුවා රස කතා ග්‍රන්ථය ඇසුරිනි**

# අංගුත්තර නිකාය 1 - විරියාරම්භ වර්ගය අංක 07

**සූත්‍ර අංකය - 67**
**යොනිසො මනසිකාර සූත්‍රය**

මහණෙනි, යමක් හේතුකොට ගෙන නූපන්නාවූ ද කුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුසල ධර්මයෝ පිරිහෙත් නම්, නුවණින් මෙනෙහි කිරීම (යොනිසො මනසිකාරය) වැනි අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නා හට නූපන්නාවූද කුසල ධර්මයෝ උපදිත්. උපන්නා වූ ද අකුසල ධර්මයෝ පිරිහෙත්.

**සූත්‍ර අංකය - 68**
**අසම්පජඤ්ඤ සූත්‍රය**

මහණෙනි, යමක් හේතුකොට ගෙන නූපන්නාවූද අකුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුසල ධර්මයෝ පිරිහෙත් නම්, (මොහ සංඛ්‍යාත) අසම්පජඤ්ඤය (මනාප්‍රඥ නැතිබව) වැනි අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහණෙනි, මනා නුවණ නැති පුද්ගලයාහට නූපන්නාවූද අකුසල ධර්මයෝ උපදිත්, උපන්නා වූ ද කුසල ධර්මයෝ පිරිහෙත්.

**සූත්‍ර අංකය - 69**
**සම්පජඤ්ඤ සූත්‍රය**

මහණෙනි, යමක් හේතු කොට ගෙන නූපන්නා වූ ද කුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුසල ධර්මයෝ පිරිහෙත් නම් මහණෙනි, සම්පජඤ්ඤය (මනා සම්‍යක් ප්‍රඥව) වැනි අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහණෙනි, මනා සම්‍යක් ප්‍රඥයෙන් දක්නාහට නූපන්නා වූද කුසල ධර්මයෝ උපදිත්. උපන්නා වූද අකුසල ධර්මයෝ පිරිහෙත්.

**සූත්‍ර අංකය - 70**
**පාපමිත්ත සූත්‍රය**

මහණෙනි, යමක් හේතු කොට ගෙන නූපන්නා වූ ද අකුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූද කුසල ධර්මයෝ පිරිහෙත් නම් පාප මිත්‍රතාව (පව්ටු වූ ලාමක වූ මිතුරන් ඇසුර) වැනි අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහණෙනි, පාප මිත්‍රයන් ඇත්තහුට නූපන්නා වූද අකුසල ධර්මයෝ උපදිත්, උපන්නා වූ ද කුසල ධර්මයෝ පිරිහෙත්.

අටුවාව – පාප මිත්‍රතාව යනු කවරේද? සැදැහ නැති, දුසිල්වත් වූ, ඇසූ පිරූ තැන් නැති, මසුරු වූ මෝඩ වූ යම් පුද්ගලයෝ වෙත්ද ඔවුන්ගේ යම් ඇසුරක්, ආශ්‍රයක් එක්ව ඇසුරු කිරීමක් භජනයක්, දැඩි භජනයක්, භක්තියක්, දැඩි ඇදහීමක්, සබැඳියාවක් වේ ද එය ‘පාපමිත්තතා’ යි

සත්වෙනි විරියාරම්භ වග්ගය නිමි.

ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තන මණ්ඩලයේ ලේකම් (බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව)
**කේ.කේ. සුගතපාල**

**පිරිකර පූජාවේ අනුසස්**

# උපද්‍රව දුරු වීමට කුඩ පූජා කරමු

**සම්මා සම්බුදුරජාණන් වහන්සේට හා උතුම් වූ සංඝ රත්නය උදෙසා කුඩ පූජා කිරීමෙන් කර්මයට සුදුසු වූ ආනිසංස අටක් ලැබෙන බව සඳහන් වේ.**

**ශීත හා උෂ්ණ දෙකින් පීඩා නො ලැබේ.**
**ශරීරයේ කුණු නොතැවරේ.**
**උපද්‍රව නැතිවේ.**
**අනතුරු නැති වේ.**
**සෑම කල්හි අන්‍යයන් විසින් ගරු කරන කෙනෙක් බවට පත්වේ.**
**සියුම් වූ සමක් ඇතිවේ.**
**සිත පිරිසුදු වේ.**

**දීපා**

# සම්බුදු හිමිගේ සදහම් සිසිලෙන් සැනහෙන අප සිරිලක් දරුවෝ



ශාස්ත්‍රපති
**වාද්දුවේ ධම්මවංස හිමි**

**ශ්‍රී ලංකාවේ බෞද්ධ දහම් පාසල් පිළිබඳ මූලික දර්ශනය මැනවින් පැහැදිලි කරන චිත්තාකර්ශණීය ප්‍රකාශනය දහම් පාසල් ගීතයයි. සෝමපාල රාජකරුණා මහතා විසින් රචිත මෙම ගීතයේ දර්ශනය තුන් කාලයට ම ගැලපෙන්නකි.**

ලංකාවේ දහම් පාසල් ආරම්භ වූයේ 1895 අගෝස්තු 3 වැනි දායි. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ලංකාවට පැමිණියේ 1880 මැයි 17 වැනිදායි. එතුමා ලංකාවට පැමිණියේ 1873 සිදු වූ ඓතිහාසික පානදුරා වාදයේ වාර්තා දැකීමෙන් පසුවයි.

නිල වශයෙන් බෞද්ධ බවට පත්වූයේ 1880 මැයි 25 වැනිදා ගාල්ලේ වැලිවත්තේ විජයානන්ද විහාරස්ථානයේදී අක්මීමන ධම්මාරාම ස්වාමින් වහන්සේගෙන් තිසරණ පංච ශීලය සමාදන් වීමෙනි. එහිදී එච්. පී. බ්ලැවස්කි මැතිනිය ද උපාසිකාවක් බවට පත්වූවා ය.

1889 දී ගාල්ල විජයානන්ද විහාරස්ථානයේ එතුමාණන්ගේ අනුශාසනා යටතේ ඩී. ජේ. සුබසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් දහම් පාසලක් ආරම්භ වුව ද එය අතර මග බිඳ වැටිණි. 1885 නැවත දහම් පාසලක් ආරම්භ වූයේ ඕල්කට් තුමාගේ අනුශාසනා පරිදි ඇල්ලේපොල ජිනෝරස ස්වාමින් වහන්සේගේ ප්‍රධානාචාර්යත්වයෙනි.

දහම් පාසල තරම් සිත් ඇදගන්නා වෙනත් අධ්‍යාපන පාඨමාලාවක් ලංකාවේ නැත. වෙනත් වචනයක් නැති බැවින් පාසල, විද්‍යාලය, පාඨශාලාව යන වදන් ප්‍රකාශ කළත් ඇත්ත වශයෙන් ම මෙය බටහිර ජාතීන් ඇති කළ පාසල නොවේ. මෙයට යෙදිය හැකි වචනයක් අද වත් කල්පනා කළ යුතු ය. දහම් නිකේතනය වැනි හඳුන්වාදීමක් වඩා උචිතයැයි පෙනේ.

දහම් පාසල සාමාන්‍ය පාසලෙන් වෙනස් වන අංශ කිහිපයක් ම වෙයි. එනම් දහම් පාසලේ සමාජ සම්බන්ධතාවය සර්, මිස්, ටීචර් නොව අයියා,අක්කා, යන වචනයෙන් යුක්ත වීම හා එහි ප්‍රතිලාභීන් දුව, පුතා වීමයි.තවත් කරුණක් නම් බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතම ගුරුවරයා ලෙස පිළිගැනීමයි. බුදුරජාණන් වහන්සේ දැකිය හැක්කේ ධර්මයෙන් ලෙස සැලකීමයි.

දහම් පාසලේ ගිහි ගුරුවරයා ගේ ඇඳුම දේශීයයි. ගුරුවරිය දහම් පාසල් නිල ඇඳුම වන සාරියෙන් සැරසෙයි. රජයෙන් මෙම ඇඳුම් ලබාදීම සතුටට කරුණකි.

දහම් පාසලේ පළමු ක්‍රියාකාරකම මල් පහන් රැගෙන එන දරුවන් යටත් පිරිසෙන් විනාඩි 45 ක් පමණ ආගමික වතාවත් කිරීමයි. තෙරුවන් වන්දනය, ඥාතීන්ට දෙවියන්ට පින්දීම, උදාර මවුපියන්ට හා ගුරුවරුන්ට ගාථා කියමින් වැඳීම. මෛත්‍රී භාවනා කිරීම, අනුශාසනයක් ශ්‍රවණය කිරීම එයට අයිති වෙයි. ශ්‍රද්ධාව උපදින මෙම වතාවත් පාසලේදී කළ නොහැකි බව අපි අවිවාදයෙන් පිළිගත යුතු වෙමු.



වඩා සාර්ථක දහම් පාසලක් වන්නේ සිවුරේ සෙවණ ලබන දහම් පාසලයි. විහාරාධිපතීන් වහන්සේ බුද්ධ වන්දනාව මෙහෙය වන දහම් පාසලයි. ප්‍රධාන අනුශාසක ස්වාමින් වහන්සේ නමක් වැඩ සිටින දහම් පාසලයි . පාලි භාෂාව ,අභිධර්මය, මැනවින් දන්නා ගුරවරු සිටින දහම් පාසලයි.

දහම් පාසල් ගුරුවරු දහම් පාසල් දින යටත් පිරිසෙන් පැය 5 ක් මෙම සත්කාර්යයේ ව්‍යාකෘත වෙති. ඒ හැර කැඩුණු ඩෙස් , බංකු ප්‍රතිසංස්කරණය කරති. ඉවසීමේ කෙළවරම සිට දරුවන් ඇසුරු කරති. මුළු ජීවිත කාලයේම ආදර්ශවත් වෙති. තම දරුවන්ට ආදර්ශවත් ලෙස ගත කරන අම්මා තාත්තා කෙනෙක් ලෙස හැසිරේ. එබැවින් දැනට 125000 ක් පමණ ගිහි ගුරුවරු සමාජයේ සිටීම කෙතරම් භාග්‍යයක් ද ?

දහම් පාසල් දරුවන් වැනි වෙනත් සදාචාර සම්පන්න සිසු පිරිසක් අප රට නැත. සැදැහෙන් තෙරුවන් වඳිති. ගුරුවරු සමඟ සුහද මිත්‍රශීලීව ගුරු භක්තිය ඇතිව කතා කරති. ගුරුවරයා හා ගුරුවරිය පවුලේ වැඩිමලකු ලෙස සලකති. තම දහම් පාසල් ජීවිතයෙන් පසුව දුටු දුටු තැන වැඳ නමස්කාර කරති. ඉතා නිවැරැදි භාෂාවක් වහරති. පසුගිය 30 අවුරුදු යුද්ධයේදී මිය ගිය රණ විරුවන්ගෙන් ඉතා වැඩි ප්‍රතිශතය බෞද්ධ පාසල්වල හා දහම් පාසල්වල ඉගෙනුම ලැබූ ළමයින් ය. මන්ද ජාතික ඉතිහාසය , උත්තරීතර ජාතික වීර චරිත, දහම් පාසලේ තරම් සාමාන්‍ය පාසල්වල නොඋගන්වන බැවිනි.

ක්‍රිස්තු වර්ෂ 16 සියවසේ මුල් භාගය සිට විසි වන සියවසේ ආරම්භය දක්වා කාලයේ ලංකාවේ සාක්ෂර ඥාණය 90% සිට 25% ක් දක්වා පිරිහිණි . පෘතුගීසි සමයට පෙර කෝට්ටේ යුගයේ ලංකාවේ සාක්ෂර ඥාණය 90% වැඩි බව අපේ සාහිත්‍යය විමසීමෙන් පෙනේ . අවුරුදු 450 ක් පැවතුණු බටහිර ආධිපත්‍යයෙන් වූ ලංකාවේ අධ්‍යාපන පරිහාණිය ප්‍රමාණ කළ නොහැකි තරම්ය. යුරෝපීය ජාතිකයින් අපට දායාද කළ මත් වතුරත්, දුම් වැටියත් නිසා ශ්‍රී ලංකා ආර්ථිකය ,සෞඛ්‍ය පරිසරය බිඳ වැටුණු අතර ජාතික හැඟීම් ද මොට වී දේශීය භාෂා ව්‍යවහාරය සහ බෞද්ධයකු වීම ලජ්ජාවට කරුණක් වන තරමේ හීනමානයකට ලාංකිකයන් පත් වී තිබිණි.

මේ බව තේරුම් ගත් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ලංකාවේ දහම් පාසල් ගැන නිතර අදහස් ප්‍රකාශ කළේය. "ලංකාවේ බෞද්ධ ළමයින් වෙනුවෙන් හැම පන්සලකම විශේෂ දිනයකදී පැය කිහිපයක් ආගම ඉගැන් විය යුතු වෙයි. ක්‍රිස්තියානිවරුන් එසේ කරති. එහෙත් බෞද්ධ දෙමාපියන්ට මෙය නොපෙනෙන්නේ කුමක් නිසාද ?" එතුමාගේ දින පොත් හි සඳහන් කර ඇත. ඇනී බෙසන්ට් මැතිනිය ප්‍රකාශ කලේ ළදරු හදවත්වල මෛත්‍රිය, ශ්‍රද්ධාව, භක්තිය යන අංකුර ලියලන බවත් එබැවින් කුඩා අවදියේ ම දරුවන්ට මෙම හැඟීම් ලබා දිය යුතු බවත්, ලංකාවේ පාසල්වල ඉගැන්විය යුතු ආගම බුද්ධාගම බවත්, ලංකාවේ සිතුම් පැතුම් හා සදාචාරයට බුද්ධාගම පදනම් විය යුතු බවත් ය.

මේ අදහස් තමා පවසන්නේ එය ලංකාවේ යහපතට පමණක් නොව සමස්ත ලෝකයේ ම යහපතට හේතු වන නිසා බවත් ඇය පවසයි

ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනයේ ලා ශ්‍රී ලංකා රජය කරන ලද උදව් සහ මඟ පෙන්වීම් සුදනන් ගේ ප්‍රසාදයට ලක්විය යුතු ය. විමධ්‍ය ගත අය වැයවලින් දහම් පාසල් උපකරණ සහා ගොඩනැඟිලි ලබා දීම , දහම් පාසල් පොත් වසර එක සිට ධර්මාචාර්ය දක්වා නොමිලයේ සැපයීම, දහම් ගුරුවරුන්ට නිල ඇඳුම් සැපයීම, දහම් පාසල් ගුරුවරුන්ට පුස්තකාල දීමනාවක් දීම. දහම් පාසල් ගුරුවරුන්ගේ සේවය අගය කටයුතු කිරීම ඉන් කිහිපයකි.

වසංගත තත්වය යටතේ වර්තමාන දහම් පාසල අනාථ තත්වයක පවතී. රජයේ පාසල් මාර්ග ගත අධ්‍යාපනය ලබාදෙයි. ලංකාවේ දිළිඳු ශිෂ්‍යයන්ට අසාධාරණයක් වුවත් ඇති හැකි අයට හෝ අධ්‍යාපනය ලැබීමට වරම් ලැබීම සතුටට කරුණකි. ඉතා මෑත දිනවල දහම් පාසල් සඳහා ද එවැනි අධ්‍යාපන රටා ආරම්භ විය. එය මෙහෙයවන්නෝ කරනුයේ මහත් කැපවීමකි. එසේ වුවත් දහම් පාසල යනු දැනුම පමණක් ගොඩනගන තවත් පාසලක් නොවේ. දහම් පාසල් සජීව ම ආරම්භ කරන අවස්ථාවල දැනට මාර්ග ගත දහම් පාසල් අක්‍රීය කිරීමට එය මෙහෙය වන්නෝ ඒකාන්තයෙන් ම ක්‍රියා කරනු ඇත.

ලංකාවේ උපකාරක පන්ති අධ්‍යාපනය ඉතා විශාල ලෙස පැතිර ඇත . ඉරිදා උදෑසන සහ පෝය දින තම උපකාරක පන්ති නවත්වන ලෙස රජය, විහාරාධිපති හිමිවරු, දහම් පාසල් ප්‍රධානාචාර්යවරු ආයාචනය කළත් මෙම ගුරුවරුන්ගෙන් බොහෝ පිරිසක් ඊට සවන් නොදුන්හ. දැන් මෙම වෙළඳුන්ට වඩා ලාභදායී පරිසරයක් යෙදී ඇත. අන්තර් ජාලයේ සූම් තාක්ෂණය යටතේ අවශ්‍ය අංකයට මුදල් දෙන දරුවන්ට පමණක් මාර්ග ගත අධ්‍යාපනය ලැබේ. ඉදිරියට මේ පිරිස ඉරු දිනවල අනිවාර්යයෙන් ම මාර්ග ගත අධ්‍යාපනයේ යෙදෙන්නට ඉඩ ඇත.

දුප්පත් මව්පියන් ධනය වැය කොට ස්මාර්ට් ජංගම දුරකථන සහ ඩේටා ලබන නව යොවුන් දරු දැරියන්ට අත් වී ඇති ඉරණම සංවේග දනවයි. මේ නිසා ඉදිරියේ දී දහම් පාසල් ගුරුවරු වඩාත් සිත් ගන්නා ලෙස හා නව උපක්‍රම යොදමින් ඉතා දැඩි කැප කිරීමෙන් කටයුතු කිරීමෙන් පමණක් සම්බුදු හිමි ගේ සදහම් සිසිලෙන් සැනහෙන දරු පරපුරක් තනා ගැනීමට හැකි වෙයි.

Lesson for mindfulness- part 10

# Contemplation of feelings



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

In addition to the mindfulness of the body that I mentioned above, specifically mindfulness of breathing and contemplation of the body, according to the Satipatthana sutta, there is a second way of practicing mindfulness called "contemplation of feelings" (vedananupassana) with regard to emotions, whether happy, unhappy or neutral. When one has a pleasant feeling, one knows he is experiencing a pleasant feeling, when one has a painful feeling, one knows he is experiencing a painful feeling, one knows he is experiencing a painful feeling, when one has a neutral feeling, one knows he is experiencing a neutral feeling. The Satipatthana Sutta (Nyanaponika) explains:

Thus he dwells practicing feeling-contemplation on feelings internally, or externally, or both internally and externally. He dwells contemplating origination-factors in feelings, or he dwells contemplating dissolution-factors in feelings, or he dwells contemplating both origination and dissolution factors in feelings.

The question arises: how does one identify those feelings and how should they act towards the feelings, according to the above citation. For instance, when a student experiences an unhappy, sorrowful sensation, his mind is cloudy and not clear; the student may be depressed. In some cases, he does not even see clearly why he has thee unhappy feelings. In order to overcome this state of mind, he should try to see clearly why there are these sensations or feelings of unhappiness or worry or sorrow. He should examine how these feelings or sensations arise, their cause, and how they disappear. But one may ask: how is this to be done? According to Rahula, he should try to examine these sensations or feelings as if he is observing them from the outside, without any subjective reaction, as a scientist observes some objects.

In this mode he should not look at them as 'my feelings' or 'my sensations' subjectively, but only look at them each as 'a feeling' or 'a sensation' objectively. For example, when he has feelings of anger towards someone, he should not think that it is "my anger" towards that person, but notices that it is an angry feeling. When he sees its nature and how the particular sensation or feeling arises and disappears, his mind grows dispassionate towards that sensation and thus the student is able to cope with the troubling emotion.

> "In this mode he should not look at them as 'my feelings' or 'my sensations' subjectively, but only look at them each as 'a feeling' or 'a sensation' objectively. For example, when he has feelings of anger towards someone, he should not think that it is "my anger" towards that person, but notices that it is an angry feeling."

## කවරයේ කතාව

### දුක් විසට මුල

රජගහනුවර භාරද්වාජ ගෝත්‍රයට අයත් ය. ඒ නමින් ම ප්‍රසිද්ධ වූ බමුණෙක් විය. ඒ බමුණාගේ බිරිඳ "ධාන ජානි" ය. ඇය තෙරුවන් කෙරෙහි පැහැදුණු උපාසිකාවකි.



දිනක් ඇය සිය සැමියාට බත් පිළිගන්වන අවස්ථාවේ දී පය ලිස්සා වැටෙන්නට ගියා ය. එකෙනෙහි ම භාග්‍යවතුන් වහන්සේ සිහිකොට "නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස" යනුවෙන් තුන් වරක් පැවසී ය. ඒ අවස්ථාවේ දී බමුණ කිපුණේ ය.

කොතැනැදීත් ඒ මුඩු මහණ ගේ ම ගුණ කියනවා යැයි දෙස් කීවේ ය. මම ඔහු සමඟ වාද කරමි'යි පැවසීය.

බමුණ, දෙවියන් ඇතුලු ලෝකයෙහි ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට වාදාරෝපණයට සමතෙක් ඇතැයි නො සිතමි. ඔබ උන්වහන්සේ වෙතට ගිය විට මා පවසන්නේ ඇත්ත ද බොරු දැයි වැටහෙනු ඇතැයි බැමිණිය පැවසී ය.

බමුණා භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. උන් වහන්සේ සමඟ පිළිසඳර කතා කොට පසෙකින් ඉඳගෙන ප්‍රශ්න නැඟීය. "කුමක් නැසීමෙන් සුවසේ සිටිය හැකි ද? කුමක් නැසීමෙන් ශෝක නොකර සිටිය හැකි ද? කුමන එක් දෙයක් නැසීමෙන් ඔබට රිසි යේ ද? යැයි බමුණා ඇසූ මේ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ මේ ලෙසින් පිළිතුරු දුන්හ.

"ක්‍රෝධය නැසීමෙන් සුව සේ සිටිය හැකි ය. ක්‍රෝධය නැසීමෙන් ශෝක නො කර සිටිය හැකි ය. බ්‍රාහ්මණය, දුක් විසට මුල් වූ ක්‍රෝධය වැනැසීම මැනැවැ'යි ආර්යන් වහන්සේ පවසත්. ඒ ක්‍රෝධය නැසීමෙන් නිශ්ශෝක වේ'යැයි වදාළ සේක.

මෙය ඇසූ බමුණ තෙරුවන් කෙරෙහි පැහැදී උපාසකයෙක් විය. භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පදාව ඉල්ලී ය. භාග්‍යවතුන් වහන්සේ බමුණාට පැවිද්දත්, උපසම්පදාවත් දුන් සේක. පැවිදිව විදසුන් වඩා නොබෝ දිනකින් කෙලෙස් නසා රහත් බවට පත් විය.

භාරද්වාජගොත්ත බමුණා භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වී යැයි ඇසූ ඒ ග්‍රෝතයට ම අයත් එක් බමුණෙක් කුපිතව භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් අසභ්‍ය පරුෂ වචනයෙන් පරිභව කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ නිහඬව ඔහුගේ බැණුම් අසා සිටි සේක. බමුණාගේ බැණුම අවසන් වූ පසුව ඔහුට කතා කොට, බමුණ, ඔබ වෙත නෑ මිතුරෝ අමුත්තෝ ඉඳහිට එන්නේ දැයි ඇසූ සේක. එසේ ය.

ඔවුනට ඔබ කන බොන දෑ දෙත් ද?

එසේ ය.

බමුණ ඔබ ඔවුනට දෙන ඒ දෑ ඔවුන් නො පිළිගත්තොත් ඒවා කාට අයත් වෙත් ද?

වෙන කාට ද? ඔවුන් ඒවා නො පිළිගත්තේ නම් ඒවා අපට ම යි.

බමුණා එසේ කී කල, භාග්‍යවතුන් වහන්සේ ඔහුට කතා කොට බ්‍රාහ්මණයෙනි, අප ඔබට බැණුමක්, කිපීමක්, කළහ කිරීමක් නොකර නිහඬ ව සිටිද්දී ඔබ අපට අක්‍රෝස පරිභව කළේ ය. ඔබගේ ඒ ආක්‍රෝශ පරිභව අපි නො පිළිගනිමු. ඒවා ඔබට ම ආපසු ලැබෙයි.

බ්‍රාහ්මණයෙනි, ආක්‍රෝශ කරන්නාට පෙරළා ආක්‍රෝශ කරන්නා ද, කිපෙන්නාට පෙරළා කිපෙන්නා ද, කලහ කරන්නාට පෙරලා කලහ නගන්නා ද ඒ තැනැත්තා අනෙකාත් සමඟ එකතුව ඒවා වළඳන්නෙකි. අප ඔබ හා එකතුව නො වළඳමු. ඔබ කී දෑ ඔබ කරා ම පැමිණේ යැ'යි වදාළ සේක.

ගෞතමයෝ රහත් කෙනෙකැ'යි රජුත් රට වැස්සාත් පිළිගෙන ඇත. එහෙත් ශ්‍රමණ ගෞතමයන් කිපෙන බවක් මට හැගේ යැ'යි බමුණා පැවසී ය.

භාග්‍යවතුන් වහන්සේ, ශාන්ත වූ සංසුන් පැවැතුම් ඇති මනා වූ නුවණින් දැන සියලු කෙලෙසුන්ගෙන් මිදුණු ලාභ අලාභ, නින්දා ප්‍රශංසාදී අට ලෝ දහමින් නො සැලෙන ස්ථිර ගුණ ඇති ක්‍රෝධ නො කරන රහතකු තුළ ක්‍රෝධයක් කොයින් ද? යි වදළ සේක.

කිපුණහු හට පෙරළා කිපෙන්නා ඒ පළමු වැන්නාට වඩා ලාමක ය. කිපුණාහුට නො කිපෙන්නා ලෙහෙසියෙන් දිනිය නො හැකි යුද්ධයකින් දිනුවෙක් වෙයි.

අනෙකා කිපුණා දැක සිහි ඇති ව ඉවසන තැනැත්තා තමාටත් අනෙකාටත් යන දෙදෙනාට ම අභිවෘද්ධිය සළසන්නෙකි. මෙසේ ඉවැසීමෙන් තමාටත් අනුන්ටත් යහපත සළසන්නාට ධර්මය නොදන්නා අන්ධබාලයා "මෝඩයෙකැ'යි හැඟෙයි යැ යි වදාළ සේක.

මේ කතාව අසා සිටි, මුල දී භාග්‍යවතුන් වහන්සේට ආක්‍රෝශ පරිභව කළ ඒ භාරද්වාජ බමුණා පැහැදී තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය. ඉක්බිති පැවිද්දත් උපසම්පදාවත් ඉල්ලී ය.

භාග්‍යවතුන් වහන්සේ ඔහු ද පැවිදි උපසපන් කළ සේක. හේ විදසුන් වඩා නොබෝ කලෙකින් සියලු කෙලෙස් නසා රහත් විය.

දීපා

# වෙස් මුහුණු යට සැඟවුණු මුහුණු

**බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද මංගල සූත්‍රයෙහි සඳහන් උතුම් මංගල කරුණු තිස් අටෙන් පළමු කරුණ වන්නේ බාලයන් ආශ්‍රය නොකිරීම ය. එය සැනසීමට හේතු වේ.**

“බාල“ නම් වයසින් බාල කුඩා දරුවන් හෝ ළමයින් හෝ නොවේ. ගුණයෙන් හා නුවණින් මඳ පුද්ගලයන් ය. පව් කරන්නන් ය. “කතාවට, යන්න එපා. ආශ්‍රය කරන්න එපා. ඔය මනුස්සයා ළඟටවත් යන්න එපා. පව්කාරයෙක්.“

තමන්ගේ චරිතයට මෙවැනි තිගාවක් කරනවාට ඔබ කැමැති වෙන්නේ නැහැ නේද?.

එසේ නම් පස්පව් දස අකුසලයන්ගෙන් බැහැර වුණු අයෙක් බවට පත්විය යුතු ය. බාලයෙක් වන්නට, ඇසුරට නුසුදුසු පුද්ගලයෙක් වන්නට හේතුවන කරුණු කීපයක් හඳුනා ගනිමු. ප්‍රාණඝාතය , සොරකම,. වංචා හා කපටිකම් කිරීම. ඉන්ද්‍රියයන්හි අසංවර බව හා අශීලාචාර චරිතයකින් යුතු පුද්ගලයෙක් වීම. බොරු කීම. ඵරුෂ වචන කීම. කේලම් කියා පුද්ගලයන් අසමඟි කිරීම. බොරු පොරොන්දු දීම. දුන් පොරොන්දු කඩකිරීම. අන් අයට නිකරුණේ අවමන් කිරීම. නින්දා කිරීම. මත්වතුර සහ මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වීම. ආදී කරුණු මූලික වශයෙන් සඳහන් කළ හැකි ය.

මේ කියූ ලක්ෂණයන්ගෙන් යුතු පුද්ගලයකුගේ චරිත ස්වභාවය පිළිබඳව බුදුරජාණන් වහන්සේ ධර්මයෙහි මේ ආකාරයෙන් සඳහන් කරයි.

“මේ ලෝකයෙහි බාල තෙමේ නපුරු සිතිවිල්ලක් ම සිතන්නේ ය. නපුරු වචනයක් ම පවසන්නේ ය. නපුරු දෙයක් ම කරන්නේ ය. මේ ආකාර දුර්ගුණයන්ගෙන් යුතු පාපී පුද්ගලයකු සමඟ දැන හෝ නොදැන ඇසුරට යොමු වුවොත්, යම් විටක කවර තත්ත්වයේ පුද්ගලයකු වුව ද නුවණින් විමසා බලා කටයුතු නොකළහොත් පිරිහීමට මෙන් ම විනාශයට ද පත්වන්නේ ය.

මේ පිරිහීමේ හා විනාශයේ තරම කෙතරම් ද යත් කාරුණික හදවතක් ඇත්තෙක් අකාරුණික වූ වධකයකු බවට පත්විය හැකි ය. ඒ වගේ ම පරිත්‍යාගශීලි අයෙක් නම් මසුරු බවට පත්විය හැකි ය.

සංවරශීලි හා නීතිගරුක පුද්ගලයෙක් අසංවර හා අනීතිකව සමාජයට විපත්තිදායක කෙනෙක් බවට පත්වීම වැළැක්විය නොහැකි ය.

“අජාසත් කුමරු පෙර යහපත් දරුවෙකි. එහෙත් දෙව්දත් තෙරගේ නරක ඇසුර නිසා ඔහු පීතෘ ඝාතකයෙක් බවට පවා පත්විය. ‘සත්ථිකුම්භ‘ ජාතක කතාවේ එන “ගස්බෙනයක සිටි ගිරා පැටවුන් දෙදෙනා සුළඟකට ගසාගෙන ගොස් දෙපැත්තකට වැටුණි. එක් පැටවෙක් සොරුන් පිරිසකගේ ඇසුරටත් අනෙක් පැටවා තාපසයන්ගේ ඇසුරටත් පුරුදු විය. සොරුන්ගේ ඇසුර ලැබූ ගිරවා පරුෂ වචන කතා කිරීමටත්, තාපසයන්ගේ ඇසුර ලැබූ ගිරවා මිහිරි, ඉතා ප්‍රිය වචන කතා කිරීමටත් පුරුදු විය.



එමෙන් ම එකම අම්මාගේ කුසින් හා එකම පියාණන්ට දාව උපන් සොහොයුරු සොහොයුරියන් අතර ද ඇසුර හේතුකොටගෙන විවිධ වෙනස්කම් ඇතිවන බව අප බොහෝ ලෙසින් දැක ඇත. ඒ වගේ ම අසා ඇත.

අපගේ ඇසුරට නුසුදුසු වන්නේ කවර ගති ලක්ෂණ ඇති අය දැයි සිඟාලෝවාද සූත්‍රෙය් දී පෙන්වා දී ඇත. එක් අයෙක් වන්නේ මිතුරාට කිසිවක් නොදී නිතරම මිතුරාගෙන් යමක් ලබා ගන්නට උත්සාහ කරන තැනැත්තා ය. ඔහුගේ හෝ ඇයගේ ස්වභාවය වන්නේ කිසිවක් රැගෙන නොපැමිණ මිතුරාගෙන් යමක් රැගෙන යෑමයි. තමාට අවශ්‍යතාවයක් හෝ බියක් සැකයක් ඇති වූ විට පමණක් මිතුරා වෙතට පැමිණේ. ස්වල්පයක් දී බොහෝ දේ බලාපොරොත්තු වේ. තමාගේ ලාභය සඳහා ම මෙසේ ඇසුරු කරන්නා අඤ්ඤදත්ථුහර නම් වේ. වචනයෙන් පමණක් සංග්‍ර කරන්නේ වචීපරම මිතුරා ය.

> **යමෙක් කුසතණවලින් කුණු මස් ඔතයි ද එය ම හේතුකොටගෙන ඒ කුස තණ ද දුගඳ හමයි. බාලයා ඇසුරු කරන පුද්ගලයා ද දුර්ගන්ධවත් වන්නේ එලෙසින් ය.**

උපකාරයක් ඉල්ලූ විට ඊයේ හෝ දින කිහිපයකට පෙර කීවානම් කරන්නට තිබුණා යැයි පවසා අතීතයෙන් සංග්‍රහ කරන අය ඔබට මොනතරම් හමුවී තිබෙනවා ද? අනාගතයේ උපකාර කරම්‘යි අනාගතය දක්වා වචනයෙන් ම පමණක් සංග්‍රහ කරන අය මොනතරම් ද?. උපකාරයක් ඉල්ලූ විට නැති බැරිකම් කියා මඟහරින අයත් එසේ ම යි. ඔවුහු ප්‍රයෝජනයක් ලැබිය නොහැකි නිරර්ථක හෝ රැවටිලි කතාවෙන් සංග්‍රහ කරති.

තමාගේ ලාභය හා යහපත පිණිස මිතුරාගේ හොඳ හෝ නරක සියලු දේ අනුමත කරන අයත් වෙති.. මිතුරා පාපයක් කිරිමට සූදානම් වන විට එය ද අනුමත කරයි. යහපතක් කරන විට එය ද අනුමත කරයි. මිතුරා ඉදිරියේ දී නැති ගුණ කියමින් වර්ණනා කරන අතර මිතුරා නැති තැන අගුණ කියයි. මේ අනුප්පියභාණී මිතුරාගේ ස්වභාවයයි. මෙවැන්නන් හඳුනවා ගැනීමට සමත් විය යුතු ය.

අපාය සහායක මිතුරා සුරාවට කැඳවාගෙන යයි. අවේලාවෙහි තැන් තැන්වල කැඳවාගෙන යයි. නිතර ධනය වියදම් කරවන විනෝදවීම්වලට ම යෑමට උනන්දු වෙයි. සූදුවට පුරුදු කරයි.

මේ ආකාරයෙන් බාල හෙවත් නරක පුද්ගලයන්ගේ ගති ලක්ෂණ නුවණින් දැක පළමුව තමා යහපත් කෙනෙක් වීමට උත්සාහ කරන්න. අනතුරුව තමන් හා සම, ඊටත් වඩා යහපත් ගුණ ඇති පිරිසක් සමඟ ආශ්‍රය කරන්නට උත්සාහ කරන්න. එදිනෙදා ජීවිතයේදී පිළිවෙත තුළ තමන්ට සාර්ථක ජීවිතයක් අත්පත් කරගත හැකි වෙයි. යහපත්, අයහපත් සියලු දෙනා සමඟ කටයුතු කිරිමට සිදු වේ. එවන් අවස්ථාවක දී යමකුගේ යහ ගුණයන්ට බැඳී යමකුගේ දුර්ගුණවලට හසු නොවීමට තරම් කල්පනාකිරී විය යුතු ය. ඒ වගේ ම ඔබ යහපත් කෙනෙක් ව සමාජයේ, කාර්යාලයේ දී පමණක් නොව මහ මඟ දී, බස් රිය හා දුම්රියේ දී පවා කල්පනාකාරී විය යුතු බව සිහි තබා ගන්න.

වංචාකාරී, මායාකාරී හා නපුරු පුද්ගලයන්ට රැවටී වටිනා තරුණ ජීවිත විනාශ කරගත් තරුණ දියණිවරුන් මෙන් ම පුතණුවරුන් බහුලව සමාජයේ දක්නට ලැබේ.

“පාපා නිවාරෙන්ති“ ලෙසින් දක්වා ඇති පරිදි මව්පියන් විසින් තම දරුවන් කුඩා කල සිට අයහපත් ඇසුරෙන් මෙන් ම පවින් වැළක්වීමට උත්සාහ ගැනීම උතුම් වගකීමක් මෙන් ම යුතුකමක් ද වේ.

ගුණයෙන් උසස් පුද්ගලයෙක් හෝ තමාට ගැලපෙන ගුණ ඇති පුද්ගලයෙක් ඇසුරු කරන්න. එවැනි පුද්ගලයෙක් ඇසුරට නොලැබුණොත් හුදකලාව වාසය කිරීම යහපත් ය. බාලයාගේ ඇසුර පිරිහීමට හා විනාශයට හේතුවන බව තථාගත ධර්මයේ පෙන්වා දී ඇත.

“යමෙක් කුසතණවලින් කුණු මස් ඔතයි ද එය ම හේතුකොටගෙන ඒ කුස තණ ද දුගඳ හමන්නේ ය. එසේම බාලයා ඇසුරු කරන පුද්ගලයා ද දුර්ගන්ධවත් වන්නේ එලෙසින් ය.“

දීපා පෙරේරා

**මුලතිව් වඩ්ඩමාන පර්වත විහාරයේ මුරකුටිය සහ චෛත්‍යය සංරක්ෂණය කරගැනීමට මහජන ආධාර පතයි.**
**ගල්ගමුවේ ශාන්ත බෝධිතෙර.**
0774578791/ 0772036151

**හිම්නමකට ශ්‍රවණාධාරයක් අවශ්‍යයි.**
**අවු 75 මා හට කන් ඇසීම දුර්වල නිසා ශ්‍රවණාධාරයක් පරිත්‍යාග කිරීමට හෝ රු. 52,000/- මුදලක් ලබා දෙන්න.**
**0714-784141**

**කුලියාපිටිය දියතලාමුල්ල ශ්‍රී රතනජෝති පදනම මගින් පාලනය වන ළමා නිවාස හා වැඩිහිටි නිවාසය සඳහා නිවාස පාලිකා / මාතා තනතුරු වෙනුවෙන් අයදුම්පත් භාර ගැනේ.**
වෘත්තීය සුදුසුකම් සහිතව ගරු සභාපති නාහිමිපාණන් නමට යොමු කරන්න. 0763741132

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
ඇසළ අමාවක 2021.08.08

## යහපත මතකයේ රැඳීමට...

දිනක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි එක්තරා බමුණෙක් 'ස්වාමීනි', භාග්‍යවතුන් වහන්ස, මම බොහෝ දේ දැන ඉගෙන තිබෙමි. පාඩම් කර ඇත්තෙමි. එහෙත් දැන් ඒවා මතකයට නොනැඟෙන්නේ ය. ඒ කුමක් නිසා ද."යි විමසුවේ ය.

එහිදී බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ යම් දෙයක් මතකයේ රඳවා ගැනීමට හා නැවත නැවත සිහිපත් කිරීමට අපහසු වන්නේ පංච නීවරණයන්ගෙන් අපේ සිත වෙළී පවතින නිසා බව ය.

සමාජයේ බොහෝ දෙනකුට සිදුව ඇත්තේ ද මේ බමුණාට සිදුවී ඇති දෙයම ය. සාමාන්‍යයෙන් කුඩා කල සිට වයෝවෘද්ධ වී මිය යනතුරුත් අපි ධර්මයට සවන් දෙමු. දැන ඉගෙන ගනිමු. අන් කවර කලෙකටත් වඩා මෙකල ධර්මය අසන්නට, දැන ඉගෙන ගන්නට අවස්ථාව ද ලැබේ. බොහෝ පිරිසක් ඊට යොමුවී ඇති බව ද පෙනෙන්නට තිබේ.

එහෙත් ඒ දහම් කරුණු ජීවිතයට ප්‍රායෝගික වන බවක් පෙනෙන්නට නැත. බොහෝ ක්‍රියාකාරකම් කිසිදු දහම් පදයක් නො ඇසූ ගණනටය. සමාජ ක්‍රියාකාරකම් පසෙක තබා තමන්ගේ සිතිවිලි හා හැසිරීම් ගැන අවංකව විමසීමෙන් ඒ බව අවබෝධ කර ගැන්ම අපහසු නැත.

තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළේ උන්වහන්සේට කරන ඉහළම ගෞරවය ඉහළම පූජාව ප්‍රතිපත්ති ගරුකවීම වන බව ය. සම්බුදු දහමේ අපට අපූර්ව ප්‍රතිපදවක් හඳුන්වා දී තිබේ. තමන්ගේ මෙලොව ජීවිතය සේ ම මරණින් මතු ජීවිතය ද අර්ථ සම්පන්න කර ගැනීමට එය අමිල දයාදයකි.

එද බුදුරජාණන් වහන්සේ බමුණාට පැහැදිලි කොට වදාළ නීවරණ නම් සිත අපිරිසුදු කරන, කුසල් සිතිවිලිවලට බාධා කරන සිතිවිලි ය. ඒ පිළිබඳ හොඳ අවබෝධයකින් කටයුතු කරනවා නම් තමන්ට අනර්ථයක් නොවී ප්‍රතිපත්ති ගරුක අනුන්ට ද අනර්ථයක් නොවී යහපත් ජීවිතයක් ගත කිරීම අපහසු වන්නේ නැත.

විශේෂයෙන් එය වර්තමාන සමාජයට බෙහෙවින් වැදගත් ය. එසේ කියන්නේ වැඩි පිරිසක් වෙතින් ඇසෙන්නට පෙනෙන්නට තිබෙන බොහෝ ක්‍රියාකාරකම් තුළ සමාජය ම පීඩාවට පත්වන නිසා ය.


'කාමච්ඡන්දය' දැන උගත් දේ අමතක කරන ප්‍රබල නීවරණයකි. එනම් කාම වස්තූන් පිළිබඳ ඇති බලවත් කැමැත්ත ය. තණ්හාව ය. එවැනි අවස්ථාවක එවැනි වස්තූන් තමන් සතු කර ගැනීමේ අරමුණ මිස යහපත අයහපත සිහි වන්නේ නැත.

ව්‍යාපාදය හෙවත් තරහ සිතිවිලිවලින් පිරුණු පුද්ගලයාගේ ද මතකය දුර්වල ය. එවැනි පුද්ගලයකු වෙතින් අර්ථයක්, යහපතක් බලාපොරොත්තු විය නොහැකි ය.

ඇතැම් අය නිරන්තරයෙන් නිද්‍රාශීලි ය. එවැන්නන්ට ද දැන උගත් යහපත් දෙය මතකයට නොනැඟේ. සිතේනොසන්සුන්කම උද්ධච්ච කුක්කුච්චයයි. එනම් සිතේ කැළඹීමයි. කළ හා නොකළ දේ පිළිබඳ ඇතිවන පසුතැවීමයි. කැළඹුණු ජලයෙහි කිසිවක් පැහැදිලි නොවන්නා සේ මේ පුද්ගලයාගේ ද අරමුණු අපැහැදිලි ය. මතකය අවදි නොවන්නේ ය. විවිධ දේ ගැන සිතෙහි වන සැකය විචිකිච්චාව ය. එවිට ද යහපත් සිතිවිලි මතකයට නොනැඟේ. මේ නීවරණ ගැන හොඳින් අවබෝධ කොට ඒවා දුරු කළ යුතු, ප්‍රහාණය කළ යුතු යහපත් පුද්ගලයකු වීමටය. යහපත් හැසිරීම්, ඇති වන්නේ යහපත් සිතිවිලි උපදින්නේ නම් ය. එහෙයින් ඒවා උපදින්නට ඇති අවහිරතා මඟ හැරගත යුතුය. ඒ සැබෑ ලෙසම තෙරුවන් සරණ ගිය පුද්ගලයා ගේ ස්වභාවය යි.

# මව්පිය දූදරු ගැටලු අනවබෝධය නිසයි

**වත්මන් තරුණ පරපුර ගැන මැසිවිලි නඟන මව්පියන්ගේ ප්‍රධාන පැමිණිල්ලක් නම් තම දරුවන් අනිසි සබඳතා ඇති කර ගෙන සිටීම ය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් මානසික මට්ටම බලපායි.**



කොළඹ බෞද්ධාලෝක මාවත
නාරද බෞද්ධ ධර්මායතනාධිපති
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**තලල්ලේ චන්දකිත්ති හිමි**

ඇතැම් තරුණ අය තමාගේ සම්බන්ධතාව සමාජයේ ජීවත්වීමට අවශ්‍ය දෙයකැයි සලකති. නොඑසේ නම් තරුණකමේ ලක්ෂණයකැයි සලකති. තරුණ වයස යනු විවිධ පරිවර්තන ඇති වන යුගයකි. එහිදී "ආදරය" පිළිබඳ ව අදහස් බහුල වශයෙන් ඉස්මතු වේ. එබඳු අවස්ථාවක දී දෙමාපියන්ගේ අවධානය බෙහෙවින් අවශ්‍ය වේ. නැතිනම් නම් වහා තමන්ගේ අදහස තහවුරු කිරීමට තරුණයා හෝ තරුණිය උත්සුක වේ.

එසේ නම් අදහස තහවුරු කර ගත් පසු දෙමාපියන් කෙතරම් අවවාද කළත් දඬුවම් කළත්, විරෝධය ප්‍රකාශ කළත් එය නවතාලිය නොහැකි ය. එසේ අනිසි සබඳතා ඇතිකර ගන්නේ බොහෝ විට අසීමිත නිදහසක් ලත් අය යි. එමෙන්ම ඉතා සීමිත වූ නිදහසක් ඇති අය යි.

අසීමිත නිදහස ඇති අය පීඩිත ස්වභාවයෙන් මිදුණු විගස ම එබඳු ක්‍රියාවන්හි පැටලෙති. දරුවනට නිදහස ලබා දිය යුතු අතරම ඔවුන් සමාජයේ කරනුයේ කුමක්දැයි සොයා බැලීමටත් දෙමාපියන් විමැසිලිමත් වියයුතු ය. ගුණ ගරුක දූ දරුවන් එබඳු අදහසක් සිත තුළ ඇති වූ විට දෙමාපියනට දැන්විය යුතු ය. තමන්ට කීමට අපහසු නම් ඒ සඳහා වෙනකෙකු යොදවා ගත හැකිය. දෙමාපියන් අකැමැති වුවහොත් ඒ අදහස් සිතින් ඉවත් කළ යුතු ය.

ඉගෙන ගන්නා වයසේ දී විවිධ සබඳතා ඇති කර ගැනීම අනාගත දියුණුවට විශාල බාධාවකි. එබඳු ඇත්තන් ඉගෙනීමට වඩා කාලය යොදවන්නේ වෙනත් ක්‍රියාවන්ට ය. එමනිසා ගුණගරුක දූ දරුවන් ඉගෙන ගන්නා කාලය ඒ සඳහා ම කැප කරන්නට උත්සාහවත් වුවහොත් එය මාපිය සිත් සතුටු කිරීමකි.

දූ දරුවන් විවිධ සම්බන්ධතා ඇති කර ගත්තාට පසුව ඒ ගැන සිතමින් ළතවනවාට වඩා එබඳු දෙයක් නොසිදුවන්නට වගබලා ගත යුතුය. ඔවුන් පිළිබඳව අවධානය නිතර යොමු කළ යුතුය. දරුවන්ට සමාජය පිළිබඳ නිවැරැදි අවබෝධයක් සහ ඔවුන් කෙරෙහි තමන් දක්වන ආදර කරුණාව අවබෝධ කර දුනහොත් ඔවුහු ලෙහෙසියෙන් එබඳු සබඳතා ඇති කර නොගනිති. ඔවුහු දෙමාපියන්ගේ සිත් දුකට පමුණුවන්නට උත්සුක නොවෙති. තමන්ගේ අභිවෘද්ධිය සඳහා දෙමාපියන් වෙහෙසෙන ආකාරය පිළිබඳව හොඳ අවබෝධයක් ඔවුන් සතුව පවතින බැවිනි.

බොහෝ මව්වරු දරුවන් තමන්ගෙන් වෙන්ව ගිය පසු බොහෝ කම්පාවට පත්වෙති. තම දරුවා ගැන හිතමින් විවිධ පුද පූජා තබමින් දෙවියන්ට ද කන්නලව් කෙරෙති. දරුවා සිටින විට විවිධ අපහසුතා ඇති කළත් නැති වූ පසු හදවතින් ම දුක් වෙති. එහෙත් වඩාත් වටිනුයේ කල් ඇතිව තම දරුවන් පිළිබඳ නිසි ආකාරයෙන් පිළිපැදීම යි.

දරුවන් සුමගට යොමු කිරීම යි. දරුවන් නොමඟ ගිය පසු ඔවුන් ආගමට නැඹුරු කරවන දෙමව්පියවරු සමාජයේ අප්‍රමාණව සිටිති. කෙනෙකු නොමඟ ගිය පසු සුමඟට ගැනීම ද පහසු කරුණක් නොවේ. දරුවන් ආගම දහමට නැඹුරු කළ යුත්තේ නොමඟ ගිය පසු නොව ඉතා කුඩා අවධියේ සිට ය. කුඩා කල සිට ආගමික පරිසරයක හැදුණු වැඩුණු දරුවෝ සුමගට යති. එහෙයින් දරුවන්ට ආගමානුකූල පරිසරයක් හදා දීම මවුපියන්ගේ වටිනා යුතුකමකි.

දරුවන් දහම් පාසලට එවන මව්පියවරු පන්සල් නො එති. ධර්මකාමී නො වෙති. දරුවන් දහම් පාසල් යැවීම ආදි ආගමික ක්‍රියාවන්හි යොදවා දෙමාපියන් විවිධ නොමනා ක්‍රියා කරන්නේ නම් එය එම දරුවන්ට කරන විශාලම අසාධාරණයකි.

දරුවන් ආගමානුකූලව හැඩගස්වනවා සේ ම තමන් ද එසේ හැඩ ගැසිය යුතු ය. එසේ කළහොත් හොඳ ප්‍රතිඵල ලැබෙනු නො අනුමාන ය.

දරුවන් හදන වඩන දෙමාපියන් තම දූ දරුවන්ට ආගමික හැදියාවක් ලබා දියයුත්තේ ඔවුන් හොඳ පුරවැසියන් කරන අදහසින් මිස අධ්‍යයන ඉලක්ක සපුරා ගැනීමට නොවේ. දහම් පාසල ළමයින්ගේ සුචරිත වර්ධනය සඳහා කැප වූ එකකි. එහිදී කල්‍යාණ මිත්‍ර සේවනය ඉතා ඉහළින් ලැබිය හැකි ය. පාප මිත්‍රයන් බහුල සමාජයක කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නට ලැබීම ද ජීවිතය සාර්ථක කර ගන්නට මහෝපකාරි වන්නකි.

පවුලක් යනු ලොව ඇති කුඩා ම සමාජ ඒකකය යි. සමාජයක රඳා පැවතීම, දියුණුව සිදුවන්නේ එහි සිටින සාමාජිකයන්ගේ සහයෝගය මත ය. එමනිසා පවුල් සමාජයේ සිටින සාමාජිකයන් අන්‍යෝන්‍ය අවබෝධයෙන් සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ඔවුනොවුන් කෙරෙහි පවත්නා විශ්වාසය මෙහිදී අතිශය වැදගත් වේ. සෑම මවක ම පියෙකු ම තම දරුවන්ට සිටින විශ්වාසී වූ තැනැත්තිය, තැනැත්තා විය යුතුය. ඒ සඳහා දරුවන් සමග යහළු විය යුතුය. තමන්ගේ ළඟ කිසිදු රහසක් නැති බව දරුවන්ට ඒත්තු ගැන්විය යුතුය. දරුවන්ගේ දුකෙහිදීත් සැපෙහිදීත් නොවෙනස් ව සිටින්නේ තමන් බව ඔවුන්ට අවබෝධ වන අයුරින් කටයුතු කළ විට දරුවෝ දෙමාපියනට හොරෙන් කිසිම දෙයක් කරන්නට නො පෙළඹෙති.

තමන් සිතට ආ සියල්ල දෙමාපියන්ට හෙළි කිරීමට එම දරුවා මැළි නොවේ.

පවුලේ සිටින එක සාමාජිකයෙක් හෝ තම යුතුකම් පැහැර හැරියහොත් නිවසේ සාමය සහජීවනය බිඳී යාමට එය ඉවහල් වේ. නිවසේ භාවිත වන වචන, ඔවුන්නොවුන්ගෙන් චින්තන රටාවන්, ක්‍රියාවන් සියල්ල නිවසේ සාමය සඳහා බෙහෙවින් උපාකරි වේ. දෙමාපියන් දරුවන්ට කථා කළ යුත්තේ මෛත්‍රියෙන්, කරුණාවෙන් , සුවඳ කැවුණු වදන් ය. දරුවන් දෙමාපියන්ට කථා කළයුත්තේ ගෞරව මිශ්‍රිත වදන් ය. එය දූ දරු දෙමාපිය සබැඳියාවට බෙහෙවින් උපාකර වේ. බොහෝ නිවෙස්වල මව පියා හා අමනාපය, පියා මව හා අමනාප ය දරුවනුත් දෙමාපියන් හා අමනාප ය. දරුවන් ඔවුනොවුන් හා අමනාප ය මේ තත්ත්වය යටතේ එබඳු නිවෙසක සතුටක් සහනයක් පවතී ද? මේ පසුබිම යටතේ කිසිම නිවසක සාමයක් සතුටක් රඳා පැවතිය නොහැකි ය. එය බිඳුණු විසිරුණු පවුල් ඒකකයක් බවට පත්වේ. කායිකව ජීවත් වුවත් මානසිකව සිය දහස් වරක් මැරි මැරි උපදින සාමාජිකයන්ගේ සභාවක් බවට එම නිවස පත්වේ.

# මාර ප්‍රශ්නයට පිළිතුරක්

**මාරයා යනු කවුරුන් ද? ඔහුට පණ තිබේ ද? සත්‍ය වශයෙන් ම අපට බලපෑම් කළ හැකි ද? යනු පොදු මහත් සමාජය ම තුළ පවතින ප්‍රශ්න සමුදායකි. එකී මාර ප්‍රශ්නයට පිළිතුරු දෙන්නෝ ද විවිධ අදහස් දක්වති. මෙනිසා මරු හෙවත් මාර ගැන ඔබ දැනුවත් කිරීම සුදුසු වන බව අපගේ අදහස යි.**

මාර නොහොත් මරු යන වදනෙහි අරුත කුමක් ද? යන්න ප්‍රථමයෙන් ම විමසා බලීම සුදුසු ය. මාර යන්නට විවිධ අරුත් දැකගත හැකි ය. මරන්නා, මාරයා, මරණය, කාමදේව, ආදි වශයෙනි. මෙකී අරුත් දෙස තරමක් ඕනෑකමකින් බලන ඕනෑ ම කෙනෙකුට හැඟී යන්නේ කිසියම් වූ විනාශකාරී අදහසක් ගැබ්ව ඇති බව යි. කෙටියෙන් ම කිවහොත් මාරයා යනු ද විනාශකාර දෙයකි. කෙනෙකි. සත්ත්වයන් අයහපතෙහි යොදවා මරන හෙයින් මාර නම් වන බව ද පාලි සාහිත්‍යයේ දැක්වේ.

අප මහා ගෞතම බුදුන් වහන්සේ සත් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් තුළ එක් ලක්ෂ විසිපන්දහසක් තථාගතයන් වහන්සේලා දැක බුදු බව පතා මනෝ ප්‍රණිධානය පිරූහ. තවත් නව අසංඛ්‍ය කල්ප ලක්ෂයක් තුළ තුන් ලක්ෂ සත් අසූ දහසක් අබිමුව වාග් ප්‍රණිධානය සම්පූර්ණ කළහ. එසේ ම සාරාසංඛ්‍ය කල්පයක් කාය – වාග් ප්‍රණිධානය පුරා සම්බුද්ධත්වය අවබෝධ කළහ.

මාරයාගේ ආගමනය බෝසතුන්ගේ මෙකී දිගු ගමනේ අවසන් ආත්ම භාවය වූ සිද්ධාර්ථ කුමාර ආත්ම භාවයේ පමණක් නොව මුළු මහත් ගමන පුරාවට ම සිදු වූවකි. බුදු දහම තුළ විවිධ මාරයෝ දැකගත හැකි ය.පඤ්චමාර යනුවෙන් එය හකුළා දැක්විය හැකි ය.

මාරයා හට පණ තිබේ ද නැද්ද යන්න විමසීමට පෙර උක්ත මාරයෝ පිළිබඳ දැන සිටීම සුදුසු වේ. එවිට ඔබට ම මාරයාගේ සජීවී අජීවී භාවය අවබෝධ කරගත හැකි ය. පඤ්චමාර යනුවෙන් මාරයෝ පස් ආකාරයකින් දැක්වේ.

**දෙවපුත්තමාර** – යහපතට විරුද්ධ වූයේ දෙවපුත්තමාර නම් වේ. වසවත්ති මාරයා යනු ද මොහු ම යි.

**ක්ලේශමාර** – ලෝභ, දෝස, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්චාදි කෙලෙස් තුදුසක් (14) ඇත. විස්තර වශයෙන් මෙම කෙලෙස් දහහතර ඇතැම් තැනක එක් දහස් පන්සියයක් දක්වා දීර්ඝව විග්‍රහ වෙයි. එකී කෙලෙස් සත්ත්වයාගේ යහපත නසා අයහපතෙහි යොදවන හෙයින් මාර නමින් දැක්වේ. බුදු පසේ බුදු සහ අරහත් උතුමෝ මෙකී සියලු කෙලෙස් නැසූ හෙයින් ක්ලේශ මාරයා පරාජය කොට ඇත්තා හ.

**අභිසංඛාරමාර** – කුසලා'කුසල සිත්වල යෙදෙන චේතනාව අභිසංඛාර නම් වේ. භවයක් පාසා ජාති, ජරා, මරණාදිය ඇති කරවමින් සත්ත්වයා විපතට පත් කරවන හෙයින් අභිසංඛාරමාර නම් වේ.

**ඛන්ධමාර** – පඤ්චස්කන්ධය (නාම රූප) ඛන්ධ නම් වේ. මෙම පඤ්චස්කන්ධය ක්ෂණයක් පාසා නැසෙන හෙයින් ඛන්ධමාර නම් වේ.

**මච්චුමාර** – මරණය මච්චු නම් වේ. ජීවිතින්ද්‍රියාගේ සතුරා මරණය යි. ජීවිතින්ද්‍රිය බිඳීමෙන් සිදු වන මරණය මච්චුමාර නම් වේ.

ඉහත සඳහන් කළ මාර වර්ගීකරණය අනුව දේවපුත්ත මාරහට හැර අන් සිව් වැදෑරුම් මාරයනට ම පණ නැති බව කාටත් තේරුම් යන සත්‍යයකි. දේවපුත්තමාර නොහොත් වසවත්ති මාරයාට පණ ඇති බව අපගේ වැටහීම යි. ඒ බව පහත නිදසුන් මඟින් අවබෝධ කරගත හැකි ය.



බුදුන් වහන්සේ අබිමුවට විටින් විට මාරයා පැමිණි බව ධර්ම සාහිත්‍යයේ සඳහන් වේ. මහාභිනිෂ්ක්‍රමණය කරන මොහොතේදී ම වාහල්කඩ සමීපයට මාරයා ආ බව කියැවේ. ඉන් පසු චතුරංග සමන්නාගත වීර්යයෙන් යුතුව බෝ මැඩ අසළ වැඩ සිටින විට ද මාරයාගේ පැමිණීම විය. සහම්පතී මහා බ්‍රහ්මයා බෝ සතුන්ට ශ්වේත ඡත්‍රය උසුලා සිටී. අසූ හාරදහස් කන්‍යාවන් වට කරගත් මහාකාල නාග රාජයා තුති ගී ගයන්නට විය. ශක්‍රාදි දෙවියෝ ආසරි පැතුම් ගෙනාහ. සෙසු දෙවියෝ දිවමල් දිවසුන් ඉසින්නට විය. නමුත් ක්ෂණයකින් සියල්ල වෙනස් විය. මුළු පරිසරය ම අන්ධකාරයෙන් වෙළුණි.

උල්කාපාතයෝ වැටෙන්නට වූහ. ගල්, වැලි, ගිනි ආදි නව විධ වරුෂා ඇදහැලෙති. පෘථිවිය සැලෙයි. බියට පත් දෙවියෝ බුදුන් වහන්සේ තනි කොට පළා යති. මහබඹු සක්වළ ගල මුව විට තබා දුවයි. වරෙව්, සිද්ධාර්ථයා මරව්; පරසක්වල ගසව් යන බියකරු වදන් කියමින් ගිරිමෙඛලා ඇතුපිට නැගී මාරයා බුදුන් වහන්සේ ඉදිරියට පැමිණියේ ය. තෙල වජ්‍රාසනය තොපට අයිති නැත. මෙයින් බැස පළා යවයි මරහු කීහ.

මම මෙතනින් නො නැඟිටිමි. සපරිවාර මාරයා දැක මම බිය නො වෙමි.මෙතැනින් මා සොලවන්නටවත් තොපට නොහැක.

බුදුන් වහන්සේ පොළව දෙසට දක්ෂිණ ශ්‍රී හස්තය දිගු කළහ. පොළව කම්පා විය. මාරයා බිය විය. මාර සෙනඟ හිස් ලූ ලූ අත දුවන්නට වූහ.පැරැදී පලා ගිය වසවත් මරු තෙම දූවරුන්ට මෙම සිද්ධිය කීය. 'අරහත් වූ සුගත තුමූ මාගේ විෂයය ඉක්මවා ගියහ. එනිසා මම දුකින් සිටිමි.'

මාර දූවරු බුදුන් වහන්සේ අබියසට ගොස් ක්‍රමෝත්පාදනය වන අයුරින් රඟ දෙන්නට වූවෝ ය. එහෙත් බුදුන් වහන්සේ කම්පාවකට පත් නො වූහ. මෙම මාර දූවරු යනු කවුරුන් ද යන්න වෙන ම සාකච්ඡා කළ යුත්තකි.

මාරයා පුද්ගලයෙක් ය; යන්න තහවුරු කරගැනීමට බොහෝ සාධක ඇත. මෙහි ලා මජ්ඣිම නිකායේ මාරතජ්ජනීය සූත්‍රය වැදගත් වේ. සැරියුත් මහ රහතන් වහන්සේගේ කුසට ඇතුළු වූ මරු උන් වහන්සේට හිංසා කරන්නට විය. මේ මාරයා බව දැනගත් සැරියුත් මහ රහතන් වහන්සේ මාරයා සමඟ සංවාදයක යෙදුනහ. උන් වහන්සේ ද සසර තුළ දූසි නමින් මාරයෙක් ව ඉපිද රහතන් වහන්සේ නමකට හිංසා කිරීම නිසා අවීචිමහ නරකයේ සහ ඔසුපත් නරකවල අනේක දුක් විඳි බව මාරයාට උන්වහන්සේ ම සඳහන් කළ බව මෙම සූත්‍රයේ දැක්වේ.

කළ කම් පල දීම කාටත් පොදු වූ ධර්මතාවකි. මාරයාටත් එය පොදු වූවා නම් වසවත්ති මාරයා යනු පුද්ගලයෙක් බව තේරුම් ගත හැකි ය.

දිනක් බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙරේ දම් දෙසමින් සිටියහ. එයට බාධා කරනු වස් මාරයා බුදුන් අභියසට ගොස් මෙසේ කීවේ ය.

සිව් පිරිස මැද නිර්භීතව සිංහයෙකු මෙන් නාද කරනත් යුෂ්මතුන්ට බලවත් විරුද්ධකාරයෙකු ඇති බව දැන ගන්න. කිම? ඔබ දිනූවා යැයි සිතන්නේහි ද? මෙයට පිළිතුරු දෙන බුදුන් වහන්සේ මෙසේ වදාරති.

මාරය, විසත්තික සංඛ්‍යාත තෘෂ්ණාව තරණය කළා වූ; දසබලධාරී වූ; මහා වීර වූ; තථාගතවරයෝ අටපිරිස්හි නිර්භීත වූයේ ඒකාන්තයෙන් අභීතව නාද කරති. මාරයා තමාව හඳුනා ගත් බව දැන පලා ගියේ ය. මෙවන් සංවාදයක් දෙදෙනෙකු විනා සිදු විය හැකි ද?

මාරයා යනු බාධාකාරී, විනාශකාරී පුද්ගලයෙකු බව තේරුම් ගත යුතු ය. එසේ ම තම චිත්ත සන්තානය තුළ අකුශල සිතිවිලි ද තම විනාශයට මඟ පාදයි. එම චිත්ත ක්ලේශ ද මාර යන නමින් ම හඳුනාගත හැකි ය. මෙයින් අප වටහා ගත යුත්තේ ආභ්‍යන්තරික හෝ බාහිර වශයෙන් තම අයහපතට හේතු වන සියලු විනාශකාරී දෑ මාර නම් වන බවත් එයට එය සප්‍රාණික හෝ අප්‍රාණික විය හැකි බව යි. ඒ සියලු දෑවලින් ඉවත්ව ජීවත් වීමට අප උත්සහ ගමු. මරුට බයේ පලා යන්නෙක් නො වී නිර්භීතව කෙලෙස් වනය නසා විනාස කිරීමට වෙර වීරිය වැඩිය යුතු ය.



**බුලත්සිංහල**
**සිරි ඤාණරතන හිමි**
ශ්‍රී ලංකා බෞද්ධ හා
පාලි විශ්වවිද්‍යාලය
හෝමාගම

# සැප පහසුකම් තිබුණත් සිතට සහනයක් නැත්තේ මෙවැනි අයටයි

**අප සියලු දෙනාම ලස්සනට නිරෝගීව සිටීමට කැමැතියි. එහෙත් අපේ ආයුෂ බොහොම ටිකයි. ආ පසු හරි බැලුවොත් මනුස්ස ලෝකයේ ජීවත්වෙන්න තිබෙන කාලය බොහෝ ගෙවාදමා තිබෙන්නේ. තව ටික කාලයයි තිබෙන්නේ. ඒ ටික කාලයෙත් ඊර්ෂ්‍යාවෙන් පෙළි පෙළී ඉන්නවා නම් ඒ ජීවිතයේ වටිනාකමක් නැහැ.**

සමහර විට අප මනුස්ස ලෝකයේ බොහෝ පිළිගැනීම් ඇති, සත්කාර සම්මාන ලබන කෙනෙක් වෙන්න පුළුවන්. නමුත් ඊර්ෂ්‍යාව බහුල නම් ඊළඟ උපත තිරයේ විය හැකියි.

බුද්ධ දේශනාවේ ඊර්ෂ්‍යාව පිළිබඳව ලස්සනට පහදා දී තිබෙනවා. චූල්ලකම්මවිභංග සූත්‍රයේ සඳහන් වන්නේ යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අනුන්ගේ ලාභ, සත්කාර, ගෞරව, මානන, පිදුම් ආදියට ඊර්ෂ්‍යා කරනවා. ඒ ගැන ගැටෙනවා. ඒ ඊර්ෂ්‍යාව තම සිතේ බැස ගන්නවා. අනුන්ගේ සැපය, දියුණුව, ලස්සන ආදීය දරන්නට නොහැකි වෙනවා. විශේෂයෙන්ම

තමන් අකමැති කෙනෙකුට මේ දේ ලැබෙන විට එය ඉවසන්නේ නැහැ. තමන් අකමැති කෙනාගේ ගුණ ප්‍රකටවන විට , ගරු නාම ලැබෙනවිට, දියුණුවනවිට ඊර්ෂ්‍යා කරයි නම් ඒ තැනැත්තා බුදු සසුනෙන් බැහැරව සිටින අයෙක ඊර්ෂ්‍යාව සිතට කිසිම සුව පහසුවක් ගෙන දෙන්නේ නැහැ. යම් ආයතනයක් තුළ වේවා, කණ්ඩායමක් තුළ වේවා, නිවසේ වේවා' කටයුතු කරද්දී තමාට අන් අය කෙරෙහි ඊර්ෂ්‍යාවක් ඇතිවුණොත් කිසිදු සුවපහසුවක් ඇතිවන්නේ නැහැ. සුවපහසුව අධ්‍යාපනය කරන්නවත් බැහැ. ඕනෑම ක්ෂේත්‍රයක වැඩ කරද්දී ඔබ නිරන්තරයෙන් ඊර්ෂ්‍යාව කියන අකුසලයෙන් පීඩා විඳිනවා නම්, ඔබට එය විශාල අකුසලයක්. එනිසා ඔබ ඔබට ආදරේනම්, සුවපහසුව ඉන්න කැමැති නම්, ඊර්ෂ්‍යාව දුරුකරන්න ඕනේ.

## කුසල සිතේ පහසුව...

ඒ වගේම අප ආශා කරන්න ඕන කුසලසහගත සිතක තිබෙන සුවපහසුවට. තමන් තමන්ගෙන්ම අසන්න ඕනේ "අනේ මම ඇයි පොඩි දෙයටත් මටත් ඕනේ, මටත් ඕනේ කියා හිතන්නේ." "මෙයාට හරියන්න නම් එපා" කියා පතමින් මගේ සිත අකුසලයට පත්කර ගන්නේ. ඊර්ෂ්‍යාව නැත්නම් කෙ තරම් සුවපහසුවක් තිබෙනවා ද? කියා අත්විඳ බලන්න.

ඊර්ෂ්‍යාවේ ස්වභාවය තමයි කාටහරි පොඩි දෙයක් ලැබෙනවා නම් ඒක ලොකුවට පේනවා. ලොකුවට දැනෙනවා. මට නැහැ. "මෙයාටමයි හැමදේම ලැබෙන්නේ" කියා අපේ සිත අපට කියනවා.

අනුන්ට ලැබෙන සම්මානය, සත්කාරය, ගෞරවය වන්දනාව, පූජාව ඉවසන්න බැහැ. ඊර්ෂ්‍යාව ඇතිවූ විට අපට උයාගත් කෑම ටික කන්න බැහැ. හරියට නින්දක් නැහැ. පිරිසුදුව ඉන්න හිතෙන්නේ නැහැ. මේ හැම දෙයින්ම අපට කියන්නේ සුවපහසුවක් නැති බවයි. ඒ නිසා අපි ඊර්ෂ්‍යා සිතක් ඇතිකර ගන්න බය වෙන්න ඕනේ.

එහි ආදීනවය බහුල ලෙස මෙනෙහි කරන්න ඕනේ.

අංගුත්තර නිකායේ මල්ලිකා සූත්‍රයේදී මල්ලිකා දේවිය බුදුරජාණන් වහන්සේගෙන් අහනවා භාග්‍යවතුන් වහන්ස, මම මේ සමාජයේ ස්ත්‍රීන් හතර වර්ගයක් දකිනවා. ඒ වගේ එකිනෙකා කොටස් කර දකින්නට ලැබෙන්නේ ඇයි? භාග්‍යවතුන් වහන්ස, ඒ පළමු ස්ත්‍රිය තමයි ඇය අවලස්සනයි. දුප්පත්, කිසිදු පිළිගැනීමක් නැහැ. දෙවැනි ස්ත්‍රිය විරූපියි.

එහෙත් ධනවත්. පිළිගැනීම තිබෙනවා. තුන්වැනි ස්ත්‍රිය සුරූපියි. නමුත් දුප්පත්. පිළිගැනීමක් නැහැ. හතරවන ස්ත්‍රිය සුරූපියි. ධනවත්. පිළිගැනීම තිබෙනවා.

## සුරූපි විරූපි වෙනසක්...

භාග්‍යවතුන් වහන්සේ වදාළා, මල්ලිකා අවලස්සන ව ඉපදෙන්නේ සංසාරයේ ක්‍රෝධ කළ තැනැත්තියත්. දුප්පත් වෙලා ඉන්නේ සසරේදී දන් නොදුන් තැනැත්තියත්. පිළිගැනීමක් නැත්තේ සසරේ ඊර්ෂ්‍යා කළ නිසා යි.

සමහර කාන්තාවන් විරූපි යි. ඒ සසරේදී ක්‍රෝධ කරලා. නමුත් දන් දුන් නිසා ධනවත්.

තව කාන්තාවක් සසරේ ක්‍රෝධ නොකළ නිසා සුරූපි යි. නමුත් දන් නොදුන් නිසා දුප්පත්. ඊර්ෂ්‍යා කළ නිසා පිළිගැනීමක් නැහැ.

සමහර කාන්තාවක් සුරූපියි. ධනවත්, සමාජයේ පිළිගැනීමකුත් තිබෙනවා. එවැනි ස්ත්‍රීන් සසරේ මෙත් සිත පුරුදු කරලා, දන්දීලා වගේම කිසිම කෙනෙකුට ඊර්ෂ්‍යා කරලත් නැහැ.

දේශනාවේ සඳහන් වෙන ආකාරයට කිසිම පිළිගැනීමක් සමාජයෙන් ලැබෙන්නේ නැත්තේ ඇයි? ඇය සසරේදී අනුන්ට ලැබෙන සත්කාරයට, ලාබයට, ගෞරවයට ඊර්ෂ්‍යා කරලා. ද්වේෂ කරලා, ඊර්ෂ්‍යාවෙන් බැඳිලා. ඒ නිසා මේ ජීවිතයේ අල්පේශාක්‍ය යි. කවුරුත් ගණන් ගන්නේ නැහැ. බුද්ධ වචනය අහලා නැති නිසා ඇය "මටයි කිසිවක් නැත්තේ" කියා මේ ජීවිතයේදීත් පිළිගැනීම් තිබෙන කෙනාට, ලාභය ලැබෙන කෙනාට ඊර්ෂ්‍යා කරනවා.

එහෙමනම්, ගත වූ සංසාරයේ අනුන්ට ඊර්ෂ්‍යා කරලා මේ ජීවිතයේදී පිළිගැනීමක් නැහැ, බුද්ධ වචනය අනුව හික්මෙන්න ප්‍රඥාව නැති නිසා මේ ජීවිතයේදීත් පිළිගැනීමක් ඇති කෙනාට ඊර්ෂ්‍යා කරනවා. නැවත උපද්දවා ගන්නේ පිළිගැනීමක් නැති ස්වභාවයම යි. එහෙමනම්, සංසාරේ කළ දේට මෙවැනි ජීවිතයක් ගත කරන ගමන්ම නැවත වතාවක් පිළිගැනීමක් නැති කෙනෙක් බවට පත් වෙනවා.

එසේනම් අපට පැහැදිලිසී සැපෙන්, සුවයෙන් ඉන්න කැමැතිනම්, කළයුත්තේ කුමක් ද? ඊර්ෂ්‍යාව දුරු කිරීම යි. ඊර්ෂ්‍යා කරනවානම් ,එය තමන්ට ම විඳවන්නට සැකසෙන දෙයක්. මේ ජීවිතයේ විඳවන ඒවා මදිවට අලුතින් විඳවන්නට කර්මයක් සකස් කර ගන්නවා. නමුත් භාග්‍යවතුන් වහන්සේ වදාළා යම් තැනැත්තියක් තව කෙනෙකුට ලැබෙන සත්කාර, ගෞරව, සම්මානවලට ඊර්ෂ්‍යා කරන්නේ නැත්නම් ඇයට පුළුවන් කියනවා කය බිඳී මරණින් පසු යහපත් තැනක උපදින්න.

දේශනාවේ තිබෙන්නේ ඇය කය බිඳී මරණින් පසුව සුගතිය නම් ස්වර්ගයට යනවා කියලයි. නැතිනම් ඇය මිනිස් ලොව උපත ලැබුවොත් ඇයට හොඳ පිළිගැනීමක් මහේශාක්‍ය බවක් ලැබෙනවා. එයට හේතුව අනුන්ගේ ගෞරවයට, සත්කාරයට, වන්දනයට, පූජනීයත්වයට ඊර්ෂ්‍යා කරලා නැහැ. ගැටිලා නැහැ. ඊර්ෂ්‍යාවෙන් සිත බැඳගෙන නැහැ.

එසේනම් ,අපි මේ මනුස්ස ලෝකයෙන් ගිහින් ඊළඟට පය ගහන තැන අපට ප්‍රශ්නයක්. ඊර්ෂ්‍යාව වගේ අකුසලයකින් අපේ සිත දූෂිතවෙලා තිබුණොත් ඒ සිත අප අරගෙන යන්නේ නරක උපතකට. මනුස්ස ලෝකයට ආවත් කිසිදු පිළිගැනීමක් නැති කෙනෙක්. හැබැයි අපි සිතට එන ඊර්ෂ්‍යාව දුරු කරලා සුන්දර කුසල් සිතකින් වාසය කළොත් ඒ සුන්දර කුසල් සිත අපි රැගෙන යන්නේ සුගතියට යි. මිනිස් ලෝකයට ආවොත් අපට සමාජයේ ලොකු පිළිගැනීමක් තිබෙනවා.

## කුසල් සිතක් උපදවා ගන්නා අයුරු...

එනිසා භාග්‍යවතුන් වහන්සේ වදාළා යම් තැනැත්තියක් මුදිතාව දියුණු කරනවානම්, අනුන්ගේ සැපයට කැමැති වෙනවා නම් ඊර්ෂ්‍යාව දුරුවෙනවා කියලා. මම ආයුෂයෙන් වැඩෙම්වා, වර්ණයෙන් වැඩෙම්වා, සැපයෙන් වැඩෙම්වා,බලයෙන් වැඩෙම්වා, යසසින් වැඩෙම්ව! ඒ වගේම මම ශ්‍රද්ධාවෙන්, සීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥවෙන් වැඩෙම්වා! කියා තමාට මුදිතාව වඩා ගන්නා ගමන්ම සියලු ලෝ සතුන් කෙරෙහිද දසදිසා ලෙස මුදිතාව පතුරුවන්නට පුළුවන්නම් අපට කුසල් සිතක් උපදවා ගන්නට පුළුවනි.

භාග්‍යවතුන් වහන්සේ වදාළා යම් කෙනෙක් මේ ආකාරයට මුදිතා භාවනාවෙන් මුදිතා ධ්‍යානය උපදවාගෙන ඒ ධ්‍යානයෙන් නො පිරිහී මිය ගියොත් කල්ප හතරක් ආයුෂ තිබෙන සුබකිණ්ණ නම් බඹ ලොව උපදිනවා කියලා.

එනිසා අපට තිසරණය සරණ යන්නට ලැබුණ මේ අවස්ථාවේදී සිත අකුසල් වලින් දූෂණය කර නොගෙන ඊර්ෂ්‍යාව වැනි අකුසල් දුරු කරන්න පුළුවන්නම් ඒකමයි ලාභය. තෙරුවන් සරණ ගිය අපි ඊර්ෂ්‍යාව නම් අකුසලය දුරුකරලා මුදිතාව නම් සුන්දර ගුණය දියුණු කරන්න පුළුවන්නම් ඒකමයි ලාභය.

මෙවැනි සුන්දර ගුණ පුරුදු කරලා දෙව්ලොවක ඉපදෙන්නට පුළුවන්නම් එයයි ලාභය. මෙවැනි සුන්දර ගුණ සම්පත්තියක් පුරුදු කර භාග්‍යවතුන් වහන්සේ වදාළ අමා මහ නිවනේ ගමන් කළ හැකිනම් , එයමයි අපට ලැබෙන ලාභය. අකුසල් දුරුකර කුසල් වඩාගෙන ඒ අමා මහ – නිවනට පැමිණෙන්නට පුළුවන් වුණොත් මිනිස් ලොව ලැබූ ලොකුම ලාභය එය නොවේ ද?.

නයනා නිල්මිණී



## අතරමඟදී හමුවුණ කෙනෙක්

මම පාසල් ගියේ පා ගමනින්. ඊට හේතුව වූයේ පාසල ගෙදර සමීපයේ වීමයි. පාසලේ දෙවන වසරේ දී පමණ මගේ දත් හැලෙන කාලයේ එක් දවසක එක් අයියා කෙනෙක් එක්ක මම ගෙදර එන විට මේ අයියා මට කියනවා මල්ලී දත් හැලෙන කොට දිව ගාන්න. එතකොට දත් ලස්සන වෙනවා.

මම නිකමට වගේ මේ අයියාගේ කට දිහා බැලුවා. මෙයාගේ දත් හරි විශාලයි. ඒ වගේම කටපුරාම අපිළිවෙලකට දත්. මෙයා පොඩි කාලේ එහෙම දිවගාල වෙන්න ඇති එහෙම කැත විදියට දත් පිහිටලා තියෙන්නේ.

මම එහෙම හිතුවේ අපේ අම්මා මට නිතරම කිව්වේ දත් එනකොට දිව ගාන්න එපා කැත වෙනවා කියලා. මේ අයියා මට අම්මා තරම් ලෙන්ගතු නෑ කියලා පුංචි වයසේදීම මේ කරුණ නිසා මට හොඳටම තේරුම් ගියා. අපි හැමෝටම එහෙමයි.

න පරේසං විලෝමානි
න පරේසං කතාකතං
අත්තනොව අවෙක්ඛෙය්‍ය
කතානි අකතානිච

අනුන්ගේ වචනවල ඇදකුද හොයන්න ඕනෙ නෑ. අනුන් කළ - නොකළ දේ ගැන සොයන්නට ඕනෙත් නෑ. තමන් ගැනම බලාගත්තහම ඇති. තමන් කළ නොකළ දේ ගැන හොයන්න.

කවුරු මොනවා කිව්වත් ළමා කාලයේ දී ඒ සියල්ල මව්පියන්ට පැවසිය යුතුයි. එමෙන්ම කොතරම් රස කෑමක් වුවත්, ඒ පිළිබඳ දෙවරක් සිතිය යුතුයි. ඒ මව්පියන් තරම් අතරමඟදී හමුවන අය අපිට ආදරය නොකරන නිසායි.

# අඩුපාඩු හඳුනාගන්න තමන්ගේ ම සිත දකින්න

**තමාගේ සිත විනිවිද දැකීම අන්‍ය සිත් දැකීමට වඩා ශ්‍රේෂ්ඨ ය. අ.නි සචිත්ත සූත්‍රය තුළදී බුදුරදුන් දේශනා කළේ තමාගේ සිතේ ආකාරය දැකීමට දක්ෂයෙක් වන්න යනුවෙනි. තමාගේ සිත දැකීම තුළ බොහෝ අඩුපාඩු හඳුනාගැනීමට හැකියාව ලැබේ.**

තමා තමා විසින් දැකීම අන්‍යයන් තමන් දෙස බලනවාට වඩා වැදගත් ය. මෙහිදී තථාගතයන් වහන්සේ සඳහන් කරනුයේ යමෙක් කණ්ණාඩියකින් මුහුණ බලා තමාගේ මුහුණේ සකස්විය යුතු තැන් සකසන්නේද එසේම සිත සැකසීම එලෙස සිදුකළ යුතු ය. එවිට සසර ගමන අපට සංස්කරණය කරගත හැකි වේ.

සසර ගමන නැවැත්වීමේ දී තමන් කරන ක්‍රියා පිළිබඳ අනෙකා කෙසේ සිතයිද ,කුමන අදහසක් ඇතිකර ගනීද යන්න වැදගත් නොවේ. බොහෝ පිරිසකට ඇති ප්‍රධාන ගැටලුව වන්නේ ආධ්‍යාත්මික ජීවිතයේ දී තමන්ගේ වත් පිළිවෙත් ගැන අනෙකා කුමන අයුරින් කල්පනා කරයිද යන්න සිතීමයි.

තමන් තරුණයකු ලෙස අන්‍ය තරුණයන්ට වඩා ආධ්‍යාත්මික දියුණුව ගැන සිතා කටයුතු කිරීමේ දී තමන්ගේ වයසේ අය මෙන්ම වැඩිහිටියන් කුමන අයුරින් කල්පනා කරයිද තමන් ගැන ඔවුන් කුමන ආකාරයකින් අදහස් දක්වයි ද යන්න නොසිතිය යුතු ය. මන්ද යත් තමන් ගැන හොඳින්ම දන්නේ තමන් බැවිනි.

එහෙත් පැවැත්ම සම්බන්ධයෙන් එසේ සිතිය යුතු නොවේ. අනෙකා සිතන විදිය පිළිබඳ සැලකිලිමත්වීම අවශ්‍යය. මම මට ඕන විදියට ඉන්නවා කවුරුත් මට නීති දන්න එපා මගේ තෙල් මගේ වාහනය .ඉතින් අනිත් අයට තියෙන ප්‍රශ්නය මොකක් ද මේ ආදී උද්ධච්ච ප්‍රකාශ කරමින් කටයුතු කළ නොහැකි ය. මන්ද යත් සියල්ලම මනාව තේරුම් ගෙන කටයුතු කිරීම අවශ්‍ය බැවිනි.

තමන්ගේ සිතට තමාම වංචා කරගැනීම නුසුදුසු ය. ඒ තුළ රැවටෙන්නේ තමන්ම බැවිනි. තමන් කරන පින්කම් පිළිබඳව හෝ ක්‍රියාකාරකම් ගැන වඩා අවංක වීම අවශ්‍යය. සියල්ලටම බලපානු ලබන්නේ තම සිතයි. සිතේ ඇතිවන සිතුවිලි මත හොඳ හෝ නරක ගණනය වේ. ඒ තුළ පව් පින් කුසල් අකුසල් හඳුනා ගත හැකි ය.

බුදුදහම කර්ම ලෙස දක්වන්නේ ද චේතනාවය. සචිත්ත සූත්‍රයේදී තවදුරටත් දක්වන්නේ තමා තමාගේ සිත ප්‍රත්‍යවේක්ෂා




කරන්න එහිදී බහුලව තිබෙන ද තේරුම් ගෙන එම අඩු පාඩු සකසාගත හැකි ය. සූත්‍රයට අනුව කාරණා 10 ක් පිළිබඳව තමන් අවධානය යොමු කිරීම අවශ්‍ය ය.

ලෝභය සිතෙහි අඩුද වැඩිද, කෝපය සිතෙහි අඩුද වැඩිද, මැලිකම, කුසීතකම අඩුද වැඩිද, විසිරුණු බව, සැකය, ක්‍රෝධය, කිලිටිබව, දැහය, සිතෙහි අඩුද වැඩිද, වීර්යය සිතෙහි අඩුද වැඩිද, එකගබව සිතෙහි අඩුද වැඩිද

මෙලෙස දක්වනුයේ තමා ඇතැම්විට මුළාවට පත්වී පින කුසලය යැයි සිතා පව් අකුසල් සිදු කරගැනීමට පෙළඹෙන නිසාවෙනි. ලෝභය තමන් තුළ නැතැයි වක්‍රවක ධර්මයන්වලට රැවටී කටයුතු කිරීම ඇතැමෙක් නොදන්නාකම නිසා රැවටී සිටිය හැකි ය. මන්දයත් ලෝභය විවිධ වේශයන් තුළින් සිතට එන බැවිනි. ඒ තුළ තමා නොදැනුවත්වම මහත් අපහසුතාවයන්ට පත්වේ. එහෙයින් තමාගේ සිත ලෝභයෙන් මැඩී ඇත්නම් එය සකසා ගැනීමට සිත කියවිය හැකි විය යුතු ය. නැතිනම් කුසලය යැයි සිතා බොහෝ අකුසල් සිදු කරගනී.

කෝපයද එසේමය ඇතැම් විට නිවන ,පරාර්ථ චර්යාව පරෝපකාරය වැනි වදන් මුලට යෙදූන ද ,තමාට තමාව තේරුම්ගත නොහැකිවීම මත ඊට හාත්පසින් වෙනස් දේ සිදුවීමට අවස්ථාව සැලසේ. උත්තේජනය නොමැතිව කිසිදු කටයුත්තක් නිසියාකාරව කළ නොහැක. එය ඇලීම හෝ ගැටීමෙන් තොරව ඇතිවන්නේ ප්‍රඥාව ඇති අයට පමණි. එසේ නොමැතිවිට සිත යහපතෙහි යෙදවීමට බාධා පැමිණේ. වීර්යය සැබෑ යහපත වෙනුවෙන් පවතීද යන්න තේරුම් ගැනීම වැදගත් ය. එසේ නැතිවුවහොත් වීර්ය අවභාවිතා වීම මත ලැබූ මිනිස් දිවියෙන් නියම ප්‍රයෝජනය ලැබිය නොහැකි ය. ඇතමකුට තෘෂ්ණාව සඳහාද කෝපය භීතිය සඳහා වීර්ය උපදී. නමුත් සසර නුවණින් දැකීමට වීර්ය ඇති නොවේ.

සිතුවිලි විසිරී ඇතිනම් එකග සිතක් නොපවතී. ඒ මත තම කටයුතු මනාව පවත්වාගෙන යාම ගැටලු සහගත ය . සිත විසිරී ඇති බව නොහඳුනන කෙනකුට ඒ සිත එකග කරගැනීමට අවශ්‍ය ද සම්පාදනය නොවේ.

සමාධියෙන් තොරව ප්‍රඥාව ලබාගැනීම අපහසු ය. එමෙන්ම තම සිත කිලිටි වී ඇත්නම් එය පිරිසුදුකර ගත යුතු ය. තම සිත නොදකින කෙනෙකුට සිත කිලිටිවීද යන්න තේරුම්ගත නොහැකි වේ. අනවශ්‍ය කෙලෙස් සිතේ තැන්පත් කොට ගෙන එයට වටිනාකම් ලබාදීම නොවැදගත් පුද්ගලයන් හෝ වස්තු පිළිබඳ සිතීම අධ්‍යාත්මික නොවේ. අනවශ්‍ය

බරක් හිසේ තබා ගැනීම මත අවශ්‍ය දේ මගහැරී යනු නොඅනුමානය. එය විවේක බුද්ධියෙන් සිතිය යුතු ය. ක්‍රෝධය ද එසේම ය. තම ලේ අපිරිසුදුවී ආයුෂ කොට වී විරූපී දුර්වර්ණ රූපයක් ලැබීම මේ තුළ ඇති වේ.මන්දයත් දුර්වල වූ මනසක් සමග ශක්තිමත් ශරීරයක් තිබිය නොහැකි ය.

මෙය වර්තමානය සමග මනාව ගලපාගත හැකි ය. කොරෝනා රෝගයට ගොදුරු වී රෝහල්ගත වූ විට බොහෝ විට දකින්නේ ජීවිතයත් මරණයත් අතර සටන් වදින රෝගීන් ය.

එවිට ශක්තිමත් කෙනෙක් වුවද සිත ශක්තිමත් නොවේ නම් ඔවුන් මානසිකව ඇද වැටේ. එය මරණය පවා සිදුවීමට හේතුවකි. එහෙයින් තම සිත පිළිබඳ සියල්ලෝම නිවැරැදි තක්සේරුවක් සිදුකරගෙන සිත සකසාගැනීම ඉතා වැදගත් ය. මේ සූත්‍රයේ දී විශේෂයෙන් අවධාරණය කරන්නේ හිස ගිනිගත්, ඇඳුම ගිනිගත් කෙනෙක් එය නිවාලන්නා සේ වහා සිත සැකසිය යුතු ය. මෙය නිවැරැදිව බව තේරුම්ගෙන තම සිත දකින්න කටයුතු කළ යුතු වේ.


කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# ධර්මයෙහි අර්ථය වෙනස් වීම ධර්මයට වගේම ශාසනයටත් හානියක්

උදාර දිවියක පිය සටහන්

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ සබරගමු පළාතේ ප්‍රධාන සංඝනායක මහවල ශ්‍රී ධර්මායතන විහාරාධිපති සහකාර පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික) රාජකීය පණ්ඩිත ග්‍රන්ථවිශාරද ශාස්ත්‍රපති**

## කෑලිගම විජිතනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය

**අපේ නායක හාමුදුරුවනේ, පුංචි කාලයේදීම පැවිදි ජීවිතයට ඇතුළත් වෙලා විනය මූලික ශාසනික ප්‍රතිපත්තියෙන් සුශික්ෂිත චරිතයක් ඇති ධර්මානුගත චරණයෙන්, ශාස්ත්‍රීය ශික්ෂණයෙන් ශික්ෂිත වූ ඔබ වහන්සේ මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ සබරගමු පළාතේ ප්‍රධාන සංඝනායක ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ශාසනික සේවයෙහි නියැළීමට ආ ගමන් මග පිළිබඳව අතීතාවර්ජනයක යෙදෙනවා නම්,**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කෑලිගම කියන බොහොම රමණීය ප්‍රදේශයක විසූ සත්ගුණවත් කොඩිතුවක්කු ආරච්චිලාගේ මුදලි අප්පුහාමි පියතුමන් හා සෙනවිරත්න අධිකාරම් මුදියන්සේලාගේ ඩිංගිරි මැණිකේ මාතාව යන දෙපළ සදදරණීය මව්පියන් කොටගෙන ජන්ම දයාදය ලැබුවා. මා ඇතුළුව පවුලේ සහෝදර සහෝදරියන් 6 ක් සිටි බවත්, මේ අවස්ථාවේදී සිහිපත් කළ යුතුයි.

රත්නපුර දිස්ත්‍රික්කයේ කැල්ල විද්‍යාලයෙන් මූලික ගිහි අධ්‍යාපනය ලබාගැනීමට කටයුතු කළා. මගේ මව්පියන් බොහොම ගුණවත් ශ්‍රද්ධා බුද්ධි සම්පන්නව තුනුරුවන් කෙරෙහි අචල ගෞරවයකින් කටයුතු කළ දෙපළක් නිසාම මා තුළත් පැවිදිවීමට ආසාවක් ඇතිවුණා. මව්පියන්ගේ ආදර්ශවත් ජීවිතයත් ගුරුභවතුන්ගේ නිවැරැදි මග පෙන්වීමත් තුළ පැවතුණ උතුම් ගුණාංගයන් මගේ දෙලොව ජීවිතයම ආලෝකවත්වීමට හේතු වුණා.

ඒ අනුව සබරගමු පළාතේ ද්විතීය සංඝ නායක කැල්ලේ ශ්‍රී සාරානන්ද නායක මාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1954 වර්ෂයේ දී කෑලිගම විජිතනන්ද යන ශාසනික නාමයෙන් මඩුවන්වෙල මුදලින්ධාරාම විහාරස්ථානයේදී සම්බුද්ධ ශාසනයේ උත්තරීතර ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් වුණා.

පැවිදි වීමෙන් අනතුරුව රත්නපුර මුවගම සිරි විසුද්ධාරාම පිරිවෙනෙහි ඉතාම මැනවින් ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය සිදුකළා. කැල්ලේ ශ්‍රී සාරානන්ද නායක මාහිමිපාණන් වහන්සේගේ අවවාද අනුශාසනා ඇතිව ශ්‍රී ලාංකේය පැවිදි අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් ප්‍රකට වුණ ගාල්ල විද්‍යාලෝක පිරිවෙනින් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබාගෙන විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා විද්‍යෝදය විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණා. එහිදී ශාස්ත්‍රවේදී උපාධියත්, ශාස්ත්‍රපති උපාධියත්, ලබා ගත්තා. ඒ වගේම ප්‍රාචීන භාෂෝපකාර සමාගමෙන් ප්‍රාචීන පණ්ඩිත උපාධියත්, ග්‍රන්ථ විශාරද පශ්චාත් උපාධියත් ලබාගෙන, අධ්‍යාපන ඩිප්ලෝමාවත්, බුද්ධ ධර්ම ඩිප්ලෝමා විභාගයත් ලබා ගැනීමට කටයුතු කළා.

අධ්‍යාපනය ලබමින් සිටි කාල පරිච්ඡේදයේදීම තිසි වයස් සම්පූර්ණවීමත් සමඟ 1960 වර්ෂයේ දී මල්වතු මහා විහාර උපෝෂථාගාරයේ දී උතුම් අධිශීල සංඛ්‍යාත උපසම්පදශීලයට පත්වුණ බවත් ප්‍රකාශ කළ යුතුයි. එහිදී ඕමල්පේ ටැම්පිට විහාරාධිපති දපනේ ධම්මානන්ද මාහිමිපාණන් වහන්සේගේ හා සබරගමු පළාතේ ද්විතීය සංඝනායක කැල්ලේ ශ්‍රී සාරානන්ද නායක ස්වාමීන් වහන්සේගේ ආචාර්යත්වයෙන් උපසම්පද පුණ්‍ය කර්මය සිදුකළ බව පුණ්‍යාණුමෝදනා පූර්වකව කෘතවේදීව සිහිපත් කළ යුතුයි.

විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසුව හොරණ නාලන්ද පිරිවෙනේ ආචාර්යවරයකු වශයෙන් සේවය ආරම්භ කළා. ගාල්ල, රත්නපුර, බදුල්ල, මොණරාගල, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්කවලත් බොහෝ කාලයක් සේවය කිරීමට හැකි වුණා. ශ්‍රී පාදස්ථානාධිපති බටුගෙදර යසස්සී ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම අනුව රත්නපුර සද්ධර්මාලංකාර පිරිවෙනේ පරිවේණාධිපතීන් වහන්සේ වශයෙන් ස්වාමීන් වහන්සේලාගේ ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය දියුණු කිරීම වෙනුවෙන් කටයුතු කිරීමට අවස්ථාව ලැබීමත් සතුටක්. පසුකාලීනව අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් විශ්‍රාම යනතෙක් විශාල ශාසනික කාර්යභාරයක් ඉටුකිරීමට හැකියාව ලැබුණා.

එම කාල වකවානුවේදීම රත්නපුර මහවල ප්‍රදේශයේ ශ්‍රී ධර්මායතනය නමින් විහාරස්ථානයක් ආරම්භ කිරීමටත් කාලයාගේ ඇවෑමෙන් එම විහාරස්ථානය තුළ ශ්‍රී ධර්මායතන පිරිවෙන නමින් පිරිවෙනක් ආරම්භ කිරීමටත් කටයුතු කළ නිසා එම ප්‍රදේශයේ වැඩ සිටින භික්ෂූන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා ගැනීමට පහසුවක් සැලසුණා. සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් පිරිවෙනක්



ආරම්භ කිරීමට ලැබීමත් සතුටට කරුණක්. ආගමික, ශාසනික, ශාස්ත්‍රී, සමාජීය ක්ෂේත්‍රයන්ට අදාළව සිදුකරනු ලබන සේවය ඇගයීමට ලක්කරමින් මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිගරු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වර ප්‍රමුඛ සානුනායක විංශත්වර්ගික කාරක සංඝ සභාව වෙතින් විනය කීර්ති ශ්‍රී ධම්මදින්න සරණපාල ගෞරව නාමය සහිතව සබරගමු පළාතේ ප්‍රධාන සංඝනායක ධූරය පිරිනැමීමට කටයුතු කළා.

සංඝ නේතෘන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පිළිගනිමින් ඒවාට අනුකූලව උන්වහන්සේලාට කීකරුව කටයුතු කළ නිසාම සාර්ථක ගමනක් යාමට හැකියාව ලැබුණ බව ගෞරව සම්ප්‍රයුක්තව මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කළ යුතුයි.

**ඔබ වහන්සේ ශාස්ත්‍රීය ලෝකයට දයාද කරන්නට යෙදුන ග්‍රන්ථ මොනවාද? නායක හාමුදුරුවනේ**

ශාසන ප්‍රතිසංවිධානයට යෝජනා, සැපවත්වීමේ මඟ, පිරිවෙන් අධ්‍යාපනය හෙවත් සම්භාව්‍ය දේශීය අධ්‍යාපනය, කොළොන්නා කෝරළේ ඉතිහාසය, මඩුවන්වෙල වලව්ව හා ලංකාවේ කළුකුමාරයා, සාමණේර බණ දහම් වත, දැහැමි පාලනයේ පිය සටහන්, අපූරු ඇතා සහ තවත් කතා, දිවිමගට පහනක් යටතේ 1. සීලය මිනිසා උසස් බවට පමුණුවයි, 2. සක්දෙවිඳුටත් වැරදුණු අනාවැකිය, 3 පුදුම ඉදිකටුව, 4. සත්හැවිරිදි පුතකු ගෙන් පාඩමක්, 5 සැපය තිබෙන්නේ සම්පත්වල නොවේ, 6 කළ උපකාර අමතක කළ උගතෙක්, 7 බොන්න බොන්න මෙන්න සුරා, 8 මී අඹ පොකුරේ පණු අඹයක්, 9 දෙගුරුන්ගේ අගය, 10 බත්හැළියට රණ්ඩුවක්, 11 හිත ගිය තැන මාලිගාව, ජීවක චරිතය, සත් හැවිරිදි වියේදී උපසම්පදව ලැබූ සෝපාක රහතන් වහන්සේ හා සාමණේර ප්‍රශ්න, නිරවුල් දිවිමගට පිවිසුම, ලක් බුදුසසුන හා ස්‍යාම නිකායික සංඝ පරම්පරාව සබරගමු වේ ව්‍යාප්තවීම, සදහම් සිසිල, මජ්ඣිම පටිපද, රාහුල රහතන් වහන්සේගේ චරිතාපදානය හා සංසාර විමුක්තිය, බ්‍රහ්මයානය ආදී ග්‍රන්ථත් හෙරණසිඛ හා හෙරණසිඛ විනිය, රසවාහිනි (පාලි) මහියංගණ ජනශ්‍රැති ආදීය සංස්කරණයන් වශයෙනුත් රචනා කළා.

**බහුශ්‍රැත ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ඔබ වහන්සේ පැවිදි ජීවිතය තුළ ලබා ගත් අත්දැකීම් සම්භාරය අනුව හැදෙන වැඩෙන ස්වාමීන් වහන්සේලාට ලබා දෙන්නේ මොනවගේ අනුශාසනාවක් ද?**

භික්ෂු ජීවිතයක් ගතකරනවා නම්, ශාසන චර්යාවට අනුකූලව පැවිදි ජීවිතය ගත කළ යුතු බවට මම සැමවිටම උන්වහන්සේලාට අනුශාසනා කරනවා. බණ පොත් පරිශීලනය කළ හැකි ආකාරයට නිවැරැදිව අක්ෂර වින්‍යාසය ඉගෙන ගනිමින් ශාසනික වත් පිළිවෙත් නිවැරැදිව පුරුදු පුහුණු වීම අවශ්‍ය යි. ඇතැම් ධර්ම දේශනාවල නිවැරැදිව වචන ශබ්ද වන්නේ නැහැ. එවැනි අවස්ථාවල ධර්මයේ අර්ථය වෙනස්වෙන්න පුළුවන්. ධර්මයෙහි අර්ථය වෙනස්වීම ධර්මයට වගේම ශාසනයටත් හානියක්. එම නිසා අක්ෂර වින්‍යාසය නිවැරැදිව උච්චාරණයට ඉගෙන ගනිමින්. බ්‍රහ්ම චර්යාව වත පිළිවෙත පුරුදු පුහුණු වෙමින් ශාසනමාමක ව කටයුතු කිරීම ශාසනයේ පැවැත්මට ඉතාම අවශ්‍යයයි. එමෙන්ම කාලය නිකරුණේ ගතනොකර හැම විටම අර්ථවත්ව කාලය ගත කිරීමට වගබලා ගත යුතුයි.

හේමමාලා රන්දුනු

# හින්දු ආගම අතහැර ලක්ෂ ගණනින් ජනයා එකම ස්ථානයක දී බුදු දහම වැළඳ ගනී



ගෞරව ශාස්ත්‍රවේදී
**බෝගහවැව ආනන්ද විපුලසිරි හිමි**




**උගත් බුද්ධිමත් පාණ්ඩිත්‍යයෙන් හෙබි පිරිස් ඇසුරු කිරීමට ද මෙතුමා හුරුපුරුදුව සිටීම නව මාවතකට අවතීරණ වීමේ දී ඔහුට ආශිර්වාදයක් විය. එහිදී ඔහු තම මාර්ගය වෙනස් කිරීමට පිටිවහලක් සැපයූ තිදෙනෙක් පිළිබඳව නිතර නිතර සඳහන් කළේ ය.**

එනම්, කබීර්තුමා, ජ්‍යොතිබා පූලේ හා බුදුරජාණන් වහන්සේ ය. මෙමඟින් ලද ආලෝකය තම ගමන් මාර්ගයට ආලෝකය සපයා සුපැහැදිලි කළ බව අම්බෙඩ්කාර්තුමාගේ පිළිගැනීම ය.

ඔහු බෞද්ධ දර්ශනය උගත්තා පමණක් නොව එය ක්‍රියාවෙන් ද තම ජීවිතයට උපයෝගී කර ගත්තේ ය. ඒ බව බොම්බායේ මන්දිරයක් ඉදිකරවා ඒ සඳහා රාජ් ගෘහ යන බෞද්ධ නාමය යෙදීමෙන් විශද වේ.

එසේ ම කුලහීන දරුවන්ට බොම්බායේ පිහිට වූ අධ්‍යාපන ආයතනය සිද්ධාර්ථ විද්‍යාලය යන නමින් නම් කළේ ය. තම කුලහීන ජනයා නිදහස් කර ගැනීමේ දියත් කළ ව්‍යාපාරය "භාරතීය බෞද්ධ සමිතිය" ලෙස ද නම් කර ගත්තේ ය.

මේ සියලු සාධකවලට අනුව විද්‍යමාන වන්නේ අම්බෙඩ්කාර්තුමා බුදුදහම කෙරෙහි මහත් ඕනෑකමින් සහ ලැදියාවෙන් කටයුතු කර ඇති දලිත් කුලයේ උප කුලයක් වූ මහාර් කුල ඇත්තෙක් බවයි.

කුලහීන ජනයා වෙනුවෙන් ගෙන ගිය ව්‍යාපාරය දෙමඟක ගමන් කරන්නට විය. එක් මාර්ගයක් වූයේ කුලහීන ජනයා මේවන විට පත්ව තිබූ සමාජ තත්ත්වයෙන් මුදවා ගැනීම ය.

එහිදී ඔහුට බොහෝ බාධකවලට අභියෝග කිරීමට සිදුවිය. එනම්, මුස්ලිම්වරුන්ට පාකිස්ථානය වෙන් කර දීමටත්, බංගලාදේශය දීමටත් කැමැති වූ මහත්මා ගාන්ධි හරිජනයා වෙනුවෙන් අම්බෙඩ්කාර්තුමා ගෙන ගිය සටනට සම්පූර්ණයෙන් ම විරුද්ධ විය. ඉංග්‍රීසීන් රටින් නෙරපා හැරීමට සත්‍යග්‍රහ දියත් කළ මහත්මා ගාන්ධිතුමා හරිජනයාට නිදහස ලැබෙන කිසිදු පණතකට පක්ෂපාතී නොවී ය.එහෙත් අම්බෙඩ්කාර් තම උත්සාහය අත් නොහැරි ශ්‍රේෂ්ඨ නායකයෙක් ය. ඔහු කෙසේ හෝ හරිජනයා වෙනුවෙන් ඉන්දීය සමාජයේ අයිතිවාසිකම් වෙන් කිරීමට කැප වූයේ ය.

දෙවැන්න වූයේ හින්දු දහම අත්හැර බුදුදහම වැළඳ ගැනීම ය. මේ සඳහා මොහු අප්‍රතිහත ධෛර්යයකින් වෙහෙසකින් ක්‍රියා කරන්නට විය. පුරා වසර විස්සක් ම ඒ වෙනුවෙන් ම කාලය කැප කළේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රි.ව. 1956 දී 'ආගමාවතරණය' නමින් උත්සවයක දී බුරුම ජාතික චන්ද්‍රමානි මහාස්ථවිරයන් වහන්සේගෙන් පන්සිල් සමාදන් වී බෞද්ධයන් බවට පත් විය. එහිදී මොහුගේ දෙවැනි ගමන් මඟෙහි සාඵල්‍යයක් දැක ගත හැකි විය.

බෞද්ධ ඉතිහාසයේ මෑත කාලයේ දී විශාල පිරිසක් එක් ස්ථානයක දී බුදුදහම වැළඳගත් අවස්ථාව ලෙස අම්බෙඩ්කාර්තුමාගේ මෙම ආගමාවතරණය පෙන්වා දිය හැකි ය. මෙහි දී ලක්ෂ සංඛ්‍යාත පිරිසක් බුදුදහම වැළැඳ ගත්තේ ය. කෙසේ නමුත් මෙතුමා ක්‍රි.ව. 1956 දී පරලොව සැපත් වූයේ ය. එසේ වුවද මෙතුමාගේ අනුගාමික පිරිසෙහි කිසිදු අඩුවක් නොවී ය. ඔහුගේ ප්‍රතිපත්තිය වූයේ බුද්ධ ශාසනයේ භෞතික සම්පත් වැඩි කරනවා වෙනුවට මානව සම්පත, සාරධර්ම, ගුණධර්ම ආදියෙන් පරිපූර්ණ ව පෝෂණය කිරීම ය. එහිදී බොහෝ කුලපීඩිත ජනයා තෝරාගෙන ඔවුන්ට නිදහසේ ජීවත්වීමට නිදහසේ මාවත පෙන්වා දෙන ලදී. මෙම තත්ත්වය වඩාත් තහවුරු වූයේ භාරතීය ජන සංඛ්‍යා ලේඛන බැලීමෙන් ය. ක්‍රි.ව. 1891 දී භාරතයේ බෞද්ධයන් 50000වූ අතර එය ක්‍රි.ව. 2000 වන විට ලක්ෂ 70 ඉක්මවා ගොස් ඇත. මෙම තත්ත්වයට ප්‍රධානතම වගකිවයුත්තා අම්බෙඩ්කාර්තුමා ය. ඒ ඔහුගේ ව්‍යාපාරයේ උසස් ප්‍රතිඵලයක් නිසාම ය.

> **"ඔහුගේ ප්‍රතිපත්තිය වූයේ බුද්ධ ශාසනයේ භෞතික සම්පත් වැඩි කරනවා වෙනුවට මානව සම්පත, සාරධර්ම, ගුණධර්ම ආදියෙන් පරිපූර්ණ ව පෝෂණය කිරීම ය. එහිදී බොහෝ කුලපීඩිත ජනයා තෝරාගෙන ඔවුන්ට නිදහසේ ජීවත්වීමට නිදහසේ මාවත පෙන්වා දෙන ලදී. මෙම තත්ත්වය වඩාත් තහවුරු වූයේ භාරතීය ජන සංඛ්‍යා ලේඛන බැලීමෙන් ය. ක්‍රි.ව. 1891 දී භාරතයේ බෞද්ධයන් 50000වූ අතර එය ක්‍රි.ව. 2000 වන විට ලක්ෂ 70 ඉක්මවා ගොස් ඇත. මෙම තත්ත්වයට ප්‍රධානතම වගකිවයුත්තා අම්බෙඩ්කාර්තුමා ය"**

නූතන භාරතීය බෞද්ධ පුනරුදයේ ප්‍රධාන නියමුවා වශයෙන් අම්බෙඩ්කාර්තුමා පෙන්වාදිය හැකි ය. 'වියානා සම්ප්‍රදය' ලෙස අම්බෙඩ්කාර් හඳුන්වා දුන් බුදු සමයේ නව ප්‍රබෝධයත් සමඟ එසේ ඔහුව හැඳින්වීම වරදක් නොවේ.

බුදු දහමේ පෙන්වා දෙන ආචාර ධර්මයන් උපයෝගී කරගෙන ඒ සඳහා මාර්ගය පාද ගැනීමට ඔහු සමතෙක් විය.

# මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය උපසම්පදාවේ අතීත කථාව

06



සෝමවතී රජමහා විහාරාධිපති
මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ
වැඩබලන ලේඛකාධිකාරී
ආචාර්ය
**පහමුණේ සුමංගල හිමි**

**වැලිවිට අසරණ සරණ ශ්‍රී සරණංකර සංඝරාජ මා හිමියන්ගේ 323 වන ජන්ම සංවත්සරය, 243 වන අනුස්මරණය හා මහා විහාරවංශික ස්‍යාමෝපසම්පදාවට වසර 268ක් සම්පූර්ණ වීම නිමිත්තෙනි.**

ඌව වෙල්ලස්ස, දඹවින්න, පාළුගම, කළුබුළුලන්ද, පොතුබන්ධන, තැරුල, කොටේරවෙල, මුප්පනේ, මොණරාගල, බුත්තල වෙහෙරගොඩ ආදී සංඝ පරම්පරාවන් ඇතිවී, එකී ප්‍රදේශයන්හි විහාරස්ථාන මෙන්ම අධ්‍යාපනය ද වැඩිදියුණු වීමට පටන් ගැනුණි.

සබරගමු පළාතෙන් මෙන්ම පහතරටින් වැඩමවා අධ්‍යයනය හා උපසම්පදාව ලබාගත් සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍යත් වූ සිටිනාමළුවේ ධම්මජෝති හිමි, වේහැල්ලේ ධම්මදින්න හිමි, කරතොට ධම්මාරාම හිමි, බෝවල ධම්මානන්ද හිමි, සාලිඇළේ වනරතන හිමි, රන්සැගොඩ ධම්මදස්සිහිමි, පල්ලත්තර පුඤ්ඤසාර හිමි, දෙමටපිටියේ සංඝරක්ඛිත හිමි, අගලකඩ ධම්මරක්ඛිත හිමි ආදී හිමිවරු දක්ෂිණ ලංකාවේ වෙහෙර විහාරදියුණු කරමින් ධර්ම ශාස්ත්‍රාලෝකය පැවැත්වූහ.ඒ නිසා මාතර සාහිත්‍ය යුගයක් බවට ද පත් වූ අතරම, වලානේ සිද්ධාර්ථ නාහිමි මුල්වී පරමධම්මචේතිය පිරිවෙන ආරම්භ කළහ. පසුව එම අධ්‍යාපන ආයතනයේ ඉගෙනුම ලැබූ ශිෂ්‍යන් අතරින් හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි විසින් 1773දී මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනත්, රත්මලානේ ශ්‍රී ධම්මාරාම නාහිමි විසින් 1775දී පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනත් ආරම්භ කරමින් එදා වැලිවිට සරණංකර සංඝ රාජ හිමියන් මහනුවර පෝයමළු විහාරයත්, නියමකන්දේ අධ්‍යාපන ආයතනත් මුල්කොට ආරම්භ කරන ලද අධ්‍යාපන ප්‍රදීපය දසත ආලෝකය විහිදුවමින් ශ්‍රී ලංකා ධරණී තලයේම අධ්‍යාපනය වැඩිදියණු කිරීමට හැකිවිය. එහි ප්‍රතිඵලය වූයේ අදවන විට වර්තමාන ලෝකයාම පිළිගන්නා පේරාදෙණිය, ජයවර්ධනපුර, කැලණිය ආදී විශ්වවිද්‍යාල සහිත විවිධ අධ්‍යාපන ආයතන බිහිවීමයි. රටපුරා ශාසනික ශාස්ත්‍රීය දියණුවේ ආරම්භය ඇති වූයේ වැලිවිට සරණංකර සංඝ රාජයාණන් වහන්සේ නිසා ය.

භාරත දේශයේ පවා පිරිහී ගිය සම්බුද්ධ ශාසනය නැවත ඇති කිරීමට පැවිදි උපසම්පදාව ලබාගත් අනගාරික ධර්මපාල තුමාට එවන් සේවයක් කිරීමට හැකි වූයේ සංඝරාජ මාහිමියන් සිදුකළ ශාසනික ධර්ම ශාස්ත්‍රීය සේවය නිසාම ය.

මෙවන් ශාසනික ආගමික, ජාතික, සංස්කෘතික, අධ්‍යාපනික වූ අසීමිත සේවයක් සලසා වදාළ වැලිවිට ශ්‍රී සරණංකර සංඝ රාජ මාහිමියන් වහන්සේ 1698 ජුනි 18දින උපත ලබා 1753 ජූලි මස 15 ඇසළ පොහෝදින උපසම්පදාවත් ලබා උපතින් අසූ වස් සපිරෙත්ම 1778 ජූලි මස ඇසළ පොහෝදින මහනුවර මල්වතු මහා විහාරයේදී අපවත්වී වදාළ හ.

පූජා ච පූජනීයානං

# පත්බේරියේ ශ්‍රී ධම්මාලෝක නාහිමි

**20 වන සියවසේ දී සම්බුද්ධ ශාසනයේ උන්නතියට ද බෞද්ධ අධ්‍යාපනයේ සංවර්ධනයට ද ඉමහත් සේවාවක් සැලසූ මහා සංඝ පීතෘන් වහන්සේ නමකි, වසර 62 කට පෙර එනම් 1959 ජූලි මස 21 ද අපවත් වූ, මංගල ධර්මකීර්ති ශ්‍රී ධීරානන්ද පත්බේරියේ ධම්මාලෝකාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ. උන්වහන්සේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී වූහ.**

පරකඩුව "පත්බේරිය" ග්‍රාමවරයේ "අලුත් වලව්වේ" දී විජේකෝන් මුදියන්සේලාගේ ලොකු බණ්ඩාර සහ ජයසිංහ මුදියන්සේලාගේ ලොකු මැණිකේ යන දම්පතීන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා වශයෙන් 1893 ක් වූ මැයි මස 22 වැනි දින මෙම වාසනාවන්ත කුල කුමරුවා ජන්මලාභය ලැබීය.

මව්පිය සෙනෙහස මැද වැඩුණු මෙම දරුවා පරකඩුව තලාවිටියේ සිරි විමලාරාමාධිපති ගෞරවාර්හ ගොඩිගමුවේ විමලසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේට බාර දෙන ලදුව, තත් සහෝදර කිරුළපණ ශ්‍රී පූර්වාරාමාධිපති ගෞරවාර්හ උන්දුරුගොඩ සුමනසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත පමුණුවන ලදුව ඒ දෙනමගේ ශිෂ්‍යයා වශයෙන් 1905 වර්ෂයේ දී කෝට්ටේ රාජමහා විහාරීය සිරි මංගල උපෝෂ ථාගාරයේ දී "පත්බේරියේ ධම්මාලෝක" නමින් සසුන් ගත කරනු ලැබී ය.

එවකට ප්‍රාචීන ප්‍රතිචීන භාෂාවන්හි මෙන්ම ධර්ම ශාස්ත්‍ර විෂයෙහි පාණ්ඩිත්‍යයක් දැරූ පානදුරේ වලාණේ සිරි සිද්ධත්ථාරාමාධිපති ගෞරවාර්හ කිරුළපණේ ශ්‍රී විමලාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පා සෙවණේ හිඳිමින් බණ දහම් දක්ෂ ලෙස ඉගෙනීමට 'පත්බේරියේ ධම්මාලෝක' සාමණේරයෝ වාසනාව ලැබූහ. 1914 වර්ෂයේ දී කෝට්ටේ රාජමහා විහාරීය සිරි මංගල උපෝෂථාගාරයේ දී උපසම්පද ශීලයෙහි පිහිටවනු ලැබූහ.

දේශනයට මෙන්ම ලේඛනයට ද හපන්කම් දැක් වූ තරුණ ධම්මාලෝක යතිවරයන්ගේ සිත් යොමු වූයේ ග්‍රන්ථකරණයට ය. ගෞරවාර්හ මහඅරුග්ගොඩ ධම්මරක්ඛිත අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ ගෞරවාර්හ කහතුඩුවේ විමලතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේද සහාය කරගෙන එතෙක් මුද්‍රණය කර නොතිබූ "මංගලත්ථ දීපනී" නම් ධර්ම ග්‍රන්ථය පුස්කොළ පොත්වලින් පිටපත්කර අක්ෂර ලිපි දෝෂාදිය පහකර 1927 වර්ෂයේ දී මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරවීම විශිෂ්ට වූ ධර්ම ශාස්ත්‍රීය සේවාවකි. "මංගලත්ථදීපනී" යනු මහාමංගලසූත්‍ර දේශනාව විස්තරාත්මකව වර්ණනා කළ සියම් රටේ (අද තායිලන්තයේ) "නවපුර" නගරයේ විසූ ත්‍රිපිටකධාරී "සිරිමංගල" ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් බුද්ධ වර්ෂ 2068 (ව්‍ය.ව. 1524) දී සම්පාදනය කළ ග්‍රන්ථයකි.

ධර්ම විනය දෙක්හි මනා පටුත්වය ලබාගත් පත්බේරියේ ධම්මාලෝක යතිවරයාණෝ 1932 වර්ෂයේ දී කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම මහා සංඝසභාව මඟින් පැවැත් වූ විනය විභාගයේ ප්‍රථමයාව සමත්වීම විශිෂ්ට වූ ශාසන සේවයක් සඳහා දෙර විවෘත කිරීමක් විය. සංඝ සභාවේ යාවජීව කාරක සභික ධූරයට පත්ව කැපවීමෙන් සිය සේවාව ලබා දුන් උන්වහන්සේ 1949 වර්ෂයේ දී උප ලේඛක තනතුර ද කිරුළපණ ශ්‍රී විමල අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1955 වර්ෂයේ දී මහනායක පදවියට පත්වීම නිසා පුරප්පාඩු වූ ප්‍රධාන ලේඛකාධිකාරී ධූරයට පත් කරනු ලැබූහ. උන්වහන්සේ මෙම භාර ධූර තනතුරේ වගකීම මැනවින් ඉටුකරමින් ගිහි පැවිදි සැමගේ සම්භාවනාවට ලක් වූහ. එමෙන්ම දීර්ඝ සේවය අගය කළ සංඝ සභාව කෝට්ටේ රාජමහා විහාර පාර්ශ්වයේ උපාධ්‍යාය හා ප්‍රධාන සංඝනායක ධූරයට පත් කරනු ලැබිණ.

සිය ගුරු හිමි අවසරය ලබා ධම්මාලෝක හිමියෝ 1937 වර්ෂයේ දී තලාවිටියේ සිරි විමලාරාම විහාරස්ථ ශ්‍රී ධර්මාර්ථ සාධක සමිතිය පිහිටුවා, එමඟින් සුවිසල් ධර්ම ශාලාවක් කරවීමෙන් හා ගල්පඩි 165කින් යුත් ප්‍රවේශ මාර්ගය ගොඩනැංවීමෙන් ද තරුණවියේ සිටම විහාරාරාම සංවර්ධනයෙහිලා දැක් වූ සුවිශේෂ ප්‍රාගුණ්‍යය ප්‍රකට කළහ. එමෙන්ම 1927 අගෝස්තු 07 වැනි දින කළුබෝවිල දේවානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ඇවැමෙන් රාජගිරියේ ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරයේ ආධිපත්‍යයට පත්ව 1947 වර්ෂය දක්වා එහි වැඩ වෙසෙමින් අභිනවයෙන් සංඝාවාසය, ධර්මශාලා, විහාර මන්දිරය නිමකරවා දර්ශනීය විහාරස්ථානයක් බවට පත් කළහ.

දූර දක්නා සංඝපීතෘන් වහන්සේ නමක් වශයෙන් සසුනට වැඩ ඇති ශිෂ්‍ය පිරිසක් ඇතිකළ පත්බේරියේ ධම්මාලෝක නාහිමියන්ගෙන් සිය ගුරුකුලය වූ විද්‍යෝදය පිරිවෙන ඇතුලු උසස් අධ්‍යාපන ආයතනයන්ගෙන් ධර්ම ශාස්ත්‍රාදිය ප්‍රගුණ කළ ශිෂ්‍ය පිරිසක් ද සසුනට දායාද කෙරුණි. එම ශිෂ්‍යයන් අතර අතිජාත ශිෂ්‍යවරයා වූයේ කෝට්ටේ මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී (1959 - 1984) හා අනුනායක (1968 - 1994) ධූරයන්ට පත් වූ උපාධ්‍යාය රාජකීය පණ්ඩිත විද්‍යාවිශාරද, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය රද්දැල්ලේ ශ්‍රී පඤ්ඤාලෝක (1909 - 1994) ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. සෙසු ශිෂ්‍යයන් වූයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංඝනායක තලාවිටියේ ශ්‍රී පේමාලෝක (1914 - 1998) සපරගමු පළාතේ උප ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රවිශාරද සද්ධර්මවාගීශ්වර ඉඹුල්පිටියේ නන්දලෝක (1916 - 1989) කිරිගම්පමුණුවේ ශ්‍රී සුධර්මරත්නාරාම රාජමහා විහාරාධිකාරී අමුහේන්කන්දේ පුඤ්ඤලෝක යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ය.

මෙලෙසින් අනුපම සසුන් මෙහෙවරක් ඉටුකළ නාහිමිපාණෝ 1959 ජූලි 21 වැනි දින සිහිනුවණින් අපවත් වී වදාළහ. පූජ්‍ය පත්බේරියේ ශ්‍රී ධම්මාලෝක නාහිමියන්ට අමාමහ නිවන් සුව ලැබේවා.

කිරුළපණ ශ්‍රී පඤ්ඤාලෝක මූලික පිරිවෙනේ
නියෝජ්‍ය පරිවේණාධිපති රාජකීය පණ්ඩිත
**රද්දැල්ලේ නන්දවිමල හිමි**

# හඟ්ගමුවේ සිරි රතනාලංකාර මාහිමි

**වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ යටිකහ කෝරළේ, කුලියාපිටියට නුදුරු ඉහළ හඟ්ගමුවේ, හේරත් මුදියන්සේලාගේ උක්කු බණ්ඩා හා ඉලංකෝන් මුදියන්සේලාගේ ජොහානාහාමි යන දම්පතීන්ට දාව පවුලේ සයවන දරුවා ලෙස හේරත් මුදියන්සේලාගේ ධර්මසේන යන ගිහි නාමයෙන් ක්‍රිස්තු වර්ෂ 1927 ක් වූ දෙසැම්බර් මස 30 දින, ජන්ම ලාභය ලදහ.**

කුඩා කල සිටම තමන්ගේ පූර්වකෘත පුණ්‍යමහිමය ප්‍රකට කළ ධර්මසේන කුල කුමරුන්, 1942 නොවැම්බර් 13 වන දින ප්‍රවෘජ්‍යා භූමියට පත් විය.

මූලික බණ දහම් ඇදුරු පා සෙවණේ ලත් රතනාලංකාර සාමණේරයන් වහන්සේ, ස්වකීය ඇදුරු පරපුරේ විද්‍යාස්ථානය වූ ලක්දිව සුපතළ කීර්තිමත් පරිවෙණස්ථානයක් වන, සඳලංකාව, ශාස්ත්‍රොදය මහපිරිවෙනෙහුත්, අනතුරුව වැඩිදුර අධ්‍යාපනය ලබනු වස් හැරම්ටිගල ශාස්ත්‍රාලංකාර මහ පිරිවෙනට ඇතුළත් වූහ. එහිදී, හැරම්ටිගල ශ්‍රී ධීරානන්දාභිධාන අනුනායක මාහිමියන් සෙවනේ හිඳිමින් සිංහල, පාලි, සංස්කෘත ආදී විෂයයන් මනාව උගත් හ.

අනතුරුව උන්වහන්සේ උගතමනා බණ දහම් සපුරා 1950 ජූනි මස 14 වන දින, මහනුවර මල්වතු මහාවිහාරයීය රාජපූජිත මංගල උපෝෂථාගාරයේ දී, "වාහල නාග" යන නාමයෙන් සුපරිශුද්ධ වූ උපසම්පද සීලයට පත්වූහ. එහිදී, හැරම්ටිගල අනුනා සමිඳුන්ගේ ඇරයුමෙන්, රචනා කරන්න යෙදුනා වූ "මහාවිහාර වංශය" නම් වූ ග්‍රන්ථය, මහානායක ස්වාමීන්ද්‍ර වර ප්‍රමුඛ සානුනායක විංශත්වර්ගික කාරක සංඝ සභාවේත් රැස්ව සිටි සියල් දනගේත් පැසසුමට බඳුන් විය.

අනතුරුව උසස් අධ්‍යාපනය ලබනු වස් පැලියගොඩ ශ්‍රී විද්‍යාලංකාර පිරිවෙනට ඇතුළත් ව, කිරිවත්තුඩුවේ ශ්‍රී පඤ්ඤාසාර, යක්කඩුවේ ශ්‍රී පඤ්ඤාරාම ආදී යතිවරුන්ගේ ආශීර්වාදය මධ්‍යයේ තම වියත් කම් විදහා නිසි අයුරින් උසස් අධ්‍යාපන කටයුතු සිදුකළහ. උසස් අධ්‍යාපන කටයුතුවලින් පසුව, රතනාලංකාර හිමියෝ පරිවේණාචාර්යවරයකු ලෙස වසර 33 ක පමණ කාලයක් සඳලංකා ශාස්ත්‍රෝදය හැරම්ටිගල ශාස්ත්‍රාලංකාර, පැලියගොඩ විද්‍යාලංකාර, දෙමටගොඩ විද්‍යාලංකාර, හබරාදුව විද්‍යාරත්න, කොබෙයිගනේ ශ්‍රී සද්ධර්මෝදය හා දෙල්ගොඩ කල්‍යාණප්‍රදීප ආදි පරිවෙණස්ථානයන්හි දිවයිනේ නොයෙක් දෙස, බොහෝ ගිහි පැවිදි සිසුන්ගේ උන්නතිය උදෙසා සිදු කළ මෙහෙය අතිමහත් ය. උන්වහන්සේගේ ධර්ම, ශාස්ත්‍ර හදාළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර, මාදුලුවාවේ සෝභිත, බෙංගමුවේ නාලක ආදී හිමිවරුන් ප්‍රධාන ය.

උන්වහන්සේ විසින් රචනා කරන්නට යෙදුනා වූ ග්‍රන්ථයන් අතර, මහාවිහාරවංශය, මංගල නාදය,, සිංහල සාහිත්‍ය විචාරය, මහණකම 1, 2, 3 සැබෑ මිනිස්කම 1, 2, 3 පාලි නාම පදමාලා කම්මවාචා, උදාන ථෙර, ථෙරීගාථා, ධම්පදට්ඨ කථා ව්‍යාඛ්‍යා, සුබෝධිනී පාලි භාෂා 1 භික්ඛු පාතිමෝක්ඛය අපේ ජනකවි විචාර, ස්‍යාමෝපසම්පදාවත( සංස්කරණය) ආදී ග්‍රන්ථ කැපී පෙනෙන ග්‍රන්ථයන් වෙති.

මේ සියලු වැඩ කටයුතු අතර, තම අරම වූ මැටිකොටුව සුදස්සනාරාමය, අටමුනි සෑය, බෝධි ප්‍රාකාර ආදී නවාංග එකතු කරමින් ප්‍රදේශයේ පිහිටි දැකුම්කළු අරමක් බවට පත් කළහ. එපමණක් නොව මැටිකොටුව සිරි ගුණානන්ද දහම් පියස පිහිටුවීමට උන්වහන්සේගේ අවවාද අනුශාසනා නිතැතින් ලැබුණි. මෙසේ රටට, දැයට, සසුනට නිහඬ සේවයක් කළ උන්වහන්සේ දිවියේ අනියත බව ප්‍රකට කරමින් 2012 අප්‍රේල් 15 දින අපවත් වී වදාළහ. උන්වහන්සේට අමා මහ නිවන් සුව ලැබේවා.

**එස්.ඒ. දුලංජන් රවිනාත් සමරප්පෙරුම**



# සදහම් අරණ



සංස්කරණය - **නයනා නිල්මිණී**

## බුදු හිමි පුදමු

දෙදහස් හයසිය හැටපස් වසරක් ගෙවුවා
අප මහ බෝසත් බුදු වී එදිනා
තවමත් සසරේ ඉම නැත පෙනුණා
පුහුදුන් දන හැම සසරෙක ඇලුණා

මල් ගඳ දුම් ගෙන පියවර මැන්නා
වත් පිළිවෙත් වෙත සිත යොමු වන්නා
පුන් සඳ එළියේ බණ පද ඇසෙනා
සම්බුදු සමිඳුන් වැඩ සිටි මඟ පෙනෙනා

පිළිවෙත් පුරමින් සැම පෙළ ගැසුණා
දම් රස විඳ දිවි මඟ එළි කරනා
භවයෙන් භවයට යන මඟ වැසුණා
බෝසත් අපි සැම නිවනින් ඇලුණා



**මහආරගම සුදස්සන හිමි**
2 වසර
ශ්‍රී සුමන සාමණේර ආයතනය, වෙහෙරයාය

## ආදර අම්මා

දස මසක් කුස දරා මා මෙලොවට බිහි කළ අම්මේ
ලේ කිරි කර පොවා මාදැඩි කළ අම්මේ
අකුරු ඉලක්කම් කියලා දුන් අම්මේ
මගේ ලෝකයේ හිරු සඳු ඔබ අම්මේ

**රවිදි චමත්මා ජයතිලක**
5 ශ්‍රේණිය
මියුසියස් විදුහල, කොළඹ

## ළමා ප්‍රහේලිකා අංක 25

| | | | | |
|---|---|---|---|---|
| 1 | | | ■ | 2 ශු |
| | ■ | ■ | 3 හ | |
| | ■ | 4 ද | | |
| ■ | 5 නි | | | ■ |
| 6 බා | | ■ | 7 | |

**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

### හරහට

1.වස් කාලය අවසානයේ මෙම පින්කම් පැවැත්වේ
3.ස්පර්ශය ගෝචර වනුයේ ශරීරයේ මෙම කොටසට ය
4.භාවනානුයෝගීව සිටීමට යොදාගන්නා වනගත පෙදෙස මෙසේ හැඳින්වෙයි
5.මුව දඩයමේ ගිය දෙවන පෑතිස් රජුහට මිහිඳු හිමියන් ඇමතුවේ මෙ නමින් ය
6.සහනයක් ලබා ගැනීම සඳහා දෙවියන්හට ප්‍රතිලාභයක් පොරොන්දුවීම මෙසේවීම ලෙස හැඳින්වෙයි
7.පුදපූජා සඳහා ගනු ලබන සුලභ පලතුරු වර්ගයකි

### පහළට

1.දීර්ඝ කාල පරාසයන් දැක්වීමට බෞද්ධ සාහිත්‍යයේ යොදන කාල ඒකකයකි
2.බෞද්ධ පැවිදි පාර්ශ්වයේ අනන්‍යතාව හඟවන තවත් පදයකි
3.ගෞරවාදරය යන අර්ථයෙන් යෙදෙන වචනයකි
4.චතුරංගනී සේනාවෙන් එක් කොටසකි
5.පහනක දැල්ල කරා තෙල් සැපයෙනුයේ මේවා ආධාරයෙනි

## මව්පියන් රැක ගනිමු

අප ලොව්තුරා බුදුරජාණන් වහන්සේද බෝධිසත්ව අවධියේ තම මවට සිදුකරන ලද උපස්ථාන ඉතා නිරවුල්ව මූලාශ්‍රවල සඳහන් වී තිබේ.

වත්මන් සමාජය තුළ බොහෝ සෙයින් වැඩිහිටි නිවාස ව්‍යාප්ත වී පවතියි. මීට හේතුව වන්නේ වර්තමාන සමාජයේ සිටින දූ දරුවන් කායිකව වර්ධනය වූවත් ආධ්‍යාත්මික වශයෙන් පිරිහී තිබීම යි.

මෙසේ කෲර අයුරින් මව්පියන්ට සලකන දරුවන්ට ද යම් කලෙක මුහුණ දීමට සිදුවන්නේ එවැනිම වූ ඛේදවාචකයකට යි. එහෙත් ඇතැම් පිරිසක් මව්පියන්ගේ අගය මැනවින් වටහාගෙන ඔවුන්ට අවශ්‍ය සියලු ඇප උපස්ථාන ලබා දී ඉතා කාරුණිකව රැක බලා ගනියි. එවැනි දරුවන් සමාජයට මෙන්ම මුළු මහත් ලෝකයටම සම්පතකි. එනිසා අපිද මව්පියන්ට උපස්ථාන කරන, රටටත් ලෝකයටත් වැඩදායී වූ දරුවන් වෙමු.




**ගේලක රුබේරු**
09 ශ්‍රේණිය
මධ්‍ය මහා විදුහල,
ගලෙන්බිඳුනුවැව

### නෙළුම් විල



**රාජාංගනයේ සුමනජෝති හිමි**
02 ශ්‍රේණිය
ශ්‍රී මහා මහින්ද පිරිවෙන,
අනුරාධපුරය

### වෙසක් කූඩු



**පේත්මි සේසදී ජයසේකර**
07 වසර
ශ්‍රී සුධර්මාවර්ධන දහම් පාසල,
අවිස්සාවේල්ල

### මිකී



**ඒ.ඒ.එස්. දම්සරණී**
01 ශ්‍රේණිය
ඉසුරු ප්‍රාථමික විදුහල,
කුරුණෑගල

### බෝධි පූජාව



**සිතිජ දෙනුවන්**
03 ශ්‍රේණිය
සුවිසුද්ධාරාම දහම් පාසල,
වැල්ලවත්ත

## දහම් පාසල් යමු

මල් කැකුළු වගේ
පුංචි ළමා අපි
එකතු වෙලා යාළුවෙලා
සමඟිවෙලා
දම් පාසල් යමු
දහම් ඉගෙන ගෙන
නැණ නුවණ වඩා
සතුටින් ඉමු අපි යහළුවනේ

**හිමාෂා අමන්දි දිසානායක**
09 ශ්‍රේණිය
ශ්‍රී සෝමානන්ද දහම් පාසල, හැඟව

## පැන විසඳුම්

දයාවංශ ජයකොඩි සහ සමාගම

**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

**මගේ ලෝකයේ වීරයා** යන මාතෘකාව පිළිබඳ කෙටි රචනාවක් නිර්මාණාත්මක ව ලියා අපවෙත එවන්න.

ජයග්‍රාහී දරුවකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පොතක් පිරිනැමේ.

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

**සම්පූර්ණ නම** :– ..................................................

**පාසල / දහම් පාසල** :– ..................................................

**ඉගෙනුම ලබන ශ්‍රේණිය** :– ..................................................

**ලිපිනය** :– ..................................................

**දුරකථන අංකය** :– ..................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**

# පහන් සිතක කවි

සංස්කරණය
දීපා පෙරේරා

## පැතුම

ගෝඨාභය නිරිඳු තම සවි බල කෙරුම
හිමිසඳ මලියදෙව් රහතුන් නිති සැරුව
සදහම් සුවඳ පිරි දන පාරමී පිරුව
පුදනෙමු බැතින් වට්ටාරම නිසි ගරුව

අරලිය ඇහැළ මැයිමල් පිපි නෙක පාට
වපුරයි සුවඳ පුදබිම තෙමගුල දට
පෝසඳ රැසින් බබළන දාගැබ රැට
දෙව් බඹු පැමිණ පුදයති මැදියම ඊට

රෝපිත දෙතිස්ඵල බෝධිය අති පැරණී
තෙද බල හැඳින සෙත අයදිති දන පැමිණී
රන්වැට බෝධිවට ඇති නිසලව රමණී
පින් ලැදි සැමගෙ සමගියෙ මුතු ඇත ඇමිණී

පව්මල කෙලෙස් දුරලන සිත කය දවන
පෝයට දසත සිල් සුවඳින් සිත නිවන
රොදබැඳ දනෝ පුදබිම වෙත පිය තබන
පැතුමන් පතති මතුබව දැකුමට නිවන

ගම්බර දෙවිඳු නිති සුරකින දෙනෙත යොමා
රහතුන් වැඩිය බිම පිරි මුනි දහම අමා
සැදැහැ පින් සිතින් වැඳ නිති තම සිරස නමා
මෙත් බුදු හමුව අපි කරලමු සසර නිමා

**ටී.ඇම්. පොඩිරාලහාමි**
වට්ටාරම

## රෝ බිය දුරුවේවා

කවි පබැඳුමට හිත නොයෙදෙයි විඩාබර
සිතද අවුල් වී නොයෙකුත් කතා බර
පෙම්බර දරුවන් හමුවිය නොහැක දයා බර
මෙතරම් දරුණු වූයේ ඇයි කොවිඩ් බර

රටටම අදෝනාවකි නුඹ පැමිණීම
ඉවසා සිටිනු බැහැ මේ ලෙස මිය යාම
ඉස්සර තිබූ ලෙන්ගතුකම් නැහැ තවම
කොයි කවුරුවත් නැත අද නම් මා ගාව

සැමට නිදුක් නිරෝගි බව ලැබේවා.
දරුණු කොවිඩ්වලින් අප රැකදේවා
ජය ශ්‍රී මහා බෝ සමිඳු පිහිට සැමට ලැබේවා
මුළු සිරිලක ම පෙර ලෙස නිදහස් වේවා.

**ඇල්.ජේ. ආනන්ද ශීලී පෙරේරා**

## මිනිසුනි කවදද එළිය දකින්නේ

තණ්හා ආශා පොදි බඳිමින්නේ
මිසදිටු බවකිනි සසර ගෙවන්නේ
දුක් ඝණ දුරු නැත පහ වී යන්නේ
ජීවිත අඳුරේ කාලෙ ගෙවන්නේ

ගුණ නැණ නැත මිනිසුන් අඳුරන්නේ
පුහු ආටෝපෙති කාලෙ ගෙවෙන්නේ
බව දුක නැසුමට සසර සොයන්නේ
මිනිසුනි කවදද එළිය දකින්නේ

බුදු හිමි දෙසූ ඒ මග සොයමින්නේ
ජීවිත ගමනට අරුත සොයන්නේ
යන මඟ හරි බව තෝරා ගන්නේ
එවිටයි මිනිසකු පිරිපුන් වන්නේ

**ජේන්. සීලවතී,** තඹුත්තේගම

මෙවර ජයග්‍රාහී කවිය

## බුදුමඟ වැඩි පුතුට

හදවත ඇතේ නිති ඉල්ලූ කිරි සුවඳ
හිමි වෙත එවන්නම් මුසු කොට මල් සුවඳ
පුරසඳ වගේ දිදුලන ඔබෙ සිල් සුවඳ
පුතු මගෙ වඩී විහිදුවමින් බුදු සුවඳ

මෙමා කුසට පුතු ආ ඒ දිනේ සිට
තෙමා ළයම කිරි එරුණා පුතු නමට
පමා නොවන්නට සසරේ කිසිම විට
අමා ගඟුල අද සැරසේ මෙත් පුරට

දම් රස මුසුව නිවි නිවී සැනසෙන උවන
කර්ම සැප අතැර කෙරුවයි අභිනිෂ් ක්‍රමණ
සම්බුදු මගට පිළිපන් සත්සුන් ගමන
නිම් නැති සසර නිම කර ලැබ ගනු නිවන

කරුණා හරිත හිමි හද පතුලින් ගලනා
වරුසා දහම් මිණි කැට සිසිලස දරනා
සරණා සසර සමුදුර කෙළවර දකිනා
පුරණා පෙරුම් පුතු මතු බුදු බව ලබනා

රන් රුවින් දිලි දිලි සේ මියුරු පුන්සඳ
පා පියුම් තබ තබා හිමි දනට වැඩි සඳ
මා සුසුම් දැවි දැවී හිමි දෙපා වැඳි සඳ
කෙලෙස් ගිනි නිව නිවා දම් දෙසයි පින් කඳ

**ඒ.එල්. ගීත්මා ඔමන්දි පෙරේරා**
11 ශ්‍රේණිය
ශ්‍රී බෝධිරාජ දහම් පාසල



## දහම් මඟ

දිවි මගෙහි ගත සිතට
පැමිණෙනා දුක් ගැහැට
හසු කළොත් දම් මගට
මාවතය සැනසුමට

නොගෙන එක පැත්තක්
දකින්නට ඇත්තක්
යන්න ජය ගමනක්
සැබෑ දිවිමග කරමු සවියක්

යථාවම නිසි දකිමු
පලයෙ හේතුව දකිමු
හේතු මුල් නසාලමු
සදු සැනසුම ලබමු

කිතුල්ගල **රත්නසේකර රූපසිංහ**



## සුවඳ හමන මලක් වන්න

සුවඳ හමන මලක් වගේ සුවඳ හමන්න
පවස නිවන දිය දෝතක් වගේ සිටින්න
සවන පිනන මිහිරි වදන් නිතර දෙඩන්න
වැඩිහිටියන් දෙන ඔවදන් හොඳින් අසන්න

**කපිල කෝරලේගේ,** සුදුවැලිපත, උඩුගව



ඇසළ පුන් පොහෝද බුද්ධ නියමය අනුව සෑම විහාරස්ථානයකම භික්ෂූන් වහන්සේ වස් සමාදන් වීම සිදු කෙරේ. ඒ අනුව ගොතටුව පාරමිතා විහාරස්ථානයේ අරම ශ්‍රී ධම්මතිලක නා හිමි ඇතුළු මහසඟරුවනට වස්වසා වැඩ වසන ලෙසට ජනකකුමාර මහතා සහ අජිත් කුමාර මහතා ඇතුළු පවුලේ සැම දැහැත් පිළිගන්වා වස් ආරාධනා කළ අයුරු.

## ලේ දන්දීමේ පින්කමක්

කහතුඩුව පරිසර මිතුරු සංසදය මෙහෙයවන ලේ දන්දීමේ පින්කම අගෝස්තු 14 දින පෙරවරුවේ කහතුඩුව ශ්‍රී නන්දනාරාම විහාරස්ථානයේදී විහාරාධිපති පිටිගමුවේ සුමනතිස්ස හිමියන්ගේ අනුශාසනාවෙන් සියලු සෞඛ්‍ය නීතිරීති වලට අනුගතවෙමින් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

## ප්‍රාර්ථනා

බුදු මඟ යන්නට නො ලැබුණේ මා හට
පින් කර නැති හින්දයි සසරේ
මෙතේ බුදුන් බුදුවන මතු දිනයට
උපදින තුරු සිටිනෙමි අඳුරේ

සිදුහත් කුමරා සත් පියුමන් මත
සක්මන් කරනා සුබ මොහොතේ
ඒ එක පියුමක් මා වූවා නම්

සසරේ නැත මා අද දිනයේ
නේරංජන ගඟ ඇසතු බෝධියට
බුදු හිමි වඩිනා සුබ නැකතේ
පැගෙන පරඬැල බුදු හිමි පතුලට
මා වූවා නම්....
කුසිනාරාවේ සාලවනේ
පිරි නිවනේ හිමි සැතපෙන යාමේ
තුරු අග සුපිපුණු එකම මලක සිරි
ගන්නට බැරි වුණ එක කරුමේ

**අනුර ජයවීර**
පස්සර පාර, හිඳගොඩ

## කවි කිවිඳියනට සතර පෝදාටම දහම් තුටු පඬුරු

බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස ඉල් පුර පසළොස්වක පෝද සිට දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.

බුදුසරණ
පහන් සිතක කවි
BCC

සම්පූර්ණ නම :– ..................................................
ලිපිනය :– ..................................................
දුරකථන අංකය :– ..................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා, පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.



# කට වරද්දාගෙන අපායට යන හැටි

**පෙර ආත්ම භාවයන්හි මිනිසත් බව ලබා සිදු කරන ලද අකුසල කර්මයන් නිසා නොයෙක් අයුරින් දුක් ගැහැට විඳින අයුරු පෙන්වා දෙන පේත වත්ථු පාලිය තුළින් ගත හැකි ආදර්ශ බොහෝ ය. එහි උරග වග්ගයට අයත් පූතිමුඛ පේත වත්ථුව පිසුණු බස් හා මුසා බස් කීම නිසා විඳින වේදනා සහ කටුක විපාක කදිමට පෙන්වා දෙනු ලබයි.**

දිනක් නාරද තෙරුන් වහන්සේ දෙවියකුගේ ශරීරයකට සමාන සිරුරකින් යුත් අහසෙහි සිටින එහෙත් මුඛය බෙහෙවින් දුගඳ හමන, පණුවන් සහිත, ප්‍රේතයෙක් දුටුවහ. ප්‍රේතයා දුටු උන්වහන්සේ ඔහුගෙන් අසන ප්‍රශ්නය වන්නේ පෙර කුමන කර්මයක් කොට මේ අයුරින් ඉපදී දුක් විඳින්නේ ද? යන්නයි.

මේ අයුරින් ඔහුගේ ම මුඛයෙහි සම සිදුරු කරමින් දුගඳ හමන පණුවන් සහිත සිටින ප්‍රේතයා නාරද තෙරුන්ට ලබාදෙන පිළිතුර වන්නේ මෙලෙසිනි.

මම පෙර ආත්ම භාවයක දුෂ්ඨ වචනයෙන් යුත්, වාග් ද්වාරයෙන් අසංවර වූ ශ්‍රමණ වේශධාරී පවිටු මහණෙක් වූවෙමි. බඹසර බෙලෙන් මාගේ ශරීරය වර්ණය ලදමි. එහෙත් පිසුණු බසින් මාගේ මුඛය දුගඳ හමන්නේ වෙයි. මේ අයුරින් ප්‍රේතයා තමා පෙර කරන ලද අකුසල කර්මය හා එයින් තමා විඳින දුක් ගැහැට මැනවින් විවරණය කරමින් දක්වනු ලැබී ය. මෙලෙස දක්වමින් නාරද තෙරුන්ගෙන් ප්‍රේතයා අවසාන වශයෙන් ඉල්ලීමක් සිදු කරනු ලබයි.


නාරද තෙරණුවනි, ඔබ වහන්සේ විසින් ම මා සිරුර දක්නා ලදී. බුද්ධාදී උත්තමයන් යමක් ප්‍රකාශ කළාහු නම් මම එයම ඔබට කියමි. මුසාබස් හා පිසුණු බස් නො කියන්න එකල්හි ඔබ කැමැති සැප විඳින දෙවියෙක් වන්නාහු ය. නාරද තෙරුන් හා පූතිමුඛ ප්‍රේතයා අතර ඇති වූ මෙම සංවාදය තුළින් පැහැදිලි වන්නේ වචනයෙහි අසංවරකම නිසා විඳිනු ලබන කටුක දුක් වේදනාවන් පිළිබඳව යි.

> ‘ මම පෙර ආත්ම භාවයක දුෂ්ඨ වචනයෙන් යුත්, වාග් ද්වාරයෙන් අසංවර වූ ශ්‍රමණ වේශධාරී පවිටු මහණෙක් වූවෙමි. බඹසර බෙලෙන් මාගේ ශරීරය වර්ණය ලදමි. එහෙත් පිසුණු බසින් මාගේ මුඛය දුගඳ හමන්නේ වෙයි. ’

විශේෂයෙන් පුද්ගලයා වචනය සංවර කරගත යුතු අතර, නොමැති නම් මෙලොව වශයෙන් බොහෝ ගැටලු සඳහා මෙන්ම පරලොව දුක් වේදනාවලට ගොදුරුවීමට සිදු වෙනවා. මෙම පේත වත්ථුව තුළින් පෙන්වා දෙන්නේ එකී කාරණාව යි. භික්ෂූන් වශයෙන් පෙර ආත්ම භාවයක මුසාබස් (බොරුකීම) හා පිසුණු බස් (කේලාම්කීම) නිසා ප්‍රේත ලොව ඉපදී අනේක දුක් ගැහැට විඳින අයුරු මෙකී කතා පුවත තුළින් පෙන්වා දෙනු ලබයි. එයින් පෙන්වා දෙන ආකාරයට බඹසර යනුවෙන් කායික වශයෙන් සංවර වීම නිසා ලැබූ අනුසස් පෙන්වා දෙන්නේ දෙවියකුට මෙන් රන්වන් සිරුරක් ලැබූ බවයි. එසේම වචනයෙන් අසංවර බව නිසාම ප්‍රේතයාගේ මුඛයෙන් හටගත් පණුවන් හමේ සිවිය සිඳිමින් බොහෝ දුක් වේදනා ගෙන දෙන අතර දුගඳ හමන මුඛයෙන් යුතු හෙතෙම කො තරම් දුරට කම්පා වන්නේ ද යන්න නාරද තෙරුන්ට මැනවින් ප්‍රකාශ කරනු ලබයි. වචනය අසංවර වීම හෙවත් මුසාබස්, පිසුණු බස්, පරුෂ, බස්, සම්ප්‍රප්පලා ආදිය තුළින් පුද්ගලයා විපතට පත් වන අයුරුත්, ඒ තුළින් සසර දුක් විඳීමට සිදුවන අයුරුත් මෙම පූතිමුඛ පේත වත්ථුව තුළින් ඉතාම මනාව පෙන්වා දෙනු ලබනවා.

“කාය වාචනං සමෝදනං සීලං” යන බුද්ධ වචනයට අනුව කය හා වචනය සංවර කර ගැනීම සීලය යි. සිල් රැකීම තුළින් මෙලොව හා පරලොව බොහෝ අනුහස් ලබා ගැනීමේ හැකියාව පවතී. පේතවත්ථු පාලියේ එන මෙම ප්‍රේත වත්ථුව අපට ලබා දෙන ආදර්ශය බෙහෙවින් වැදගත් වනු ඇත.

ගාල්ල ශ්‍රී ලංකා ධර්මදූත මහ පිරිවෙණේ ආචාර්ය, ශාස්ත්‍රපති
**කනංකේ විජිත නන්ද හිමි**




## පෝය ලබන සහ ගෙවෙන අයුරු

| ඇසළ අමාවක | නිකිණි පුර අටවක |
|---|---|
| අගෝස්තු 08 ඉරිදා අපරභාග 19.11 අමාවක ලබා 08 ඉරිදා අපරභාග 19.19 ගෙවේ. ඉරිදා සිල්. | අගෝස්තු 15 ඉරිදා පූර්වභාග 09.51 පුර අටවක ලබා 16 සඳුදා පූර්වභාග 07.45 ගෙවේ. ඉරිදා සිල්. |

## ප්‍රහේලිකා අංක 20

බුදුසරණ ත්‍යාග අනුග්‍රහය බෞද්ධාලෝක පදනම

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**



### හරහට

1. විදුර ජාතකයෙහි සඳහන්වන යක්ෂයාගේ නමයි
4. බුදුබව ලබා ගැනීමට බෝසතුන් මෙම ගුණාංග දහයක් පුරන ලදී
6. මෙම සම්ප්‍රදායික ජ්‍යොතිෂය තොරතුරු පත්‍රය ශුභ, අශුභ කාල සහ පොහොය දින යනාදිය දක්වයි.
8. මාර්ගය යන අර්ථය දෙන වචනයකි.
9. ආශිර්වාදත්මක ප්‍රබන්ධයන් වන මෙම වචන සැකැසුම් තඹ තහඩුවල ලියා ශරීරයෙහි පැළඳීම ද කරති.
10. ගෘහ සේවිකාවන් සඳහා වන පැරණි භාවිත නාමයකි.
12. පන්සලකට සම්බන්ධ එහි අවශ්‍යතා සපයන ගිහියන් නම් කරන අයුරුයි.

### පහළට

1. අරහං යන බුදුගුණය අළලා ලියූ සුප්‍රසිද්ධ පැරණි සිංහල ග්‍රන්ථයකි.
2. ගල් ගුහා තුළට පර්වත බිත්තියෙන් ගලායන ජලය වළකාලීමට කර ඇති නිර්මාණයයි.
3. ඉතා නුවණැති කාන්තාවක් ලෙස මෙම දේවියගේ නම සිංහල සාහිත්‍යයෙහි කියැවෙයි.
5. මුවන්ට අභය භූමියක් වූ නිසා බරණැස ඉසිපතනයට මෙම නම යෙදිණි.
7. හින්දු ධර්මයට අයත් ග්‍රන්ථ කාණ්ඩයකි.
11. ශික්ෂා යන අරුත් දෙන වචනයකි.

**පිරුවානා පොත් වහන්සේ ඇතුළු වටිනා ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

# තිස්ස කුමරු බලහත්කාරයෙන් කඩොල් ඇතු රැගෙන යයි

දුටුගැමුණු මහ රජතුමා 42

**තිස්ස කුමාරයා විසින් කරන ලද රාජකීය සම්ප්‍රදායට පටහැනි ක්‍රියාව වෙනුවෙන් කුමක් කළ යුතු දැයි තීරණය කිරීමට කිසිවකුටත් නොහැකි විය.**

දුටුගැමුණු කුමාරයා එන තෙක් නොසිට මාගම රාජ්‍යයේ සංකේතය ලෙස සලකන කණ්ඩුල හස්ති රාජයා හොර රහසේම තමන් වෙත රැගෙන යාම අසම්මත ආකාරයෙන් මාගම රාජ්‍ය පවරාගැනීමක් බවත් එය බොළඳ ක්‍රියාවක් බවත් සෙනෙවිවරුන්ගේ අදහස විය. තම යුතුකම් පැහැර හැරීම, තම සහෝදරයාට ද්‍රෝහී වීම, අසාධාරණ ක්‍රියාවක නියැළීම ආදී චෝදනා පිලිබඳ සිතිවිලි තම සිත් තුළ තැගුණද ප්‍රසිද්ධියේ ඒ ගැන කිසිවකුත් කතා නොකළහ.

දුටුගැමුණු කුමාරයා මාගමට පැමිණි විට විහාරමහා දේවිය දීඝවාපියට යාම ගැන රට පුරා විවිධ කටකතා පැතිර ගියේ ය.

"දුටුගැමුණු කුමාරයා අඩු කුලයක තරුණියක් විවාහ කරගෙන. ඒ නිසා විහාර මහා දේවිය කළකිරිලා දීඝවාපියට ගිහිල්ලා."

"කාවන්තිස්ස රජතුමාගේ අභාවයෙන් පසු විහාරමහා දේවිය අසරණ වුණා. තනි වුණා. ඒ දුක දරාගන්න බැරි නිසා රජ මාළිගයේ නොසිට තිස්ස කුමාරයා සමඟ පිටව ගියා."

"රජතුමාගේ මරණයට තමාද වගකිව යුතුය යන හැඟීමක් මව්බිසවුන් වහන්සේට තිබුණා. ඒ සිතිවිල්ලෙන් ගැලවෙන්නට මාගම රාජධානියෙන් ඈත් වෙන්නට සිතන්න ඇති."

මෙසේ බොහෝ පිරිස් විවිධ මත පළ කරද්දී ත්‍රිපිටක තිස්ස තෙරුන් වහන්සේ විහාරමහා දේවියගේ දීඝවාපී ගමන අනුමත කළහ.

"මතුපිටින් බලන ඕනෑම අයකුට පෙනෙන්නේ මව් බිසව, ගැමුණු කුමාරයාට අසාධාරණයක් සිදු කළ බවයි. නමුත් තිස්ස කුමාරයාගේ සිතිවිලි පිළිබඳ සියුම් ලෙස කල්පනා කළ ඇය දිගාමඩුල්ල රාජධානිය මාගම රාජධානියෙන් කැඩීයාම වැළැක්වීමට නම් තමන් එහි යා යුතු බව සිතන්නට ඇති."

"ඔබ වහන්සේගේ තර්කය නිවැරැදි වන්නට පුළුවන්. තිස්ස කුමාරයාගේ ඉල්ලීම මව්බිසව පිළිගන්නට ඇත්තේ කැමැත්තෙන් නොවෙයි."

"තිස්ස කුමාරයා සමඟ දීඝවාපියට නොගියහොත් අනාගත සැලසුම් සියල්ල අවුල් සහගත වන බව පෙනීගිය නිසා කවුරුන් චෝදනා නැගුවත් විහාර මහා දේවියගේ ගමන වැරැදි නැහැ."

"නමුත් ගැමුණු කුමාරයාත් ඒ විදියටම කල්පනා කළොත් හොඳයි. එසේ නොවුණහොත් ගැටුමකට ඉඩ තියෙනවා. විහාරමහා දේවිය මෙන්ම කඩොල් ඇතු ද මේ අවස්ථාවේ ගැමුණු කුමාරයාගේ අයිතියක්. එය බලහත්කාරයෙන් පැහැරගෙන යාම රාජද්‍රෝහී ක්‍රියාවක්."

"එසේ ගැටුමක් ඇතිවුවහොත් තිස්ස කුමාරයා ළඟ මව් බිසව සිටිනවා. ඇය විචාරශීලිව එයට සුදුසුම විසඳුමක් ලබාදේවි."

"අද ඇසළ පුර පසළොස්වක පොහෝ දිනයයි. කාවන්තිස්ස රජතුමා මියගොස් අදට දින හතයි. අද දින දහවල් දානය සඳහා පන්සියයක් මහරහතන් වහන්සේලා රජ මාළිගයට වැඩම කිරීමට නියමිතයි."

"දුටුගැමුණු කුමාරයා නියමිත වේලාවට පැමිණියහොත් අද හවස යෙදී ඇති සුබ නැකතින් අභිෂේකය සිදුකරන බව කාම්බෝජ පඬිතුමා සඳහන් කළා. එතුමාගේ නැකත් වරදින්නේ නැහැ."

"එසේනම් මාහිමිපාණන් වහන්ස, දානයෙන් පසු යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට ගොස් තොරාතුරු සොයා බලමු. එහි සෙනෙවිවරුන් කිසිවකුත් නොසිටියහොත් හීපතක් මගින් ගැමුණු කුමාරයාගේ පැමිණීම ගැන සඳහන් කර තිබුණොත් අභිෂේක කරන අවස්ථාවේදී ආශිර්වාද කිරීම සඳහා රහතන් වහන්සේලා පන්සීය නමකට ආරාධනා කරමු."

"මහරජතුමා මියගොස් වැඩි දින ගණනක් ගත නොවුණු නිසා චාම් ලෙස අභිෂේක උත්සවය පැවැත්වීම සුදුසු බවයි කාම්බෝජ පඬිතුමාගේ අදහස."

"පසළොස්වක පොහොය දිනයට අපේ සැදැහැවතුන් වඩාත් කැමති අනුරාධපුරයට ගොස් පෙහෙවස් සමාදන් වීමටයි. ඒත් දැන් අවුරුදු තිහකට අධික කාලයක සිට අපට ඒ අවස්ථාව අහිමි වෙලා. මේ නිසා අපේ සිංහල බෞද්ධ ජනතාවගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගිහින්."

යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට මාහිමිපාණන් වහන්සේලා වැඩම කළද එහි කිසිවකුත් නොවිය. ආරක්ෂක සෙනෙවිවරුන්ගෙන් විමසූ විට දැන ගන්නට ලැබුණේ දුටුගැමුණු කුමාරයා පිළිගන්නට සියලු සේනාංක පෙර ගමන් කළ බවයි.

සුරනිමල, වේළුසුමන මහනෙල යෝධයින් අසුපිටින් එනු දුටු මහාස්වාමින් වහන්සේලා විහාරය දෙසට වැඩියහ. මහසෙනෙවිවරු තිදෙනාම සිලාපස්ස පිරිවෙනට පැමිණ මහස්වාමින්වහසේලා දෙනමට වැඳ නමස්කාර කළහ. ඔවුන්ගේ මුහුණුවල වූයේ ජයග්‍රාහී විලාසයකි.

"මහතෙරුන් වහන්ස, දුටුගැමුණු කුමාරයාගේ අභිෂේකය සිදුකිරීම සඳහා කාම්බෝජ පඬිතුමා සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. දාව ආචාර්යතුමාත් දැන් රජ මාළිගයට වැඩම කර ඇති. තවත් හෝරාවක් ඇතුළත දුටුගැමුණු කුමාරයා පැමිණේවි. රහතන් වහන්සේලා එහි වැඩම කරනවාද?"

රාජකීය සම්ප්‍රදායට අනුව අභිෂේක අවස්ථාවේ සංඝයා වහන්සේලා එහි වැඩම කර පිරිත් කියා ආශිර්වාද කරාවි. පිරිත් පැන්, සධාතුක කරඬුව, පිරිත් නූල් එහි ගෙනගොස් උස තැනකින් තබන්න. සංඝයා වහන්සේලා පන්සීය නමකට ආසන පනවන්න."

"සධාතුක කරඬුව ඇතුළු පූජා භාණ්ඩ වැඩමවීම සඳහා දාඨ සේන මහසෙනෙවිතුමා නියමිත වෙලාවට පැමිණේවි."

'මහා සෙනෙවිවරුනි, ඔබලා තිදෙනා මහරජතුමා මහමඟ දමා පැමිණීම එතරම් හොඳ දෙයක් නොවෙයි."

"මහා තෙරුන් වහන්ස, අප සියලු දෙනා වෙනුවෙන් අපේ සේනාධිපති නන්දිමිත්‍ර තිස් දහසක බල සේනාවක් සමඟ පෙරමුණේම ගමන් කරනවා. චතුරංග සේනාවේ විසි දහසකට අධික බල සේනාවක් ඉන්නවා. චූලංග කඳවුරුවලින් මාගමින් ගිය සේනාංකවලට එකතුවුණු බලසේනාව ඊටත් වඩා වැඩියි."

දුටුගැමුණු රජතුමා පිළිගැනීමට මඟ දෙපස රැස්වුණ ජන ගංගාව නඟන ජය ඝෝෂාව රජරට ජයගත් දා නඟන ජය ඝෝෂාව මෙන් ඇසෙන්නට විය.

මේ සියල්ල මේතරම් ඉක්මනට සංවිධානය කළේ කොහොමද? කුමාරයා පුසුල් පිටියේ ඉන්නා බව දන්නේ කවුද? ත්‍රිපිටක තිස්ස හිමියෝ මදසිනහවකින් යුක්තව විමසූහ. සෙනෙවිවරු වේළුසුමන දෙස බැලූහ.

මාහිමිපාණන් වහන්ස මේ සියල්ල කලින් සංවිධානය කළ ඒවා නොවේ. සියල්ල අහඹු සිදුවීම්. තිස්ස කුමාරයා විසින් සිදු කරන ලද රාජ්‍ය විරෝධී ක්‍රියාව නිසා මෙබඳු උත්සවයක් පැවැත්වීමේ අවශ්‍යතාව අප තේරුම් ගත්තා. නමුත් පියරජතුමා මියගොස් දින කිහිපයක් පමණක් ගතවී ඇති නිසා එය චාම් අයුරින් පැවැත්වීමට කටයුතු සංවිධානය කළා.

අයන්ති විතාන



**සිරි සදහම් පැන විසඳුම්**

**බුදුසරණ**

*සතියේ ප්‍රශ්නය - 61*

**අජාසත් කුමරු පීතෘ ඝාතකයෙක් බවට පත්වුයේ කවරකු ඇසුරු කළ නිසාද?**

**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.**

**සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ.**

පිළිතුර : ..........

නම : ..........

නිවසේ ලිපිනය : ..........

..........

දුරකතන අංකය : ..........

**ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.**

ඇම්. ඩී. ගුණසේන – බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10



සාලිය ජාතකය

# අනුන්ට කැපූ වළේ තමන් වැටුණු හැටි

**නයා, පොළඟා හෝ එවැනි සර්පයින් විෂ සහිත ය. සිංහයා, වළහා, ව්‍යාඝ්‍රයා, දිවියා වැනි සතුන් මාංශ භක්ෂක ය. එබැවින් ඔවුගෙන් ආරක්ෂා විය යුතු ය. මෙලෙස දිය ගොඩ සැම තැන වාසය කරන තිරිසන් සතුන්ගේ ආවේණික ලක්ෂණ වටහා ගත හැකි වෙයි. එහෙත් මනුෂ්‍යයා කිසිදු අයුරකින් විශ්වාස කිරීමටත්, අවබෝධකර ගැනීමටත් නො හැකි ය. ඔවුහු තම සිතුවිලි වාසියටම පෙරළා ගනිති.**

**අයෙක් විශාල මන්දිර ඉදිකර ගනිති. තවත් අයෙක් ආරක්ෂිත බැමි ඉදිකර ගනිති. කවර ආරක්ෂක උපක්‍රමයක් යෙදුවත්, කො පමණ සැප සම්පත් ලැබුවත් ජීවිතයෙන් සමුගත යුතු ය. ශරීරය පොළොවට පස්වීමට දැමිය යුතු ය. මෙම සත්‍ය තත්ත්වය අවබෝධ කර නො ගැනීම මිනිස් සිතිවිලි විෂ සහිතවීමට බලපා ඇත.**

**ඇතැම්හු සත්‍යය අවබෝධ කර ගත්තත් වැරදි මාර්ගයේම ගමන් කරති. එයට හේතුව අධික තෘෂ්ණාව යි. එබැවින් සත්‍ය නිවැරැදිව සිහියෙන් යුක්තව අවබෝධ කර ගනිමින් අනුගමනය කළ යුතු ය.**

**මහරහත් උතුමන් වහන්සේලා හැරුණු විට ලොව උපන් මනුෂ්‍යයාගේ සිතෙහි ව්‍යාජය, කපටි, ක්‍රෝධජනක සහ වෛරී සිතිවිලි පහළ විය හැකි ය. ස්ථානෝචිත ප්‍රඥාව සහ සිහිබුද්ධියෙන් කටයුතු කිරීම එයින් වැළකී සිටීමට ඇති මාර්ගයයි. එබැවින් ජීවිතය පවතින තෙක් සිහියෙන් සහ බුද්ධියෙන් ජීවත් විය යුතු ය. එවැනි අවස්ථාවක් බුදුරජාණන් වහන්සේ "සාලිය" ජාතකයේ දී දේශනා කොට වදාළහ. එම කථා පුවත මෙසේ ය.**

අප ගෞතම බුදුරජාණන් වහන්සේ බිම්බිසාර මහරජතුමා විසින් ඉදිකර දුන් වේළුවනාරාමයේ වැඩවාසය කරන්න පටන් ගත් කාලයක් උදා වුණා. බුදුරජාණන් වහන්සේ යම් විහාරයක වැඩ සිටිනවාද එම විහාරයට භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිසම ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට පැමිණීමේ පුරුද්දක් එකල තිබුණා. ධර්ම දේශනාවට බුදුරජාණන් වහන්සේ වැඩම කරවන වේලාව උදාවන විට සියලු දෙනාම ධර්ම මණ්ඩපයට පැමිණ ධර්මය ගැන සාකච්ඡා කරමින් කාලය ගත කරන්න පුරුදුව සිටියා. නිරර්ථක කථාවලින් වැළකී සිටීමට බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ද ලැබී තිබුණා.

දිනක් දම් සභාවට එකතු වූ පිරිස දෙව්දත් තෙරුන් වහන්සේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ මරණයට පත් කිරීමට යෙදූ විවිධ උපක්‍රම පිළිබඳවත්, ඒ තෙරුන්ගේ දුෂ්ටකම් ආදියත් සාකච්ඡා කරන්න පටන් ගත්තා.

ධර්ම දේශනාවට කාලය පැමිණ ඇති නිසා බුදුරජාණන් වහන්සේ පිරිවර සංඝයා සමඟ දම් සභාවට පැමිණ පණවා තිබූ අලංකාර ධර්මාසනයේ වැඩ හිඳ තමන් වහන්සේ වැඩම කිරීමට පෙර දම්සභාවේ සාකච්ඡා වූයේ කවර කරුණක් දැයි විමසා සිටියා. රැස්ව සිටි පිරිසත් ගෞරවයෙන් යුක්තව සියලු පුවත් සැල කර සිටියා. එම පුවත් අසා බුදුරජාණන් වහන්සේ පිරිස අමතා මෙහෙම දේශනා කළා.

'පින්වත් මහණෙනි, දේවදත්ත තෙරුන්වහන්සේ මේ ආත්මයේ පමණක් නොවෙයි, පෙර ආත්මයකත් මාගේදිවි තොර කිරීමට කටයුතු කළා. එහෙත් මාගේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් ජීවිතය රැක ගත්තා යැයි දේශනා කළා. රැස්ව සිටි පිරිස කුතුහලයෙන් පිරී ගියා. අතීත කථාව දැනගන්න තෙක් ඔවුන්ගේ සිත ශාන්ත බවින් තොර වුණා. බුදුරජාණන් වහන්සේට නමස්කාර කර අතීත කථාව දේශනා කිරීමට ආරාධනා කළා.

"මහණෙනි, මම අතීතයේ එක් ආත්ම භාවයක කෙළෙඹි පුත්‍රයකුගේ පුතෙක් ලෙස උපන්නා. එකල රට පාලනය කළේ බ්‍රහ්මදත්ත රාජ පරපුරේ රජ කෙනෙක්.

මවගේ ඇකයෙන් බසිමින් මමත් වෙන දරුවන් වගේම ක්‍රමයෙන් වර්ධනය වෙන්න පටන් ගත්තා. මගේ ළමා කාලය උදා වුණා. සෙල්ලම් කිරීමට මම බොහොම ප්‍රිය කළා. ඒ නිසාම යහළුවන් සමඟ නිතර ක්‍රීඩා කිරීමට සෙල්ලම් පිට්ටනිවල සැරිසැරුවා.


දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**


දවසක් විශාල නුග ගසක් සමීපයේ යහළුවන් සමඟ සෙල්ලම් කරමින් සිටියා.

එදා එක් වෙදෙක් වෙද භාණ්ඩ සහ බෙහෙත් ආදිය පුරවාගත් විශාල මල්ලකුත් කර තබාගෙන එතැනට පැමිණ අපත් සමඟ කථා කරමින් විහිළු කරමින් පැය ගණනක් වාසය කළා.

ඔහු එක් වරම අපට සෙල්ලම් කිරීමට, හුරතල් කිරීමට පුංචි සැලළිහිණි පැටියෙක් දෙන්නදැයි ඇසුවා. මමත්, මගේ යහළුවනුත් එයට කැමැති වුණා. ඔහු විශාල නුග ගසේ බෙනයක් පෙන්වා කිව්වා මම මේ දැන් දැක්කා පුංචි සැළලිහිණි පැටියෙක්. සමහර විට උගේ අම්මා නැතිව ඇති බෙනයෙන් එළියට ඔළුව දාගෙන ඉදලා දැන් ආපසු ඇතුළට වැටුණා. ගිහින් කවුරුහරි ඌට පිහිට වෙන්න යැයි ප්‍රකාශ කළා.

මමත් පුංචි සතාට පිහිටවීමේ අදහසින් විශාල නුග ගහට අමාරුවෙන් නැග ගත්තා. බෙනය ඉතා සියුම් එකක්. අමාරුවෙන් අත එයට දමා සතාව අල්ලා ගත්තා. උගේ හිසම අල්ලා ගැනීමට මට පුලුවන් වුණා. ඌ අල්ලන කොටම මම දැන ගත්තා ඒ විෂ සහිත නාගයෙක් බව.

දැන් ඉතින් මට කරන්න දෙයක් තිබුණේ නෑ. අතහැරලා බෑ. ඌ මට දෂ්ට කරනවා ඒ නිසා මම වහාම ඌ එළියට අරගෙන විසි කළා. ඒ වේගයෙන්ම සර්පයා විසි වී ගොස් වෙදාගේ කර මතට වැටුණා. බෙල්ලේ එතෙන්න පටන් ගත්තා. ඉවත් කරන්න උත්සාහ ගත්තත් වෙදාට එය කර ගන්න බැරි වුණා. සර්පයා දිගින් දිගටම ඔහුට දෂ්ට කළා. තමා බේරා ගැනීමට ළමයින්ට කෑගැහුවා.

ඒත් අපි වෙදකම ගැන දැනගෙන හිටියේ නෑ. වැඩිහිටියන් කවුරුත් හිටියෙත් නෑ. වෙදා නාග විෂෙන්ම මරණයට පත් වුණා. මොහු මෙහෙම අපරාදයක් අපට කරලා තිබුණේ කුඩා දරුවකුට සර්පයා ලවා දෂ්ට කරවාගෙන ඒ විෂ ඉවත් කර විශාල ලාභයක් ලැබීමේ අපේක්ෂාවෙන්.

එහෙත් අවසානයට සිදු වුණේ අන් අයට යෙදූ දැලේම තමන්ට පැටලීමට සිදු වීමයි. අනුන්ට කැපූ වළේම තමන්ට වැටීමට සිදුවීමයි.

බලන්න මහණෙනි, කපටි සිතිවිලිවලින් කටයුතු කිරීමට ගොස් සිදු වූ විපත. මහණෙනි, එබැවින් නිතර අන් අය ගැන සිතන්න. කපටි හෝ ව්‍යාජ හෝ වංචනික සිතිවිලිවලින් තොරව කටයුතු කරන්න. එවිට මෙලොවත් පරලොවත් සැප සේ ජීවත්වීමට හැකි වෙනවා යැයි පවසමින් බුදුරජාණන් වහන්සේ ජාතක කථාවේ පූර්වාපර සන්ධි ගළපා දේශනාව අවසන් කළා.

එකල වෙදා ලෙස උපන්නේ දෙව්දත් තෙරුන්වහන්සේ බවත්, සර්පයා ගැනීමට නුග ගසට නැගි කොලුවා සම්මා සම්බුදු වූ තමන්වහන්සේ ම බවත් ප්‍රකාශ කළා.

බුදුසරණ

# වල්ලිපුරම් රන්පත හෙවත් යාපා පටුනේ සිංහල උරුමය

වල්ලිපුරම් නමැති ස්ථානය යාපන දිස්ත්‍රික්කයේ උතුරු කෙළවරේ වඩමාරච්චි ප්‍රදේශයේ පිහිටියේ ය. වල්ලිපුරම් ගමේ විෂ්ණු කෝවිලට අයත් භූමි භාගයේ කණින අවස්ථාවේ දී රන්පතක් හමුවී ඇත. මෙය ක්‍රි.ව. 1936 දී හමු වූවකි. අත්තිවාරමක් යට තිබී හමු වූ මෙම රන්පත දිගින් අඟල් 3 ක්ද පළල අඟලක් ද පමණ විය.

වල්ලිපුරම් රන්පත ලියා ඇත්තේ බ්‍රාහ්මී අක්ෂරවලිනි. මෙම අක්ෂරවල ස්වරූපය අනුව එම අක්ෂර ක්‍රි.ව. දෙවැනි සියවසට අයත් වන බව ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා ප්‍රකාශ කර ඇත. බ්‍රාහ්මී අක්ෂරවලින් අප රටේ ආදිතම සෙල්ලිපි හා ලෙන් ලිපි ලියා ඇත. මෙම බ්‍රාහ්මී යන වචනය ව්‍යවහාර කොට ඇත්තේ ඒ ලිපිවල ඇති අකුරුවලට මිස භාෂාවට නොවේ. ඒ ලිපිවල භාෂාව ආදිම සිංහල හෝ මුල සිංහලයයි. සමහර උගත්හු මෙයට සිංහල ප්‍රාකෘත යැයි ද කියති.

## වල්ලිපුරම් රන්පත හා එහි වැදගත්කම

වල්ලිපුරම් රන්පතෙහි සඳහන් වී ඇත්තේ අකුරු 49 කි. පේළි හතරකින් ලියැවී ඇති මෙය සම්පූර්ණයෙන් මෙසේ ය.

"සිධ මහරජ වහයහ රජෙහි අමෙතෙ
ඉසිගිරයෙ නකදිව බුජමෙනි
බදකර අතනෙහි පියගුක තිස
විහර කරිතෙ (8)

මහාචාර්ය පරණවිතාන මහතා විසින් ප්‍රසිද්ධ කරන ලද එපිග්‍රැපියා සසිලනිකා ග්‍රන්ථයෙහි හතරවැනි කාණ්ඩයේ දී ඇති අරුත් දෙකක් මෙසේ ය. "වසභ රජුගේ රාජ්‍ය සමයෙහි ඉසිගිරය ඇමතිවරයා නකදිව පාලනය කරද්දී බදකර අතනෙහි පියංගුක තිස්ස විහාරය කරවන ලදී."


මෙයින් කියැවෙන අනෙක් අරුත මෙසේ ය.

"වසභ රජුගේ රාජ්‍ය සමයෙහි ඉසිගිරිය අමාත්‍යවරයා නකදිව පාලනය කරන කල්හි බදකර අතනෙහි පියංගුක තිස්ස විසින් විහාරයක් කරවන ලදී. (9)

වසභ රජතුමා (ක්‍රි.ව. 65 - 109) ගේ නම මෙහි සඳහන් වන්නේ වහය යන නාමයෙනි. වසභ රජුගේ ප්‍රදේශාධියෙකු වශයෙන් සැලකිය හැකි ඉසිගිරිය නැමැති මේ අමාත්‍යවරයා බදකර අතන නම් ස්ථානයෙහි මෙම විහාරය කරවා ඇති බව මෙයින් පැහැදිලි වෙයි. මෙම බදකර අතන යන්න පිළිබඳව ද මහාචාර්ය පරණවිතාන මහතා පැහැදිලි කර ඇත.

බදකර අතන යන නම වල්ලිපුරම් ගම සඳහා ව්‍යවහාර කරන ලද පැරණි නාමය විය හැකිය.

ක්‍රි.ව. දෙවන සියවස තරම් ඈත කාලයකට සම්බන්ධ වූ විහාරයක් මේ ස්ථානයෙහි තිබූ බවට මෙම රන්පත සාක්ෂියක් වන්නේ ය.



පියගුක තිස යන්න ද විහාරයෙහි නම වූයේ නම් පියගුක යන්නට පියගු දිවයින යනුවෙන් අර්ථ දිය හැකි වේ. එසේ වන විට විහාරයේ නම 'තිස් වේ. මේ විහාරය කර වූ පුද්ගලයාගේ නාමය තිස වහයෙන් සලකා පියගු දිවයිනෙහි තිස්ස යනුවෙන් ද අර්ථ සැපයිය හැකි ය.

'පියඟු දීප' යන්න මහාවංසයෙහි සඳහන් වන්නේ තිස්ස නම් මහතෙර කෙනෙකුත් වාසය කළ ස්ථානය ලෙස ය. දුටුගැමුණු රාජ්‍ය යුගයේ දී මෙම රහතන් වහන්සේ පියඟු දිවයිනෙහි සිට අහසින් වැඩියය බව එහි කියැවේ.

සීහලවත්තු නැමැති පාලි ග්‍රන්ථයෙහි ද පියඟු දිවයිනෙහි විසූ සංඝයා වහන්සේලා ගැන සඳහන් වී ඇත්තේ සද්ධාතිස්ස රජු හා සම්බන්ධ වී ඇති කතා පුවතක් විස්තර කිරීමේ දී ය. ඒ අනුව සද්ධාතිස්ස රජු වෙස්වලා ගෙන ගොස් කුඹුරක වැඩ කොට ලද චේතනයෙන් භික්ෂූන් වහන්සේ නමකට දන් දීමට කැමති විය. රජ බිසව එම මුදල් අනුව සූදනම් කර දනය දීම පිණිස රජ වාසලෙහි වූ දසියක භික්ෂුවක් සෙවීමට ආරාමයට යැවීය. ඇය එසේ යන විට පුවඟු දිවයිනෙහි තිස්ස තෙරුන්, මහ තෙරුන් විසින් එවන ලද භික්ෂූන් වහන්සේ නමකට එම දනය පිළිගැන්විය හැකි වූ බව එහි සඳහන් ය. මහාවංසටීකාව වූ වංසත්ථප්පකාසිනියෙහි ද පුවඟු දීපවාසී මලියමහාදේවතෙරුන් ඇතුළු භික්ෂූන් වහන්සේලා අට නමක් ගැන සඳහන් වේ.

වසභ කුමරා රාජ්‍ය පදප්‍රාප්ත වූයේ අභ්‍යන්තර දේශපාලන අර්බුද පැවති අවධියක දී බව මහාවංසයේ විස්තරවලින් පැහැලි වෙයි. (18) ඔහු සිංහල රාජ වංශයේ අලුත් පරපුරක මූලිකයා වශයෙන් ද ඉතිහාසඥයින් විසින් හඳුන්වා දී ඇත. ආර්ථික සංවර්ධනයෙහිලා ඔහු සුවිශාල මෙහෙයක් කර ඇති බව වංසකතා අනුව ද පැහැදිලි වෙයි. වසභ රජතුමා වැව් එකොළ සක් හා ඇල මාර්ග දොළොසක් කළ බව පූජාවලියෙහි සඳහන් වන අතර ඒ සියල්ලම නම් කර ඇත. එහි සඳහන් වන නම්වලින් පමණක් රාජාවලි දොළොසක් පමණි.

## උතුරේ අයිතිය හා රන්පත

වසභ රජුගේ රාජ්‍ය සමයෙහි (ක්‍රි.ව. 65 - 109) උතුරේ පාලනය තමා යටතේ වූ ප්‍රාදේශීය පාලකයකු යටතේ පවත්වාගෙන යාමට තරම් රජරට රාජධානිය ප්‍රබල වූයේ ය. වල්ලිපුරම් රන්පතෙහි සඳහන් වන 'නකදිව් යන පදය මෙහි දී ඉතා වැදගත් වනු ඇත. 'නකදිව් යන්න එදා එනම් මීට වසර 1820 කට ඉහත දී භාවිත වී ඇත්තේ 'නාගදීප' යන අර්ථය ඇතිව සමස්ත යාපනය අර්ධද්වීපය සඳහා ම බව පැහැදිලි කරුණකි.

මේ නිසා නාගදීප වශයෙන් අද ව්‍යවහාර කරන දූපතට පමණක් සීමාවන නාමයක් නොවන බව සඳහන් කළ යුතුව ඇත.

මහාවංසයේ මුල්වරට නාගදීපය සඳහන් වන්නේ බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩමවීම පිළිබඳ කතා ප්‍රවෘත්තියෙනි.

ක්‍රි.ව. දෙවැනි සියවසේ දී ටොලමිගේ සිතියමෙහි සඳහන් වන 'නගදිබි' යන්න සිංහල නකදිව හෙවත් නාගදීප යන්න බව ද, එය වත්මන් යාපන අර්ධද්වීපය හැඳින්වීම පිණිස හැඳින්වෙන බවත් විද්වතුන් ගේ පිළිගැනීමයි. යාපනේ ප්‍රදේශය ජනාවාස වී ඇත්තේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ය.

යාපනේ 'යා' යනු ආර්ය පාද යන තේරුම දෙන ඈපා යන්නට සමාන වන හෙයින් එය යුව රජුගේ පාලනය යටතේ පැවැති ප්‍රදේශයක් වශයෙන් නිගමනය කළ හැකි ය. 'යා' යන්න ජීවක යන්නෙන් බිඳුණී යන්න මහාචාර්ය පරණවිතාන පවසන තවත් අදහසකි.

ශ්‍රී ලංකාවේ නාගදීපය නම් ප්‍රදේශය පාලනය කළ 'දීපරාජ' නැමැත්තෙකු පිළිබඳව විභංග අටුවාව වන සම්මෝහවිනෝදනියේ සඳහන් ය. ක්‍රිස්තු පූර්ව යුගයන්හි දී සහ ක්‍රිස්තු වර්ෂාරම්භයේ දී සියවස් කිහිපයක් යන තුරුම යාපන අර්ධද්වීපය හැඳින්වූයේ නාගදීපය යන නමින් හෙයින් අටුවාවේ සහ ශිලා ලිපියේ (දෙවන සියවසට අයත් සඳහන් 'දීපරාජ' යන දෙදෙනාම යාපනය අර්ධද්වීපය කැර වූ යුව රජුන් බව ස්ථිර වශයෙන් ම නිගමනය කළ හැකි ය.

## වල්ලිපුරම් බුදුපිළිම වහන්සේ

වල්ලිපුරම්හි පිහිටි විෂ්ණු දේවාලයට යාර පනහක් පමණ ඊසාන දෙසින් බුදු පිළිමයක් හමු වූයේ වල්ලිපුරම් රන්පත හමුවීමට ප්‍රථයෙනි. එනම් 1900 වර්ෂයේ දී ය. මෙම බුදු පිළිම වහන්සේ අඩි 8 පමණ උස ය. වම් අත මැණික් කටුව ළඟින් කැඩී ඇත. මෙය ක්‍රි.ව. 2 හො 3 වැනි සියවසට අයත් බුදු පිළිමයක් සේ සැලකේ.

මෙම බුදු පිළිම වහන්සේ වල්ලිපුරම් ප්‍රදේශයෙන් සොයා ගැනීම පිළිබඳ 1916 දී ජේ.පී. ලුවිස් මහතා පවසන අන්දමට මෙය පැරණි සිංහල ජනාවාසයක් ව පැවතුණු බවට සාධකයක් ලෙසට සැලකේ.

වල්ලිපුරම් බුදු පිළිම වහන්සේ අනුරාධපුරයේ රුවන්වැලිසෑයෙන් හමු වූ බුදු පිළිම වහන්සේට බෙහෙවින් සමාන ය. මේවා අමරාවතී බුදු පිළිම සම්ප්‍රදයට අයත් සේ සැලකේ.

වල්ලිපුරම් බුදු පිළිම වහන්සේ මෙසේ යාපනේ උද්‍යානයෙහි බෝධියක් සෙවණේ තබා තිබුණු අතර 1916 දී එවකට ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ හෙන්රි බ්ලෙක් විසින් සියමෙහි එවකට රජ කළ 4 වැනි රාම රජුට ප්‍රදනය කරන ලදී. මෙම බුදු පිළිම වහන්සේ නිල්වන් කොළ පැහැය සහිත දිලිසෙන කිරිගරුඬ පාෂාණ වර්ගයකින් නිම කර ඇත.

වව්නියාව ප්‍රදේශයෙනුත් මෙවැනි බුදු පිළිම වහන්සේ හමු වී ඇත. දක්ෂිණ භාරතයේ ආන්ද්‍රා ප්‍රදේශ්හි අමරාවතී නම් ස්ථානයේ ඇති බුදු පිළිම වහන්සේට සමාන පිළිම වහන්සේ තිස්සමහාරාමයේ යටාල වෙහෙරෙන් ද හමු වී ඇත.

මහ ඉලුප්පල්ලමේ බුදුපිළිම වහන්සේ මේ සම්ප්‍රදයට අයත් ය. මෙම වල්ලිපුරම් බුදු පිළිම වහන්සේ දැනට තායිලන්තයේ (සියමෙහි) බැංකොක්හි ගරුඬ පාෂාණ විහාරයෙහි තැම්පත් කර ඇත.

මෑතක් වන තුරුම වල්ලිපුරම් රන්පත ලන්ඩනයේ බැංකුවක තැම්පත් කර තිබුණු අතර මහාචාර්ය වල්පොල රාහුල හිමිපාණෝ 1991 පෙබරවාරි මස 3 වැනි ද එම රන්පත එවක වූ ජනාධිපතිතුමාව වූ රණසිංහ ප්‍රේමදස මහතාට භාර දෙමින් ජාතිය සතු කළහ.

මෙම රන්පත දැනට ආරක්ෂා සහිතව තැම්පත් කර ඇති අතර, එහි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අගය වෙන කවරදටත් වඩා අනාගතයේ දී වැඩි වනු ඇත.

හිටපු සහකාර
පුරාවිද්‍යා අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග**
පුරාවිද්‍යා Msc පර්යේෂණ

වර්ෂ 2021 ක් වූ අගෝස්තු 08 ඉරිදු කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.